
INSURANCE BOARD OF SRI LANKA

වාර්ෂික වාර්තාව 2012

# විශිෂ්ඨත්වයේ

## මාවත ඔස්සේ



# පටුන

වර්ෂය තුල වැදගත් සිදුවීම් 6 | සභාපතිනියගේ පණිවුඩය 8 | අධ්‍යක්ෂ ජනරාල්ගේ සමාලෝචනය 10 |
මණ්ඩලයේ සාමාජිකයන් 14 |මණ්ඩල සාමාජිකයන් පිළිබඳව 15 | ජ්‍යේෂ්ඨ කළමනාකරණ කණ්ඩායම 17 |
කාර්ය මණ්ඩලය18 | පොදු සමාලෝචනය 22 | සංඛ්‍යානමය සමාලෝචනය 27 | මෙහෙයුම් කටයුතු සමාලෝචනය 54 |
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය 70 |විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 71 | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 72 |
රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 73 | ගිණුම්කරණ ප්‍රතිපත්ති 74 |
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 76 | විගණකාධිපති වාර්තාව 82 |
විගණකාධිපති විසින් මතු කළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම 85 |
පරිශිෂ්ඨය I 89 | පරිශිෂ්ඨය II 90 | පාරිභාෂික ශබ්ද මාලාව 92 |



# විශිෂ්ඨත්වයේ

## මාවත ඔස්සේ

දකුණු ආසියාවේ ප්‍රමුඛතම රක්ෂණ නියාමන ආයතනය වීම අරමුණු කොට ගෙන යන ගමනේදී, අප ආයතනය වසරින් වසර ඉදිරියට පිය නගනු පසුගිය වසර කීපය තුල අපි දුටුවෙමු.
මෙම අඛණ්ඩ වර්ධනයේදී රක්ෂණ ඔප්පුහිමියන්ගේ හා අනාගත ඔප්පුහිමියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම මුඛ්‍ය කොටගත් අපගේ ප්‍රධාන අරමුණු කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීමට අපට හැකිවිය.
විචක්ෂණශීලි අධීක්ෂණය මගින් රක්ෂණ වෙළඳපලෙහි ස්ථාවරත්වය, ආරක්ෂාව, සාධාරණබව හා කාර්යක්ෂමතාවය නොවෙනස්ව පවත්වාගෙන යෑමට අපි නොසැලී නැගි සිටිමු.
මෙයට සමගාමීව රක්ෂණ කර්මාන්තයෙහි සංවර්ධනය උදෙසා අදාල රෙගුලාසි ක්‍රියාත්මක කිරීමෙන් අපි පහසුකම් සපයමු.
තවද, මහජන විශ්වාසය ප්‍රවර්ධනය කෙරෙන සහ සියළු ජන කොටස්ද, භූගෝලීය වශයෙන් දිවයිනේ සියළු පළාත්ද ආවරණය කළහැකි වන සේ රක්ෂණ කර්මාන්තයට අවස්ථා සලසා දිය හැකි පරිසරයක් ගොඩ නැගීමට අපි නිරන්තරයෙන් දායක වන්නෙමු.

# දැක්ම

දකුණු ආසියාවේ රක්ෂණ නියාමන
ක්ෂේත්‍රයේ මිනුම් ලකුණු බවට පත්වීම

# මෙහෙවර

රක්ෂණ කර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා
පහසුකම් සැලසීම, අධීක්ෂණය සහ
විචක්ෂණ නියාමනය තුළින් රක්ෂණ
සහතික දරන්නන් ආරක්ෂා කිරීම.



# වර්ෂය තුළ වැදගත් සිදුවීම්

- රක්ෂණ සමාගම් 22
- රක්ෂණ තැරැව්කාරකාර සමාගම් 54
- රක්ෂණ නියෝජිතයින් 36,801
- අවදානම් පාදක ප්‍රාග්ධනය සඳහා මාර්ග පරීක්ෂාව ආරම්භය
- රක්ෂකයන් විසින් ගෙවනු ලබන ලියාපදිංචි ගාස්තුව හා වාර්ෂික ගාස්තු වැඩි කිරීම
- ණය ගෙවීමේ හැකියාවේ සීමාවේ නීතිය (සාමාන්‍ය සහ දිගුකාලීන රක්ෂණ තවදුරටත් වෙනස් කිරීම)
- ග්‍රාම නිලධාරි වසම් 400ක් වෙත රක්ෂණය දැනුවත් කිරීම් ලඟා කර දීම

## රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය

| | 2012 | 2011 | වෙනස % |
|---|---|---|---|
| දළ ලිඛිත වාරිකය (රුපියල් මිලියන) | 87.15 | 78.49 | 11.0 |
| මුළු වත්කම් (රුපියල් බිලියන) | 301.92 | 261.41 | 15.5 |
| රක්ෂණය සඳහා ග්‍රහණය වීම | 1.15 | 1.20 | (4.2) |
| රක්ෂණ ඝණත්වය (රුපියල්) | 4,287.28 | 3,761.11 | 14.0 |

## මණ්ඩලයේ කාර්ය සාධනය

| | 2012 | 2011 | වෙනස % |
|---|---|---|---|
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල (රුපියල් බිලියන) | 1.62 | 1.28 | 26.6 |
| සෙස් ආදායම (රුපියල් මිලියන) | 236.53 | 216.84 | 9.1 |
| වාර්ෂික ගාස්තු (රුපියල් මිලියන) | 61.04 | 34.58 | 76.5 |



රුපියල් බිලියන 301.92

**රක්ෂණ කර්මාන්තය සතු මුළු වත්කම් ප්‍රමාණය**

රුපියල් බිලියන 87.15

**රක්ෂණ කර්මාන්තයේ දළ ලිඛිත වාරිකය**

# සභාපතිනියගේ පණිවුඩය



රක්ෂණ කර්මාන්තයේ නියාමන ආයතනය වන ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය (මණ්ඩලය) විසින් 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන වාර්ෂික වාර්තාව වෙනුවෙන් මෙම පණිවුඩය නිකුත් කරනුයේ මහත් සතුටිනි.

රක්ෂණ අධීක්ෂකවරුන්ගේ ජාත්‍යන්තර සංවිධානය (IAIS) විසින් නිර්වචනය කර ඇති පරිදි රටක රක්ෂණ කර්මාන්තය සාධාරණව, සුරක්ෂිතව සහ ශක්තිමත් ලෙස පවත්වාගෙන යාම සඳහා නියාමන සහ අධීක්ෂණ ක්‍රමවේදයන් අවශ්‍යය වේ. එමෙන්ම රක්ෂණ ඔප්පු හිමිකරුවන්, ප්‍රතිලාභීන් සහ හිමිකරුවන්ගේ අයිතීන් සුරැකීමටත් රටක මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථාවරත්වය පවත්වා ගැනීමටත් නියාමන ක්‍රියාදාමය ඉතා වැදගත් වේ. මේ අනුව, තරඟකාරී වෙළඳපොළ තුළ රක්ෂණ කර්මාන්තය සාධාරණ සහ කාර්යක්ෂම ලෙස පවත්වා ගැනීමත් ඒ තුළින් සියළු පාර්ශවකරුවන්ගේ විශ්වාසය රඳවා ගැනීම සහතිකවීමත් මණ්ඩලයේ උපායශීලී පරමාර්ථ අතරින් ප්‍රධාන වේ.

## කාර්ය සාධනය

2012 වසර තුළ මණ්ඩලයේ ලියාපදිංචි වූ රක්ෂණ සමාගම් 21ක් මෙහෙයුම් කටයුතු සිදු කරන ලද අතර මෙයින් සමාගම් 3ක් දීර්ඝකාලීන (ජීවිත) රක්ෂණ ව්‍යාපාරයේ ද සමාගම් 6ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ද නිරත වන ලදී. ඉතිරි සමාගම් 12 ජීවිත සහ සාමාන්‍ය රක්ෂණය යන දෙකම ඇතුළත් සංයුක්ත රක්ෂණයෙහි නිරත විණි.

වර්ෂ 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධිත) පනත අනුව මෙම සංයුක්ත රක්ෂණ සමාගම් සියල්ල වර්ෂ 2015 ට පෙර ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වශයෙන් වෙන් කිරීමට අපේක්ෂිතය. මීට අමතරව රක්ෂණ කර්මාන්තයේ සැපයුම් ක්‍රියාවලිය තුළ රක්ෂණ තැරැව්කාර සමාගම් 54 ක් ක්‍රියාත්මක වන අතර ඒ ඒ සමාගම් නියෝජනය කරමින් රක්ෂණ ඒජන්තවරු දළ වශයෙන් 37,000 ක් පමණ ද ක්‍රියාත්මක වේ. රක්ෂණ තැරැව්කාර සමාගම් 54 න් 11 ක් 2012 දී අළුතින් ලියාපදිංචි විය. මීට අමතරව තැරැව්කරුවන් වශයෙන් මෙහෙයුම් කටයුතුවල යෙදීමට අවසර පතමින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් කිහිපයක ද අදාළ කටයුතු කෙරෙමින් පවතී.

ගත වූ වර්ෂය තුළ දී රක්ෂණයේ ව්‍යාප්තවීම හෙවත් ජනතාව ඒ සඳහා ග්‍රහණයවීමේ ප්‍රතිශතය 1.2% ක් වූව ද කර්මාන්තයේ සමස්ථ දළ ලිඛිත වාරික ආදායම (GWP) වර්ෂ 2011 ට වඩා 11.03% ක වර්ධනයක් වාර්තා කර ඇත. දිගුකාලීන හෙවත් ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙහි වර්ධන වේගය 2011 වසරේ දී තරමක පසුබෑමක් පෙන්වනු ලැබූවත් 2012 දී එහි නියත වටිනාකම්වල වර්ධනයක් පෙන්නුම් කරන ලදී. මණ්ඩලය සහ රක්ෂණ සමාගම් විසින් ක්‍රියාත්මක කරනු ලබන දැනුවත්භාවය වර්ධනය කිරීමේ වැඩසටහන්වල ප්‍රතිඵලයක් ලෙස ජනතාව තුළ රක්ෂණය පිළිබඳව ඇති දැනුම වැඩිවීම මෙයට හේතුවක් විය හැක.

> අවදානම් පාදක ප්‍රාග්ධන ආකෘතිය (RBC Model) ක්‍රියාත්මක කිරීම 2012 වසරේ දී මණ්ඩලය මුහුණ පෑ විශාලතම අභියෝගයයි.

සමස්ත රක්ෂණ ක්ෂේත්‍රයේ වටිනාකම ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රයේ මුළු වත්කම් ප්‍රමාණයෙන් 3% කි. මෙය ඉතා කුඩා ප්‍රතිශතයක් වුව ද, සමස්ථයක් වශයෙන් රක්ෂණ කර්මාන්තය වර්ධන ප්‍රවණතාවක් පෙන්වීම සතුටුදායක තත්ත්වයකි.

### අභියෝග

රක්ෂණ කර්මාන්තයට අදාළ නීතිමය ප්‍රතිපාදන හා ඇතැම් තීරණ ක්‍රියාත්මක කිරීමේ දී මණ්ඩලයට අභියෝග රැසකට මුහුණදීමට සිදුව ඇත. 2011 රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධිත) පනතින් හඳුන්වා දෙන ලද ප්‍රධාන සංශෝධන අතර සංයුක්ත රක්ෂණ සමාගම් වර්ෂ 2015 ට පෙර ජීවිත හා සාමාන්‍ය රක්ෂණ වශයෙන් ආයතන දෙකකට බෙදා වෙන් කිරීම ද එමෙන්ම වර්ෂ 2016 ට පෙර ඒ බෙදා වෙන් කළ සමාගම් ඇතුළු සියළුම රක්ෂණ සමාගම් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද කොටස් වෙළඳපොළක ලැයිස්තුගත කිරීම ද ඇතුළත් වේ.

ජීවිත හා සාමාන්‍ය රක්ෂණ වශයෙන් බෙදා වෙන් කිරීමත් එම සමාගම් ලැයිස්තුගත කිරීමත් වෙන් වෙන් වශයෙන් ගත් කළ කාර්යයන් දෙකකි. එහෙත්, සංයුක්ත රක්ෂණ සමාගම් ගත් කල්හි මෙම කරුණු දෙකම එකිනෙක හා බැඳී පවතී. මෙම කාර්යයන් දෙක සඳහා ප්‍රමාණවත් කාල සීමාවක් සියළුම සමාගම්වලට ලබා දී ඇත. එනම්, සමාගම් කොටස් දෙකකට බෙදා වෙන් කිරීමට අවුරුදු 4 ක කාලයකුත් ලැයිස්තුගත කිරීම සඳහා අවුරුදු 5 ක කාලයකුත් වශයෙනි.

දැනට ඇති සංයුක්ත සමාගම් 12 න් සමාගම් කිහිපයකට මෙම කාර්යයන් සරලව හා ඵලදායී ලෙසට නිම කිරීම අභියෝගයක් වී ඇත. සංයුක්ත සමාගම් ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ලෙස බෙදා වෙන් කිරීමේ ක්‍රියාවලියේ දී මතු විය හැකි ආදායම් බදු පිළිබඳ ගැටළු, වත්කම් හුවමාරුව හා වත්කම් තක්සේරු කිරීම ආදියේ දි ඇති වන ගැටළු හේතුකොට ගෙන එහි සංකීර්ණ බවක් ඇතිවීමට ඉඩ ඇත. එහෙත්, මේ සියළු කරුණු පිළිබඳව අදාළ සමාගම් සමඟ බොහෝදුරට සාකච්ඡා කොට මණ්ඩලය විසින් දැනටමත් ඒ සඳහා නිසි පියවර ගෙන ඇති අතර, අපගේ යෝජනාවන්ට නිසි අනුමැතිය ලැබුණු පසු ඉදිරි කටයුතු සිදුවනු ඇත.

කෙසේ වෙතත් නියාමන ආයතනයක් වශයෙන් මණ්ඩලය වඩාත් අවධානය හා සැලකිල්ල යොමු කරනුයේ සමාගම්වල ප්‍රාග්ධන ව්‍යුහයන්හි සහ ශේෂ පත්‍රයන්හි විනිවිදභාවය සහ එයින් රක්ෂණ ඔප්පු හිමිකරුවන්ට ඇති විය හැකි ඍජු බලපැමත් කෙරෙහිය.

මණ්ඩලය මුහුණ පෑ තවත් ගැටළුවක් වූයේ ආයතනික ඒජන්තවරුන් පත් කිරීමට අදාළ නියමයන් සම්පාදනය කිරීමේ දී ඒ සඳහා සියළුම පාර්ශවකරුවන්ගේ එකඟතාවය ලබා ගැනීමේ අසීරුතාවයයි. ඇත්ත වශයෙන්ම ඒජන්තවරුන් ලෙස කටයුතු කිරීමට ආයතනවලට අනුමැතිය දීමේ දී මණ්ඩලය සිදු කරනු ලැබුවේ කර්මාන්තයේ ඒ වන විටත් නීත්‍යානුකූල නොවන අයුරින් ක්‍රියාත්මක වූ එම කාර්යයන් විධිමත් කිරීමයි. දීර්ඝ විවාදයකින් පසු සියළු පාර්ශවයන්ගේ එකඟතාවයෙන් මෙම නියමයන් සකස් කිරීමට මණ්ඩලය සමත් වූ අතර මේ සඳහා නීති කෙටුම්පත් සම්පාදකගේ එකඟතාව ලැබීමෙන් පසු නොපමාව ගැසට් පත්‍රයෙහි පළ කිරීමට කටයුතු කෙරෙනු ඇත.

අවදානම් පාදක ප්‍රාග්ධන ආකෘතිය (RBC Model) ක්‍රියාත්මක කිරීම 2012 වසරේ දී මණ්ඩලය මුහුණ පෑ විශාලතම අභියෝග යයි. පූර්ව වර්ෂයේ දී සැලසුම් කළ පරිදි 2012 වසරේ දි මෙම ආකෘතිය අත්හදා බැලීම (Road Test) සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරන අතර එයින් හඳුනා ගනු ලබන තොරතුරු පාදක කොටගෙන අදාළ නීති කෙටුම්පත් ඉදිරියේ දී සකස් කරනු ඇත.

### ඉදිරි මඟ

මණ්ඩලය, මෙතෙක් ක්‍රියාත්මක කරන ලද නීති හෝ නියමයන් පාදක අධීක්ෂණ ක්‍රමය (Rules Based Supervision) වෙනුවට අවධානම් පාදක අධීක්ෂණ ක්‍රමය උපයෝගී කර ගැනීම ඉදිරියේ දී සිදු වනු ඇත. එවිට දේශීය රක්ෂණ කර්මාන්තයට ජාත්‍යන්තර යහපාලන ක්‍රමවේදයන් හා සමානුයෝගීව කටයුතු කිරීමට හැකි වනු ඇත. මෙම කාර්යය ඉටු කිරීමට මණ්ඩලයේ හැකියාවන් හා කුසලතාවයන් ශක්තිමත් කිරීමක් අවශ්‍ය වන අතර ඒ සඳහා ලෝක බැංකුව හරහා First Initiative ආයතනය විසින් මූල්‍යාධාර සපයනු ලබන ව්‍යාපෘතියක් දැනටමත් අනුමත වී ඇත.

තව ද, මණ්ඩලය විසින් දැනටත් දීපව්‍යාප්තව ක්‍රියාත්මක කරනු ලබන රක්ෂණය පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය වර්ධනය කිරීමේ වැඩසටහන් ඉදිරියේ දී තවත් පුළුල් ලෙස ක්‍රියාත්මක කරනු ඇත. මණ්ඩලය වෙත ලැබෙන අනේක විදි පැමිණිලිවලින් පැහැදිලි වනුයේ රක්ෂණ ඔප්පු හිමිකරුවන් පෙරට වඩා රක්ෂණය පිළිබඳ දැනුවත් වී ඇති බවත් තමන් මිලයට ගනු ලබන නිෂ්පාදනය හෙවත් රක්ෂණ ඔප්පුවෙහි ප්‍රධාන කොන්දේසි පිළිබඳ දැන් වැඩි අවධානයක් යොමු කරනු ලබන බවත්ය.

රක්ෂණ කටයුතු පිළිබඳ පමණක් නොව මණ්ඩලයේ ''නියාමන කාර්යභාරය'' පිළිබඳව මහජනයා දැනුවත් කිරීමේ අවශ්‍යතාවක් ඇති බව අප විසින් හඳුනා ගෙන ඇත. කොතෙක් විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය මඟින් ද, ජාතික මට්ටමේ ප්‍රදර්ශනයන් හරහා ද විවිධ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වුව ද ''රක්ෂණ මණ්ඩලය'' සහ එහි කාර්යභාරය පිළිබඳව ඇතැම් අය තුළ තවමත් අනවබෝධයක් පවතී. මේ තත්ත්වය යටතේ ඉදිරි කාලය තුළ රක්ෂණ කර්මාන්තයේ නියාමන ආයතනයට ආවේනික වූ අනන්‍යතාවයක් ලබාදීමට මණ්ඩලය විසින් අවශ්‍ය පියවර ගනු ඇත.

මූල්‍ය ක්ෂේත්‍රයේ අනෙකුත් අංගයන් හා සමානව රක්ෂණ කර්මාන්තය ද ගෝලීය ප්‍රවණතා හා පුළුල් පරාසයන් තුළ සිදුවන සමාජ-ආර්ථික බලපැම් අනුව වෙනස්වීම්වලට ලක් වේ. මෙම ප්‍රවර්ධනයන්ට ප්‍රතිචාර වශයෙන් නියාමන ක්‍රියාවලිය ද අඛණ්ඩව වැඩි දියුණු විය යුතුය. දැනට ඇති නීති ප්‍රතිපාදන යටතේ ආවරණය නොවන යම් යම් කරුණු පිළිබඳව දැනටමත් අධ්‍යයනයක් සිදු කෙරෙමින් පවතින අතර ඒ අනුව, අවශ්‍ය වන්නේ නම් රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතට තවදුරටත් සංශෝධන යෝජනා කිරීමට අප පසුබට නොවෙමු.


### නිමාව

නිසැකවම ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය වඩාත් පුළුල් ලෙස වර්ධනයවීමට ඇති විභවය අති මහත්ය. රක්ෂණ වෙළඳපොළෙහි තිරසාර වර්ධනයක් සිදු වුව ද රක්ෂණයේ ව්‍යාප්තිය ඉතා අඩු මට්ටමක පවතී. මෙයින් අදහස් වන්නේ එය තවදුරටත් ව්‍යාප්තවීමට විශාල ඉඩකඩක් ඇති බවය. එම නිසා, සියළු සමාගම් විසින් මෙම අවස්ථාව උපරිම ලෙස ග්‍රහණය කර ගැනීම කර්මාන්තයේ යහපතට හේතු වනු ඇත.

අවසාන වශයෙන් මණ්ඩලයේ සියළු කාර්යයන් සඳහා නිසි මඟ පෙන්වූ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්තුමාට ද, වටිනා දායකත්වයක් ලබා දෙන මණ්ඩල සාමාජිකයන්ට ද මාගේ කෘතවේදීත්වය පුද කර සිටින්නෙමි.

එමෙන්ම, මණ්ඩලයේ කටයුතුවලට නිරතුරුව සහයෝගය දක්වන රක්ෂණ කර්මාන්තයේ පාර්ශවකරුවන්ට ස්තූති කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.

තව ද, වසර පුරාම මණ්ඩලය විසින් ඉටු කරන ලද සියළු කටයුතු සාර්ථක කර ගැනීමට මහත් වූ කැපවීමකින් කටයුතු කරන අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂවරුන් ඇතුළු කාර්යය මණ්ඩලයේ සියළුම දෙනාට මාගේ කෘතඥතාව පිරිනමමි.



**ඉන්ද්‍රාණි සුගතදාස**
සභාපතිනිය

2013 අගෝස්තු 7

# අධ්‍යක්ෂ ජනරාල්ගේ සමාලෝචනය



විශිෂ්ඨත්වය කරා පියනගන ගමන්මගෙහි සමස්ථයක් ලෙස පෙර වර්ෂවලදී සාක්ෂාත් කරගත් ජයග්‍රහණයන් පෙරදැරි කරගෙන ඉහල තලයකට ලඟා වීමට සමාලෝචිත වසරේදී අපට හැකියාව ලැබිනි.

දකුණු ආසියාවේ රක්ෂණ නියාමනයේ මිනුම් ලකුණ බවට පත්වීමට යන මාර්ගයේ බලාපොරොත්තු වූ අරමුණ ඉෂ්ඨ කරගැනීම සඳහා වේගවත් ක්‍රියාවලියකට මුල පිරීමට 2012 වර්ෂය ප්‍රධාන විය.

දැනට පවතින මෙහෙයුම් රාමුව තව දුරටත් වැඩි දියුණු කිරීම මෙම මූලික පදනම් සංකල්පය අභිබවා ගිය වඩාත් ගැඹුරු තාත්වික කාර්යයක් වෙනුවෙන් කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින්ගෙන් සමන්විත අභ්‍යන්තරව එකිනෙකා එකතු වී වැඩ කරන පරිසරය හැඩගස්වා ගැනීමට මූලික වශයෙන් පෞද්ගලිකව ඔහු හෝ ඇය විසින් කටයුතු කරනු ලැබීය.

ආයතනය සඳහා නව දැක්මක් සහ මෙහෙවරක් ඇතිව මණ්ඩලය සඳහා උපක්‍රමික පිරමීඩයක් සකස් කිරීමේ කාර්යය අප විසින් සාර්ථකව ඉටු කර ඇත. මෙම උපකමික පිරමීඩය මණ්ඩලයේ ආසන්නතම අරමුණු වැඩි දියුණු කිරීමේදී දක්වන මූලාරම්භය මෙන්ම මධ්‍යකාලීන සහ දීර්ඝකාලීන අරමුණු අවබෝධ කරගැනීමේ මූලාරම්භය දියත් කිරීම කේන්ද්‍ර කොටගත් එකකි. තවදුරටත්, මෙම උපක්‍රමික පිරමීඩය ප්‍රධාන ප්‍රතිඵල ආශ්‍රිත ක්ෂේත්‍රයන්හි (KRAs) ඒ ඒ දැක්මේ පූර්ණ ක්‍රියාමාර්ගය, ක්‍රියාකාරී අරමුණු සහ මණ්ඩලයේ මෙහෙවර අපගේ නිර්හීත නව දැක්ම සාක්ෂාත් කරගැනීමට හැකිවන අයුරින් ඉලක්ක කොට ගෙන සකස් කරන ලද්දකි.

මානව සම්පත සාර්ථක සංවිධානයක පදනම වන අතර, ජයග්‍රාහී පසුබිමක් සහ මණ්ඩලයේ පොදු අරමුණක් සපුරා ගැනීම සඳහා ඒකීයත්වයෙන් සහ වගකීම් පෙරදැරි කරගත් හැඟීම් නැවත වරක් ස්ථිර ලෙස ප්‍රකාශ කර ඇත. තවද, සමාලෝචිත වර්ෂය තුළ දේශීය සහ ජාත්‍යන්තර පුහුණු කිරීම් මගින් කාර්ය මණ්ඩලයේ හැකියාවන් වැඩි දියුණු කිරීමට වැඩිදුර පියවර ගෙන ඇති අතර, අපගේ මූලික අරමුණ වන දක්ෂ සහ උනන්දුවක් දක්වන සේවකයින් බිහි කිරීමේ කාර්යය ශක්තිමත් කිරීමෙහිලා ඔවුන් ජයග්‍රාහී පසුබිමක් කරා ප්‍රතිඵලදායක සහ කාර්යක්ෂම ලෙස වැඩ කිරීමට හැකි වන ලෙස ශක්තිමත් කර ඇත.

ඵලදායිතාවය වැඩි කිරීම වෙනුවෙන් ආංශික ක්‍රියාකාරි සැලැස්මේ පුවරුව (Divisional Dashboards) වැනි ඵලදායි වැඩ කිරීමේ කළමණාකරන ක්‍රියාවලියක් සඳහා නව තොරතුරු හා තාක්ෂණික මෙවලම් පද්ධතියක් ස්ථාපිත කිරීමේ කාර්යය මේ වන විට දියත් කර ඇත. මණ්ඩලයේ පරිපාලනය වෙනුවෙන් නව සංශෝධිත කාර්ය පරිපාටියක් දැක්වෙන අත්පොතක් හඳුන්වා දීම, රක්ෂණ සමාගම්වල/අතරමැදියන්ගේ ක්ෂේත්‍රගත

> මානව සම්පත සාර්ථක සංවිධානයක පදනම වන අතර, ජයග්‍රාහී පසුබිමක් සහ මණ්ඩලයේ පොදු අරමුණක් සපුරා ගැනීම සඳහා ඒකීයත්වයෙන් හා වගකීම් පෙරදැරි කරගත් හැඟීම් නැවත වරක් ස්ථිර ලෙස ප්‍රකාශ කර ඇත.

අධීක්ෂණ සදහා අත්පොතක් හඳුන්වා දීම සහ පැමිණිලි විසඳීමේ ක්‍රමවේදය දැක්වෙන අත්පොතක් හඳුන්වා දීම යන සියළුම කාර්යයන් මේ වන විට කෙරෙමින් පවතී. මෙම කාර්යයන් 2013 වර්ෂය අවසන්වීමට පෙර සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වන අතර, එමගින් මණ්ඩලයේ කාර්ය සාධනය සහ කාර්යක්ෂමතාවය තවදුරටත් වැඩිකර ගැනීමට හැකිවනු ඇත.

## සාධාරණ, ආරක්ෂාකාරී සහ ස්ථායි වාතාවරණයක්

මහජනතාව අප කෙරෙහි තබන විශ්වාසය සහ රක්ෂණ කර්මාන්තයේ වර්ධනය කෙරෙහි බලපාන වාතාවරණයක් සහතික කිරීම මණ්ඩලයේ මුඛ්‍ය කර්තව්‍යය වේ. ලැබී ඇති ප්‍රතිචාර අනුව මණ්ඩලය සහ රක්ෂණය සම්බන්ධව මහජනතාවගේ දැනුවත්භාවය මඳ බව පෙනී ගොස් ඇත. 2011 වර්ෂය තුළදී, මණ්ඩලය විසින් ලැබුණු පැමිණිලි වර්ග විශ්ලේෂණය කරනු ලැබූ අතර, ඒවා ප්‍රධාන ක්ෂේත්‍ර 3 කට ප්‍රමුඛත්වය දී බෙදා වෙන් කරන ලදී. එනම් : යෝජනා ආකෘතියක ඉතා වැදගත් විශේෂාංග විස්තර කිරීම, යෝජනා ආකෘතියක් සම්පූර්ණ කරනු ලබන අවස්ථාවේදී සියළුම වැදගත් පරිසිද්ධීන් අනාවරණය කිරීමේ වැදගත්කම සහ රක්ෂණ ඔප්පුවක් මිළදී ගැනීමේදී දැනුවත් විය යුතු මූලධර්ම යන කරුණු ය. පැමිණිලි කවුරුන් වෙත යොමු කළ යුතුද යන්න පිළිබඳව මහජනතාව තුල ඇති අඩු දැනුවත්භාවය මීට සම්බන්ධ ගැටළුව විය.

ඒ අනුව, 2012 වර්ෂය තුළ මණ්ඩලය විසින් දියත් කරන ලද සමීපතාවය පදනම් කරගත් මහජන දැනුවත් කිරීමේ ව්‍යාපාරයෙහි ප්‍රධාන අරමුණ වූයේ ග්‍රාමීය ප්‍රජාවට අන්‍යෝන්‍ය ලෙස බලපාන කණ්ඩායම් මගින් මණ්ඩලයේ කාර්යභාරය සහ එහි ක්‍රියා කලාපය පිළිබදව මහජනතාවගේ දැනුවත්භාවය වැඩි කිරීමටත්, රක්ෂණ ක්‍රමයේ වැදගත්කම සහ එහි ඇති සියුම් වූ වෙනස්කම් පිළිබදව විස්තර කර දීමත්ය.

රක්ෂණ කර්මාන්තයේ වර්ධනයට අවශ්‍ය පහසුකම් සැලසීම සම්බන්ධව මහජනතාව සහ රක්ෂණ ඔප්පු හිමියන් තුළ තිබෙන විශ්වාසය වැඩි දියුණු කිරීම පිළිබඳ කරුණුවල වැදගත්කම හොඳින් හඳුනාගෙන ඇති අතර, සමාලෝචන වර්ෂය තුළ මණ්ඩලය විසින් විමර්ශනයට ලක් කරන ලද පැමිණිලි 274 න් 262 කට විසඳුම් ලබාදී ඇත.

රක්ෂණ ඔප්පු හිමියන් සහ අනාගත රක්ෂණ ඔප්පු හිමියන් තුළ ඇති උනන්දුව ආරක්ෂා කිරීම ප්‍රමුඛ කටයුත්තක් වන බැවින් ආර්ථිකයේ වර්ධනයට රුකුලක් වන රක්ෂණ කර්මාන්තයේ වර්ධනය උදෙසා අවශ්‍ය පහසුකම් සැපයීම මණ්ඩලයේ වගකීම වේ.

රක්ෂණ කර්මාන්තයේ වර්ධනයට අදාළ රෙගුලාසි පැනවීම මගින් එය ශක්තිමත් වන අතර, 2012 වර්ෂයේදී එවැනි නියාමන ප්‍රතිසංස්කරණ සිදු කරනු ලැබීය. එවැනි ප්‍රතිසංස්කරණවලට අදාල උදාහරණ නම්, පර්යන්ත නීති වෙනස් කිරීම තුලින් කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත සමාගම්වල වත්කම් මගින් සනාථ කරනු ලබන සුරැකුම්පත් සඳහා පිළිගැනීමක් ලබාදීම, ගෙවිය හැකි සීමාවන් තීරණය කිරීමේ කාර්යය සඳහා ආයොජන මට්ටම්වල පිළිගත හැකි වත්කම් අනුපාත නිර්ණය කිරීම, ආයතනික රක්ෂණ නියෝජිතයන් හඳුනා ගැනීම හා මුදල් අනුපාත නියෝජිතායතන පුළුල් කිරීම සඳහන් කල හැක. වර්ෂ 2012 දී හඳුන්වා දෙන ලද ප්‍රතිසංස්කරණ ශ්‍රී ලංකාව තුළ කඩා නොවැටෙන රක්ෂණ කර්මාන්තයක් පවත්වාගැනීම පිණිස යහපත්, ආරක්ෂාකාරී සහ ස්ථායි වටපිටාවක් ලබාදීමේ දැක්මකින් සිය කටයුතු මෙහෙයවීමේ නීතිමය කාර්ය රාමුව තවදුරටත් ශක්තිමත් කර ඇත.

මෙම කාර්යය වෙනුවෙන් මණ්ඩලය විසින් ගනු ලබන ප්‍රාරම්භක ක්‍රියාමාර්ගවලට රුකුලක් ලෙස ඉතා වැදගත් පුළුල් යෝජනා ක්‍රම ආවරණය කරමින් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සහ සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රම වැනි අළුත් යෝජනා ක්‍රම හඳුන්වා දීමට රක්ෂණ කර්මාන්තය සහතිකවී ඇති අතර, රක්ෂණ ඔප්පු ලේඛණ භාෂා තුනෙන්ම සකස් කිරීම, පාරිභෝගිකයන් සමඟ වඩාත් මිත්‍රත්වයෙන් කටයුතු කිරීම වැනි පියවර ගැනීමටද බලාපොරොත්තු වේ.

අවදාම මත පදනම් වූ අධීක්ෂණ ක්‍රමයක් (Risk Based Supervision - RBS) සඳහා නීතිමය අධීක්ෂණ ක්‍රමයක් ඇතිකිරීමට අවශ්‍ය පියවර පසුගිය වසර 3 තුළදී අප විසින් ගෙන ඇති අතර, අවදානම මත පදනම් වූ ප්‍රාග්ධනය (Risk Based Capital - RBC) සඳහා අවශ්‍ය වැඩ රාමුවක් හඳුන්වාදීම වෙනුවෙන් 2012 දී ශ්‍රී ලංකාවේදී නිකුත් කරන ලද නීති කෙටුම්පත මගින් ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල දැකගැනීමට හැකි විය. RBC සඳහා මාර්ග පරීක්ෂාව (Road Test) වසරේ අවසාන කාර්තු දෙක තුළදී ආරම්භ කර ඇති අතර, මණ්ඩලයේ විශ්ලේෂණය වෙනුවෙන් අවශ්‍ය RBC දත්ත එක්රැස් කර ඇත. 2012 වර්ෂයේ පළමු සහ දෙවන කාර්තුවලට අදාළ දත්ත සහ ඉහත දත්තයන්, RBC පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීමට පෙර එහි අවසන් නීති සැකසීම වෙනුවෙන් හොඳ උත්තේජනයක් ලබා දෙනු ඇත.

## ක්ෂේත්‍රයේ කාර්ය සාධනය

ගෝලීය මූල්‍ය අර්බුදයේ විපාක අත්විඳින යුරෝපීය කලාපයේ අර්බුදකාරී තත්ත්වයන් සහ ශ්‍රී ලංකාවේ අහිතකර කාලගුණික තත්ත්වයන් පවතින අවස්ථාවකදී පවා කර්මාන්තයේ සමස්ථ දළ ලිඛිත වාරික වර්ධනය 11.03% ක් දක්වා වර්ධනය කරගැනීමට හැකිවිය. මෙම කාලය තුළදීම

# අධ්‍යක්ෂ ජනරාල්ගේ සමාලෝචනය

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වර්ධනය 14.67% ක් වූ අතර, දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයේ වර්ධනය 6.56% විය (2012 දී ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය 6.4%). සංසන්දනාත්මකව මෙම කාලය තුළදීම ගෝලීය ප්‍රාථමික රක්ෂණ වෙළඳපොලේ වර්ධනය සාමාන්‍යයක් ලෙස 1% ක් පමණක් විය.

උතුරු සහ නැගෙනහිර පළාත්වල පැවති ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්වල අවසානයත් සමග එම ප්‍රදේශවල වාණිජමය කටයුතුවලට ප්‍රවේශවීමේ හැකියාව නැවත ලැබීමෙන් පසු රක්ෂණ කටයුතු ව්‍යාප්ත කිරීම බස්නාහිර පළාතෙන් දිවයිනේ අනිකුත් පළාත්වලටද ව්‍යාප්ත කළ යුතුය. බස්නාහිර පළාත තුළ ලියාපදිංචි රක්ෂණ නියෝජිතයින් ප්‍රමාණය 40% ක් වන අතර බස්නාහිර පළාතෙන් පිට අනෙක් ඕනෑම පළාතක රක්ෂණ බ්‍රෝකර්වරුනගේ නියෝජනය අඩු මට්ටමක පවතී. සමාලෝචන වර්ෂය තුළ රක්ෂණ බ්‍රෝකර් සමාගම් ලෙස ලියාපදිංචි වී ඇති ගණන 54 ක් වන අතර එයින් සමාගම් 38 ක් ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරික යන කටයුතු දෙකම කිරීමටත් සමාගම් 16 ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරික කටයුතු කිරීමටත් ලියාපදිංචි වී ඇත. 2013 සිට විධිමත් ලෙස බැංකු මගින් රක්ෂණ සහතික නිකුත් කරන සහ ආයතනික නියෝජිතයින් හඳුනාගැනීමත් සමග සමාජයේ වැඩි කොටසකට රක්ෂණය පිළිබඳ වූ උනන්දුව වැඩිකරමින් තවදුරටත් සිය ව්‍යාපාරික ජාලය වැඩි කිරීමේ අවස්ථාව රක්ෂණ ක්ෂේත්‍රයට උදාවී ඇත. දැනට පවතින රක්ෂණ අතරමැදියන්ගේ මෙම හිඟය නිසා රක්ෂණය පිළිබඳ උනන්දුව හා දැනුවත් බව භූගෝලීය වශයෙන් ව්‍යාප්තිය අඩුවීමට හේතුවී ඇත්තේ රක්ෂණ අතරමැදියන්ගේ නිසි ව්‍යාප්තියක් රටපුරා විසිරී නොතිබීමය.

2012 වර්ෂය තුළ රක්ෂණ ක්ෂේත්‍රයේ ව්‍යාපාරික කටයුතු (density) ඇ.ඩො. 33 ක් ලෙස 14% කින් වැඩිවුවද, එය ආසියාතික රටවල ඇ.ඩො. 314 ලෙස පවතින සාමාන්‍ය අගයට වඩා ඉතා අඩු අගයක පවතී. රක්ෂණය පිළිබඳ ජනතාව අතර තිබෙන උනන්දුව අඩු මට්ටමක පැවතුනද රක්ෂණ ක්ෂේත්‍රයේ වර්ධනය තවදුරටත් වැඩි වෙමින් පවතී. සමස්ථ රක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳව කලාපයේ රටවල් අතරින් අප රටේ පවතින උනන්දුව 1.2% ක් වන අතර, අනිකුත් ආසියාතික රටවල එය 5.8% ක් ලෙස පෙන්වන බැවින් එයින් පෙන්නුම් කරන්නේ රක්ෂණ ක්ෂේත්‍රය තවදුරටත් පුළුල් කළ යුතු බවයි.

සමාලෝචන වර්ෂය තුළ රක්ෂණයේ මුළු වත්කම්වල වටිනාකම 15.49% කින් වර්ධනය වී ඇති අතර, එය සැබැවින්ම 2008 වර්ෂයේ අගයට වඩා දෙගුණයකින් වැඩිවී ඇති බව සැලකිය හැකිය. පසුගිය වසර 5 තුළ රක්ෂණ සමාගම්වල සම්පූර්ණ වත්කම්වල සාමාන්‍ය වර්ධනය 17% ක් ලෙස පෙන්වා ඇත. මෙය වර්ෂයක් තුළ ඉතා විශාල වර්ධනයක් ලෙස පෙන්වුවද එය ශ්‍රී ලංකාවේ ප්‍රධාන මුල්‍ය ආයතනවල සම්පූර්ණ වත්කම් බෙදීයන ආකාරය අනුව සංසන්දනය කළවිට රක්ෂණ අංශයේ සම්පූර්ණ වත්කම්වල දායකත්වය 3.3% ක් ලෙසට වාර්තාගත වී ඇත. මෙමගින් නැවතත් පෙන්වනු ලබන්නේ රක්ෂණ ක්ෂේත්‍රයේ උපරිම දායකත්වය සාක්ෂාත් කරගැනීමට නම් ඒ සඳහා දිගු ගමනක් යා යුතු බවත්, ශ්‍රී ලංකාව තුළ රක්ෂණ අංශය වර්ධනය කිරීමේ ඉඩකඩ තවදුරටත් පවතින බවයි.

2012 වර්ෂය තුළ දේශීය සහ විදේශීය ආයෝජකයින් විසින් රක්ෂණ ක්ෂේත්‍රය සඳහා ආයෝජනය වැඩි කිරීම සහ ශාඛා ජාලයක් දිවයින පුරා ව්‍යාප්ත කිරීම වැනි දෑ හඳුනාගෙන ඇත.

## ඉදිරිය බලා කටයුතු කිරීම

රක්ෂණ කර්මාන්තය පිළිබද වත්මන් වෙළඳපොල නැඹුරුවීම් අනුව ඒ සඳහා හොඳ අනාගතයක් පවතින බව සාර්ව ආර්ථික දර්ශක මගින් පෙන්වා දී ඇත.

අවදානම මත පදනම් වූ ප්‍රාග්ධනය සඳහා මාර්ග පරීක්ෂාවේ කටයුතු 2013 වර්ෂය තුළදී අවසන් කිරීමට අප විසින් සැලසුම් කර ඇති අතර, ඊට අදාළ අවසන් නීති කෙටුම්පත සකස් කිරීම සම්පූර්ණ කිරීමට අවශ්‍ය පියවර තවදුරටත් සිදු කරනු ඇත. 2013 වසර තුළදී සැලසුම් කර ඇති අනිකුත් මූලික ප්‍රාරම්භක කටයුතු වන රක්ෂණ සංඛ්‍යා ලේඛණ අඩංගු අත්පොතක් ප්‍රකාශයට පත්කිරීම, මණ්ඩලයේ නිළධාරීන්ට සහ රක්ෂණ ක්ෂේත්‍රයේ යෙදී සිටින අය වෙනුවෙන් අවදානම මත පදනම් වූ ප්‍රාග්ධනය පිළිබඳ වැඩිදුර පුහුණුවක් ලබාදීම, රක්ෂණ ඔප්පු හිමියන්ට සිය පැමිණිලි සහ අදහස් මාර්ගගත ප්‍රවේශය (online access) මගින් ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි නව තාක්ෂණයද අන්තර්ගත කරන ලද වෙබ් අඩවියක් සකස් කිරීම, රක්ෂණ අංශයට අදාළ ලේඛණ විද්‍යුත් ක්‍රමයට (electronic format) සකස් කිරීම ආදිය සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ. මෙම නව වැඩිදියුණු කිරීම්වල ප්‍රතිඵල ලෙස මණ්ඩලයට ප්‍රවේශවීමේ හැකියාව වැඩි කිරීමටත්, පාරිභෝගිකයින්ට සහ සමාගම්වලට අවශ්‍ය තොරතුරු අවම ලිපි කටයුතු මගින් සිදුකිරීමටත් හැකියාව ලැබෙනු ඇත.

2013 වර්ෂය තුළදී ආරම්භ කිරීමට බලාපොරොත්තු වන තවත් ව්‍යාපෘතියක් වනුයේ ශ්‍රී ලංකාව තුළ රක්ෂණ කර්මාන්තයේ ස්ථායි බව නිරීක්ෂණය කිරීම සඳහා ඵලදායි සුපරීක්ෂතා වැඩ රාමුවක් සකස් කිරීම මගින් දැනට පවතින ක්‍රමය ස්ථිර ලෙස තවදුරටත් දියුණු කිරීමය. මෙහිදී මණ්ඩලයට සිය පාලන කටයුතු ඉහළ මට්ටමකින් වැඩි දැනුමක් සහිතව කළ හැකි වනු ඇත. මෙම ව්‍යාපෘතියේ ඉලක්කය වන්නේ අවදානම මත පදනම් වූ සුපරීක්ෂණ වැඩ රාමුවක් මගින් මණ්ඩලය විසින් සිදු කරනු ලබන සුපරීක්ෂණ කටයුතු ශක්තිමත් කිරීම සහ සුපරීක්ෂණ හැකියාවන් තවදුරටත් වැඩි දියුණු කිරීමයි.

රක්ෂණ අංශය මුහුණ දෙන ප්‍රධාන අභියෝගවලින් එකක් වන්නේ ක්ෂේත්‍රය පිළිබද දේශීය ආයුගණක ප්‍රවීණයින්ගේ (actuarial expertise) හිඟකමයි. ලොව පුරා පවතින මෙම ගැටළුව කලාපය තුළ අවස්ථා ගණනාවකදී සාකච්ඡාවට බඳුන්වී ඇති අතර, විශේෂයෙන්ම 2016 දී අවදානම මත පදනම් වූ ප්‍රාග්ධනය සම්බන්ධව හඳුන්වාදීමේ අවස්ථාවේදී ද මෙම ගැටළුවට විසඳුම් සෙවීම සඳහා අවශ්‍ය පියවර ඉදිරියේදී ගනු ඇත.

මිනිසුන් වැඩි වශයෙන් රක්ෂණය යන වචනය දකින්නේ බලෙන් ලබාදෙන නිෂ්පාදනයක් ලෙස වන අතර, එය අළෙවි කරන දෙයක් මිස මිළදී ගන්නා දෙයක් ලෙස නොවේ. ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපනය, සෞඛ්‍යය සහ පාරම්පරිකව ඉතා හොඳින් ආරක්ෂක වළල්ලක් ලෙස යොදාගනු ලබන ජීවිතාන්තය දක්වා දරුවන් විසින් දෙමව්පියන් රැකබලා ගැනීම වැනි සිරිත් අනුගමනය කිරීම හේතුවෙන් රක්ෂණය කෙරෙහි ලබාදී ඇත්තේ අඩු ප්‍රමුඛත්වයකි. කෙසේ වෙතත්, රක්ෂණ යෝජනාක්‍රම හරහා සෞඛ්‍ය රක්ෂණාවරණයක අවශ්‍යතාවය වැඩි බව සමකාලීන නැඹුරුවීම්වලින් පෙන්වනු ලබන අතර, විශ්‍රාමිකයන් සඳහා නව

# අධ්‍යක්ෂ ජනරාල්ගේ සමාලෝචනය

රක්ෂණ යෝජනාක්‍රම හඳුන්වාදීමේ දැඩි අවශ්‍යතාවයක් ඇත. ශ්‍රී ලංකාව තුළ විවිධ ආදායම් මට්ටම් ඇති අයට දැරිය හැකි රක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වාදීමේ පුළුල් ක්‍රමවේදයක්ද සකස් කල යුතුව ඇත.


මහජනතාව විසින් රක්ෂණය අවදානම් කළමණාකරන මෙවලමක් ලෙස සැලකීම රක්ෂණ ක්ෂේත්‍රය මුහුණපාන තවත් අභියෝගයකි. පාරිභෝගිකයින් රක්ෂණය කෙරෙහි ඇති විශ්වාසය, දැනට පවතින විවිධාංගීකරණය වූ රක්ෂණ ඔප්පු සමග තවදුරටත් වැඩි වී ඇත. මෙකී රක්ෂණ ඔප්පු මගින් රක්ෂණය සඳහා ඇති දැනුවත්භාවය මහජනයා අතර ප්‍රචලිත වීමට රුකුලක් වී ඇත. මෙකී කරුණු තුලින් මහජනයා අතර රක්ෂණය මූල්‍ය මෙවලමක් ලෙස ප්‍රචලිත කිරීමට රක්ෂණ ක්ෂේත්‍රය විසින් කටයුතු කල යුතුවේ.

### නිමාව

රක්ෂණ ක්ෂේත්‍රයේ ස්ථායි වර්ධනය පවත්වා ගැනීමට මහජනතාවගේ දැනුවත්භාවය සහ අවබෝධය පමණක් ප්‍රමාණවත් නොවේ. පාරිභෝගිකයා උපයන ආදායම අනුව ඔවුන්ට දැරිය හැකි වාරික සහිත යෝජනාක්‍රම හඳුන්වා දෙන්නේ නම් රක්ෂණය පිළිබඳව මහජනතාව තුළ තිබෙන අවබෝධය සහ විශ්වාසය වැඩි කිරීමට හේතු වේ. රක්ෂණකරුවන්ගේ ලාභය වැඩි කරගනිමින් රක්ෂණ ක්ෂේත්‍රයේ වැඩි දියුණුවට බලපාන ලෙස රක්ෂණ ඔප්පු හිමියන් ද සහභාගී කරවාගෙන කටයුතු කිරීමෙන් ලැබෙන ආදායම් තාර්කික ලෙස ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය පිණිස යොදාගත යුතුය.

පහළ මට්ටමක රක්ෂණ අවබෝධයක් සහ අඩු වර්ධන ඝණත්වයක් සහිත ආර්ථික වටපිටාවක් පවතින අවස්ථාවක රක්ෂණ ක්ෂේත්‍රයේ වේගවත් සහ කඩිනම් වර්ධනය පෙන්නුම් කරන්නේ ඒ සඳහා අතිවිශාල විභවයක් ඇති බවත්, එය පුළුල් ලෙස භූගෝලීයව සමාජ ස්ථර හරහා මූල්‍යාධාර ඇතිව කළ යුතු බවයි. මෙකී අවස්ථා අහිමි නොකර ගනිමින් ක්ෂේත්‍රයට ස්ථිර අනාගතයක් සාදාගැනීම උදෙසා කටයුතු කිරීම රක්ෂණ අංශය විසින් ගනු ලබන ක්‍රියා කලාපය මත රඳා පවතී.

සභාපතිතුමිය සහ අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයින් විසින් වර්ෂය මුළුල්ලේ ලබාදෙන ලද මඟ පෙන්වීමට සහ නොසැලෙන සහයෝගයට මම ස්තූති කිරීමට කැමැත්තෙමි. මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය වෙනුවෙන් සභාපතිතුමිය විසින් මනා උපදේශාත්මක සේවාවක් ලබාදෙන ලද අතර, ඇය සතු බුද්ධිමත් නායකත්වය පිළිබඳව අපි එක්ව සහ වෙන් වෙන්ව ඇයට කෘතඥ වෙමු. ශ්‍රී ලංකාව තුළ ස්ථිර රක්ෂණ ක්ෂේත්‍රයක් ස්ථාපිත කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ කරුවන්ගේ සංගමය (IASL), ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය (SLIBA) සහ ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (SLII) යන ආයතනවල සභාපතිතුමන්ලා සහ නිලධාරී මහතුන් විසින් දෙන ලද සහයෝගය ද මම අගය කොට සලකමි. මණ්ඩලයේ සාමාජිකයින්ගේ කැපවීම සහ පොදු අරමුණක් සපුරා ගැනීම සඳහා ඒකීයත්වයෙන් හා වගකීම් පෙරදැරි කරගත් හැඟීම් හේතුවෙන් 2012 වර්ෂය තුළ රක්ෂණ ක්ෂේත්‍රයේ ඉදිරි ගමනක් යාමට අපට හැකි වූ අතර, ඔවුන්ගේ ඉහළ මට්ටමේ වෘත්තීයමය දක්ෂතාවය උපයෝගී කරගනිමින් විශිෂ්ඨ සේවයක් සැපයීම වෙනුවෙන් ස්තූතිවන්ත වෙමි. එසේම කාර්ය මණ්ඩලය විසින් දක්වන ලද සහයෝගයටද ස්තූති කිරීමට මම අමතක නොකරමි.




**චන්ද්‍රී ගුණවර්ධන**
අධ්‍යක්ෂ ජනරාල්

2013 අගෝස්තු 7

# මණ්ඩලයේ සාමාජිකයන්






1. ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය
   *සභාපතිනි*
2. ජී. ගුණවර්ධන මහතා
   *සාමාජික*
3. බී. ඩී. ඩබ්ලිව් ආනන්ද සිල්වා මහතා
   *සාමාජික*
4. එස්. ආර්. ආටිගල මහතා
   *සාමාජික*
5. ගාමිණී කෙහොන මහතා
   *සාමාජික*
6. මොහොමඩ් නවාස් රාජාබ්ඩීන් මහතා
   *සාමාජික*

# මණ්ඩල සාමාජිකයන් පිළිබඳව

**ඉන්ද්‍රාණී සුගතදාස මහත්මිය** 2010 වසරේ පටන් මණ්ඩලයෙහි සභාපති ධූරය උසුලමින් සිටින්නීය. කොළඹ මියුසියස් විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලද සුගතදාස මහත්මිය කොළඹ විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය ලබා, අනතුරුව ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් සරසවියෙන් ව්‍යාපාර/රාජ්‍ය පරිපාලන ශාස්ත්‍රපති උපාධිය හිමි කරගෙන ඇත. එමෙන්ම ඇය 1990 වර්ෂයේ එක්සත් ජනපද රජයෙන් හියුබට් එච්. හම්ප්‍රි අධි ශිෂ්‍යත්වයක් ලැබ, එම වර්ෂය තුළ නිව්යෝර්ක් නුවර සරසවියේ හන්ටර් විද්‍යාලයට අනුබද්ධිතව අධ්‍යාපනය ලබා ඇත.

මීට අමතරව සුගතදාස මහත්මිය පරිඝනක විද්‍යාව, පිරිස් කළමනාකරණය සහ රාජ්‍ය සේවා කළමනාකරණය පිළිබඳ වෘත්තීය පුහුණුව ද ලබා සිටින්නීය.

1977 දී ශ්‍රී ලංකා රාජ්‍ය පරිපාලන සේවයට ඇතුළත්ව සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරියක් ලෙස තම වෘත්තීය දිවිය ඇරඹි ඇය, පරිපාලන ධූරාවලියේ මුදුන් පෙත්තටම ළඟා විය.

රාජ්‍ය අංශයේ ප්‍රධාන ප්‍රවාහයට සම්බන්ධව කටයුතු කරන අතරතුර සුගතදාස මහත්මිය ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂිකා ධූරය, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ අධ්‍යක්ෂිකා ධූරය, ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සභාපති ධූරය සහ ළමා සංවර්ධනය හා කාන්තා බලගැන්වීම් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් යන ධූරයන් හෙබවීය.

දශක තුනකට අධික කාලයක් පුරාවට රාජ්‍ය සේවයට සම්බන්ධව කටයුතු කිරීමෙන් පසුව, ඇය 2010 වර්ෂයේ දී වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් ධූරයෙන් විශ්‍රාම ගත්තාය.

විශ්‍රාම ගැනීමෙන් අනතුරුව ඇය ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයෙහි මෙන්ම ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවෙහි ද සභාපතිනිය ලෙස තෝරා පත් කර ගන්නා ලදී. 2011 වර්ෂය දක්වා ඇය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙහි සේවය කළාය.

දේශීය මෙන්ම විදේශීය රටවල ද සුගතදාස මහත්මිය සහභාගී වූ සම්මන්ත්‍රණ සහ සම්මේලනවලට අමතරව ඇය විදේශීය ශ්‍රී ලාංකික දූත මණ්ඩල සහ ජාත්‍යන්තර සංසදයන් කිහිපයකම සාමාජිකාවක් ද විය.

**එස්. ආර්. ආටිගල මහතා** ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ ආර්ථික විද්‍යාඥයෙක් වන එස්.ආර්. ආටිගල මහතා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් සහ වැඩබලන සභාපතිවරයෙක් වශයෙන්ද, ෂෙල්ගෑස් ලංකා සමාගමේ අධ්‍යක්ෂවරයෙක් වශයෙන් ද සේවය කර ඇත. 2011 වසර අවසානය දක්වාම ඔහු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් ද රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් ද කටයුතු කර තිබේ.

ඔහු දැනට භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයෙක් වශයෙන් සේවය කරයි. තව ද ඔහු ලංකා බැංකුව සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය යන ආයතනවල මණ්ඩල අධ්‍යක්ෂවරයෙක් ලෙස ද සේවය කරමින් සිටී. ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මණ්ඩල සාමාජිකයෙක් වශයෙන් ද, කටයුතු කරමින් සිටී.

ආටිගල මහතා කොළඹ විශ්ව විද්‍යාලයෙන් ගණිතය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය ලැබ, එක්සත් ජනපදයේ වොරික් සරසවියෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා සිටී.

**බී.ඩී.ඩබ්. ආනන්ද සිල්වා මහතා** වසර 28ක කාලයක් තුළ මහ බැංකුවේ සංවර්ධන මූල්‍ය දෙපාරත්මේන්තුව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සහ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවල සේවය කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ වසර 28ක තම සේවා කාලය තුළ ඔහු මූල්‍ය ප්‍රතිපත්ති, බැංකු අධීක්ෂණය, මූල්‍ය පද්ධති ස්ථායීතාව, විනිමය අනුපාත ප්‍රතිපත්තිය, විදේශ වෙළඳාම සහ ගෙවුම් ශේෂය යන ක්ෂේත්‍ර කෙරෙහි පුළුල් අත්දැකීම් ලබා ගෙන තිබේ. යාපනය විශ්වවිද්‍යාලයෙන් පළමු පෙළ විද්‍යාවේදී උපාධියක් ලබා ඇති ඔහු, ඇමරිකා එක්සත් ජනපදයේ IOWA විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියක් ද, ඇමරිකා එක්සත් ජනපදයේ ඉලිනෝයිස් විශ්ව විද්‍යාලයෙන් විද්‍යාපති උපාධියක් ද ලබා සිටී. කොළඹ විශ්ව විද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරයෙක් ලෙස සේවය කරමින් සිටින අතරම ඔහු මහා බැංකුව විසින් පවත්වනු ලබන උසස් පාඨමාලා කිහිපයක සම්පත් දායකයෙක් ලෙස ද ක්‍රියා කරමින් සිටියි.

සිල්වා මහතා දැනට ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ සභාපති, ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ ආයතනයේ සභාපති, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ, ''අපි වෙනුවෙන් අපි'' අරමුදලේ අධ්‍යක්ෂ යන ධූරයන් හොබවමින් සිටියි.

**ග්‍රේෂන් ගුණවර්ධන මහතා** මණ්ඩලයට පත් වූයේ 2010 මැයි මාසයේ දීය. ඔහු මීට පෙර අපනයනකරුවන්ගේ සංගමයේ හා ශ්‍රී ලංකා තායිවාන මිත්‍රත්ව සංගමයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කර ඇත. එමෙන්ම ඇමරිකානු වාණිජ මණ්ඩලයේ හිටපු අධ්‍යක්ෂවරයෙකි. ඒ මහතා ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරයෙක් ද විය.

වර්තමානයේ දී ගුණවර්ධන මහතා සංවිධාන හා පෞද්ගලික සමාගම් කිහිපයක සභාපතිවරයා වෙයි. 1999/2000 වර්ෂයේ හොඳම ව්‍යවසායකයා වශයෙන් සම්මාන ලැබූ හෙතෙම වසර කිහිපයක දීම මහා පරිමාණ කාණ්ඩයේ හොඳම අපනයනකරු වශයෙන් ද රන් පදක්කම ලැබීය.

වර්ෂ 2006 බොස්ටන් ඇකඩමි සම්මාන උළෙලේ දි ලෝකයේ හොඳම ගවනර් (බෙස්ට් ගවනර් ඉන් ද වර්ල්ඩ්) සම්මානය දිනා ගත්තේ ද ඒ මහතාය.

තර්ස්ටන් විද්‍යාලයෙන් අධ්‍යාපනය ලද ගුණවර්ධන මහතා ගුවන් යානා ඉංජිනේරු තාක්ෂණ නිලධාරියෙකු වශයෙන් රාජකීය ලංකා ගුවන් හමුදාවට බැඳුණි. ඉන් පසු පොලිස් දෙපාර්තමේන්තුවේ අවුරුදු 12ක් සේවය කළේය. ලොව ප්‍රධාන පෙළේ කාර්මික අත්වැසුම් නිෂ්පාදකයකු හා අපනයනකරුවකු වන හෑන්ඩ්ස් ඉන්ටර්නැෂනල් සමාගමේ ආරම්භක සභාපතිවරයා වූයේ ද ඔහුය.

# මණ්ඩල සාමාජිකයන් පිළිබඳව

**ගාමිණී කොහොන මහතා** 2010 ජූලි මාසයේ දී අධ්‍යක්ෂ මණ්ඩලයට පත් විය. ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයෙන් අධ්‍යාපනය ලද කොහොන මහතා වතු ක්ෂේත්‍රයේ තිස් වසරකට අධික අත්දැකීම් ලද කෘතහස්ත පාලකයෙකි. තේ, රබර්, පොල් හා පාම් වතු පාලනයෙහි යෙදුණු ඒ මහතා සෙන්ට්‍රල් හිල්ස් වැවිලි සමාගමේ හිටපු ප්‍රධාන විධායකවරයා විය. දැනට හෙතෙම පුලතිසි එක්ස්පෝට් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයාය.


**මොහොමඩ් නවාස් රාජබ්ඩීන් මහතා** අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වුයේ 2010 ජූලි මාසයේ දීය. අලෙවිකරණ හා ගනුදෙනුකාර සබඳතා අංශයෙන් හෙතෙම විශේෂඥතාවක් පෙන්වයි.

හොටෙල් ඩිවලොපර්ස් සමාගමේ සභාපති, ශ්‍රී ලංකා කර්මාන්ත හා වාණිජ මණ්ඩල සංගමයේ සභාපති, සාර්ක් වාණිජ මණ්ඩලයේ උප සභාපති, ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලයේ සභාපති, එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානයේ ජාතික අධ්‍යක්ෂ සහ සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර ලෝක සම්මේලනයේ උප සභාපති යන තනතුරු ඒ මහතා විසින් දරනු ලැබීය.

රාජබ්ඩීන් මහතා දැනට අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ තනතුර හොබවන අතර රාජබ්ඩීන් සමාගම් සමූහයේ සභාපති හා කළමනාකරණ අධ්‍යක්ෂක වශයෙන්ද 1984 වර්ෂයේ සිට කටයුතු කරන්නේ ද ඒ මහතාය.

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම







1. චන්ද්‍රි ගුණවර්ධන මහතා
   *(අධ්‍යක්ෂ ජනරාල්)*
2. දමයන්ති ප්‍රනාන්දු මහත්මිය
   *(අධ්‍යක්ෂ නීති)*
3. චායා විතානවසම් මහත්මිය
   *(අධ්‍යක්ෂ මූල්‍ය හා පරිපාලන)*
4. නිහාල් රාමනායක මහතා
   *(අධ්‍යක්ෂ අධීක්ෂණ)*
5. රාජන් නිරූබසිංහම් මහතා
   *(සහකාර අධ්‍යක්ෂ නීති)*
6. චමරී ඒකනායක මහත්මිය
   *(සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ)*
7. තමරී සේනානායක මහත්මිය
   *(අධ්‍යක්ෂ විමර්ශන)*

# කාර්ය මණ්ඩලය







**ඉදිරි පෙළ**

1. තනුජා ඇන්තනී මහත්මිය
2. ශ්‍යාමලී අත්තනායක මහත්මිය
3. ලක්මාලී අල්ගම මහත්මිය
4. චන්දිමා කඹුරුගමුව මහත්මිය
5. කෝකිලා සිරිවර්ධන මහත්මිය
6. මෙරිනා ඩයස් මහත්මිය
7. ප්‍රියංගි ද සිල්වා මෙනෙවිය
8. වීණා දිනේකා මහත්මිය

**පසු පෙළ**

9. කපිල තිලකරත්න මහතා
10. එතිර්රාජ් ශ්‍රීකාන්තන් මහතා
11. චතුරි බණ්ඩාර මහත්මිය
12. බිම්සර විජේසිංහ මහතා
13. උපේන්ද්‍රා සෙනෙවිරත්න මහත්මිය
14. එච්. පී. අසංක මහතා
15. හර්ෂණ වන්නිආරච්චි මහතා







**ඉදිරි පෙළ**

1. සනත් උදයංග මහතා
2. ඩෙසිකා රත්නායක මහත්මිය
3. පවිත්‍රා පුංචිහේවා මහත්මිය
4. තුෂාරි විජේගුණවර්ධන මෙනෙවිය
5. රුවිනි ලියනගේ මහත්මිය
6. ඩී. ඩබ්ලිව්. එස්. එස්. සුපුලී මහත්මිය
7. ලසන්ති තොටහේවා මහත්මිය

**පසු පෙළ**

8. ඩී. එස්. කේ. සේනාධීර මහතා
9. කෞශාලි දයාරත්න මහත්මිය
10. චරිත වික්‍රමසිංහ මහතා
11. සාරිකා වත්තුහේවා මහත්මිය
12. ලක්ෂ්මන් විජේසිංහ මහතා
13. මල්හාරි වික්‍රමසිංහ මහත්මිය
14. සුජීවා රණසිංහ මහත්මිය
15. ලක්මල් කළුබෝවිල මහතා
16. එම්. චමින්ද ලාල් කුමාර මහතා



# සමාලෝචනයන්


**පොදු සමාලෝචනය** **22**

**සංඛ්‍යානමය සමාලෝචනය** **27**

**මෙහෙයුම් කටයුතු සමාලෝචනය**

- අධීක්ෂණ සමාලෝචනය 54
- නියාමන සමාලෝචනය 57
- විමර්ශනාත්මක සමාලෝචනය 61
- වෙළඳපොල සංවර්ධන හා බාහිර සබඳතා සමාලෝචනය 63
- පරිපාලනමය සමාලෝචනය 65
- මූල්‍ය සමාලෝචනය 66

# පොදු සමාලෝචනය

### පනත ක්‍රියාත්මක කිරීම

### නීති සම්පාදනය

රක්ෂණ සහතික දරන්නන්ගේ සහ අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ අයිතිවාසිකම් ආරක්ෂාවන ආකාරයෙන් ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය සද්භාවයෙන් ද වෘත්තීමය හා විචක්ෂණභාවයෙන් ද යුතුව කරගෙන යනු ලබන බවට සහතික වනු පිණිසත්, රක්ෂණ කර්මාන්තයේ නියාමනය, සුපරීක්ෂණය හා සංවර්ධනය අරමුණු කොට 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත (මෙතැන් පටන් 'පනත' යනුවෙන් භාවිතා වන) මගින් වර්ෂ 2001 මාර්තු මස 01 වන දින සිට ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය (මෙතැන් පටන් 'මණ්ඩලය' යනුවෙන් භාවිතා වන) ස්ථාපනය කරනු ලැබුවේය.

රක්ෂණ ආයතන හා රක්ෂණ අතරමැදියන් (රක්ෂණ තැරැව්කරුවන් හා රක්ෂණ නියෝජිතයන්) නියාමනය හා අධීක්ෂණය කිරීම සඳහා අදාළ නෛතික රාමුව පනත මගින් සලසා ඇත.

පනත සම්මත කිරීමට පෙර රක්ෂණ කර්මාන්තය නියාමනය කරනු ලැබුවේ 1962 අංක 25 දරණ රක්ෂණ පාලන පනත මගින් පැවරුනු බලතලවලට අනුකූලව රක්ෂණ පාලක තැන විසිනි. පනත හඳුන්වාදීමෙන් පසු එකී පනත අකර්මන්‍ය විය.

රක්ෂණ කර්මාන්තය වඩාත් ශක්තිමත් කිරීම පිණිස ප්‍රධාන පනතටත් ඊට අදාළ උපනීතිවලටත් සංශෝධන කිහිපයක් වරින්වර හඳුන්වා දෙන ලද අතර මෙම වසර තුල සිදුකල සංශෝධන මෙකී වාර්තාවේ නියාමන සමාලෝචනයෙහි සවිස්තරාත්මකව දැක්වේ.


### වෙළඳපොළ ව්‍යුහය

### රක්ෂණ සමාගම්

පනතේ 13 වන වගන්තියට අනුව ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරයේ නියැලෙන්නට උනන්දුවක් දක්වන තැනැත්තකු 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ පොදු සමාගමක් වශයෙන් සංස්ථාපනය විය යුතු අතර නියමිත අනෙකුත් ව්‍යවස්ථාපිත අවශ්‍යතා සපුරාලීමෙන් අනතුරුව පනත යටතේ රක්ෂකයෙකු වශයෙන් ලියාපදිංචි විය යුතුය.

වසර අවසාන වන විට පනත යටතේ සමාගම් 22 ක් ලියාපදිංචි වී තිබුණි. මෙයින් 21 ක් ක්‍රියාකාරීව පවතින අතර සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ්හි ලියාපදිංචිය 2009 වසරේ සිට අත්හිටුවා ඇත. රූප සටහන 1 දැක්වෙන්නේ රක්ෂණ සමාගම් ව්‍යාපාර මෙහෙයුම් සඳහා ලියාපදිංචි වී ඇති පන්තීන්ය. සමාගම් 22 න් 12ක් දිගුකාලීන හා සාමාන්‍ය යන දෙආකාරයෙන්ම රක්ෂණ කටයුතු කරන සංයුක්ත සමාගම් වශයෙන් ලියාපදිංචි වී ඇති අතර දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර සඳහා සමාගම් 3ක් ද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු සඳහා සමාගම් 7ක් ද ලියාපදිංචි වී ඇත.

**රූප සටහන 1**
***රක්ෂණ සමාගම් විසින් කරගෙන යනු ලබන රක්ෂණ ව්‍යාපාර පන්තීන්***





### රක්ෂණ තැරැව්කරුවෝ

රක්ෂණ තැරැව්කරුවකු යනු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද හා රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරයෙහි යෙදීම සඳහා පනත යටතේ ලියාපදිංචිය ලද සමාගම් වේ. රක්ෂණ තැරැව්කරුවන් යනු, තැරැව්කාර ගාස්තු හෝ කොමිස් මුදල් අපේක්ෂාවෙන් රක්ෂණ සමාගම් හෝ ප්‍රතිරක්ෂණ සමාගම් සමඟ හෝ ඔවුන් වෙනුවෙන් රක්ෂණ ව්‍යාපාර ඇති කිරීම සඳහා රක්ෂණ සහතික දරන්නන් හෝ රක්ෂණය හෝ ප්‍රතිරක්ෂණය සඳහා යෝජනා කරන්නන් අතර අතරමැදියන් ලෙස කටයුතු කරන්නන් අදහස් කෙරේ.

වසර අවසානයේදී රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරයෙහි නියුතු සමාගම් 54 ක් තිබුණි. එකී සමාගම් අතුරින් සමාගම් 38 ක් දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර යන දෙකහිම යෙදී සිටි අතර 16 ක් සාමාන්‍ය තැරැව්කාර ව්‍යාපාර කටයුතු වල පමණක් යෙදී සිටියේය. පහත 2 වන රූප සටහනේ දැක්වෙන්නේ රක්ෂණ තැරැව්කාර සමාගම් ව්‍යාපාර මෙහෙයුම් සඳහා ලියාපදිංචි වී ඇති පන්තීන්ය.

**රූප සටහන 2**
***රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් කරගෙන යනු ලබන රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර පන්තීන්***



# පොදු සමාලෝචනය

### රක්ෂණ නියෝජිතයන්

පනත යටතේ රක්ෂණ සමාගම් හෝ රක්ෂණ තැරැව්කාර සමාගම් සමඟ ලියාපදිංචි වී ඇති හා රක්ෂණ සමාගම් හෝ රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා රක්ෂණ ව්‍යාපාර සොයාදීම වෙනුවෙන් ප්‍රතිශ්ඨාව ලෙස කොමිස් ලබා ගන්නා තනි පුද්ගලයින් රක්ෂණ නියෝජිතයින් වේ. එලෙස ලියාපදිංචිය ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් මණ්ඩලය විසින් දක්වා ඇත.

2011 අංක 3 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ සංශෝධන පනත (මෙතැන් පටන් 'සංශෝධන පනත' ලෙස භාවිතා වන) මගින් තනි පුද්ගලයන් නොවන ආයතන වලට රක්ෂණ නියෝජිතයන් ලෙස ක්‍රියාකරන්නට අවසර ලැබේ.

පනතේ 34 වන වගන්තියට අනුව රක්ෂණ නියෝජිතයින් රක්ෂණ සමාගම්වලටත් රක්ෂණ තැරැව්කාර සමාගම්වලටත් ව්‍යාපාර සොයා දෙන ප්‍රධාන ප්‍රවාහයන්ගෙන් එකක් වේ.


රක්ෂණ සමාගම් විසින් සපයා ඇති තොරතුරුවලට අනුව වසර තුළ දී රක්ෂණ නියෝජිතයන් වශයෙන් තනි පුද්ගලයින් 12,604ක් පමණ බඳවා ගෙන ඇත.

2012 දෙසැම්බර් 31 වන විට රක්ෂණ සමාගම් නියෝජනය කරමින් සිටි මුළු නියෝජිත සංඛ්‍යාව 36,801ක් පමණ විය. පහත 3 වන රූප සටහනේ දැක්වෙන්නේ රක්ෂණ සමාගම් සමඟ ලියාපදිංචි රක්ෂණ නියෝජිත සංඛ්‍යාව වේ.


### සමාගම්වල තත්ත්වය සහ ප්‍රාග්ධන වෙනස්කම්

රක්ෂණ සමාගම් අතරින් රක්ෂණ සමාගම් හතක් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තු ගත කොට ඇත. නම් වශයෙන් ඒවා සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී, ඒඅයිඒ ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී යුනියන් ඇෂුවරන්ස් පීඑල්සී, ඒෂියන් එලායන්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී, එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී, අමානා තකාෆුල් පීඑල්සී සහ ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී වේ. 4 වන රූප සටහනේ දැක්වෙන්නේ ලැයිස්තුගත/ලැයිස්තුගත නොවූ රක්ෂණ සමාගම් හි ප්‍රතිශතය වේ.

**රූප සටහන 3**
**රක්ෂණ සමාගම් හි ලියාපදිංචි රක්ෂණ නියෝජිතයින්**




**රූප සටහන 4**
**ලැයිස්තුගත කරන ලද / ලැයිස්තුගත නොකරන ලද රක්ෂණ සමාගම්වල තත්ත්වය**




සංශෝධිත පනතින් ඒ වන විට ව්‍යාපාර කටයුතුවල නිරතව සිටින රක්ෂකයකු සංශෝධිත පනත ක්‍රියාත්මක වූ දින සිට වසර පහක් ඇතුළත දී 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍ර ලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගතව තිබිය යුතුය. ලැයිස්තු ගත කිරීමට පෙරාතුව, සංශෝධිත පනත ක්‍රියාත්මක වූ දින සිට වසර හතරක කාලයක් ඇතුළත සංයුක්ත රක්ෂණ සමාගම් ඒවායේ ව්‍යාපාර කටයුතු වෙන් වෙන් සමාගම් දෙකකට වෙන් කළ යුතුය.

මෙසේ වෙන් කිරීමේ දී පැන නැගිය හැකි අභියෝගයන් සහ ඒ සඳහා පිළියම් හඳුනා ගැනීමේ අරමුණින් මණ්ඩලය, ශ්‍රී ලංකා රක්ෂණ සංගමය (IASL) සමඟ එක්ව කටයුතු කරයි.

සංශෝධිත පනත බලාත්මක වූවායින් පසුව ලියාපදිංචිය ලැබූ නව රක්ෂණ සමාගමක් මණ්ඩලය මගින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමෙන් වසර තුනක කාලයක් ඇතුළත දී කොටස් හුවමාරුවේ ලැයිස්තුගත විය යුතු බවට නියම කෙරේ.

2011 ජූනි මාසයට පෙරාතුව ලියාපදිංචිය ලද රක්ෂණ සමාගම්, 2015 පෙබරවාරි මස 11 වන දින හෝ එදිනට පෙර, එක් ව්‍යාපාර පන්තියක් සඳහා තමන්ගේ ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය රුපියල් මිලියන 500 අවමයක් දක්වා වැඩි කළ යුතු බවට මණ්ඩලය නියම කර ඇත.

රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා මෙකී තත්ත්වය වන්නේ, එකී සමාගම් 2014 දෙසැම්බර් 31 දින හෝ එදිනට පෙර රුපියල් මිලියන 2.5කට නොඅඩු ගෙවා නිම කොටස් ප්‍රාග්ධනයක් තිබිය යුතුවීමය.

# පොදු සමාලෝචනය

රක්ෂණ සමාගම් සඳහා වන අවදානම් පාදක ප්‍රාග්ධනයක් (RBC) හඳුන්වාදීම මණ්ඩලය විසින් සිදු කරමින් පවතී.

2002 අප්‍රේල් මස විනිමය පාලක දෙපාර්තුමේන්තුව විසින් ප්‍රකාශයට පත්කරන ලද අංක 1232/14 දරණ ගැසට් දැන්වීම ප්‍රකාර විදේශ ව්‍යාපාර කොටස් 100% දක්වා රක්ෂණ සමාගම් වලට තබා ගැනීමට අවසර දී ඇත.

### රක්ෂණ සමාගම්වලින් සෙස් බද්දක් අය කිරීම

පනතේ 7 වන වගන්තිය යටතේ ගරු මුදල් අමාත්‍යවරයා විසින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම සඳහා සෙස් බද්දක් අය කිරීමේ නියෝගයක් පනවන ලදී. 2002 ජූලි 9 දින අංක 1244/5 දරණ ගැසට් නිවේදනය මගින් දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයක සමස්ථ ශුද්ධ වාරිකයෙන් 0.2%ක් ද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයක සමස්ථ ශුද්ධ වාරිකයෙන් 0.4% ද වශයෙන් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට බැර කළ යුතු බව පැහැදිලි කොට ඇත. රක්ෂකයන්ගෙන් සෙස් බදු එකතු කිරීම 2003 ජනවාරියේ සිට ක්‍රියාත්මක වූ අතර 2012 වසරේ එසේ එකතු කරන ලද මුදල රුපියල් මිලියන 237කි. වගුව 1 මගින් සෙස් බද්ද හා ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල ගැන දැක්වේ.

### ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල


පනතේ 103 වන වගන්තිය ප්‍රකාර ස්ථාපනය කෙරුණු ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට රක්ෂකයන්ගෙන් එකතු කළ සෙස් බද්ද තැන්පත් කරනු ලැබේ. වර්තමාන මෙන්ම අනාගත ඔප්පු හිමියන්ගේද යහපත උදෙසා මෙම අරමුදල් පහත දැක්වෙන ආකාරයට යොදවා ගත හැක.

අ) රක්ෂණ කර්මාන්තය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේදීත්, රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම් කටයුතුවලදීත් සිදුවන වියදම් පියවාලීම සහ

ආ) මණ්ඩලය එහි බලතල, වගකීම් හා මෙහෙයුම් ක්‍රියාවට නැංවීමේ දී දරනු ලබන වියදම් පියවා ගැනීම.

**වගුව 1**

**සෙස් බද්ද හා ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල**




ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙහි ඇති වත්කම් රජයේ සුරැකුම්පත්හි අයෝජනය කෙරේ. 2012 දෙසැම්බර් 31 දිනට එම අරමුදලෙහි සංචිතය රුපියල් මිලියන 1,622 ක් විය. මෙය 2011 දෙසැම්බර් 31 දී රුපියල් මිලියන 1,279ක මුදලෙන් 26.81%ක වර්ධනයකි.

### රක්ෂණ බදු

සාමාන්‍ය රක්ෂණ කටයුතුවල කිසිදු පන්තියක් සඳහා වන බදු කිසිවක් දැනට ක්‍රියාත්මක නැත. 2002, 2005 හා 2007 යන වර්ෂවල ජනවාරි පළමුවැනිදා සිට අනුපිළිවෙළින් ක්‍රියාත්මක වන පරිදි මෝටර් රථ රක්ෂණය, ගිනි රක්ෂණය සහ කම්කරු වන්දි රක්ෂණය මත ක්‍රියාත්මක වූ බදු අහෝසි කරන ලදී.

### එතෙර රක්ෂණ - සංචාරක, සෞඛ්‍ය සහ වගකීම් රක්ෂණය

පනතේ 101 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ ඕනෑම පුද්ගලයෙකුට, එතෙර ලියාපදිංචි හෝ බලපත් ලද, (ශ්‍රී ලංකාව තුළ පනත යටතේ ලියාපදිංචියක් ලබා නොමැති වුව ද) රක්ෂකයෙකුගෙන් සෘජු හෝ වක්‍ර මාර්ගයකින් සෞඛ්‍ය හා සංචාරක රක්ෂණයක් ලබා ගැනීම සඳහා මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. තව ද අධ්‍යක්ෂවරුන් සහ කාර්ය මණ්ඩලය සිය කාර්යභාරය ඉටු කිරීමේදී පැන නගින වන්දි ගෙවීම්වලින් ආරක්ෂා කර ගැනීම සඳහා පනත යටතේ ලියාපදිංචියක් ලබා නොමැති වුවද, එතෙර ලියාපදිංචිය හෝ බලපත්ලත් රක්ෂකයකුගෙන් වගකීම් රක්ෂණ සහතිකයක් ලබා ගැනීමට ලියාපදිංචිය ලත් රක්ෂකයනට අනුමැතිය ලබා දී ඇත. එබඳු ක්‍රියා මාර්ගයක දී දේශීය පාර්ශවකරුවන්ට ලැබෙන වන්දි ශ්‍රී ලංකාව තුළට විදේශ මුදල් වශයෙන් ගෙන ඒම කළ යුතුය.

### පනතේ බලපෑමෙන් නිදහස්වීම

පනතේ 12(3) වන වගන්තිය ප්‍රකාරව පනතෙන් පැනවෙන නීති රීති පහත දැක්වෙන රක්ෂණ ආයතනවලට බල නොපැවැත්වේ. 1999 අංක 20 දරණ කෘෂි හා වගා රක්ෂණ පනත මඟින් ස්ථාපනය කරන ලද කෘෂි හා වගා රක්ෂණ මණ්ඩලය, 1978 අංක 15 දරණ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත විසින් ස්ථාපිත ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව, 1996 අංක 17 දරණ සමාජ රක්ෂණ මණ්ඩල පනත යටතේ ස්ථාපිත සමාජ රක්ෂණ මණ්ඩලය.

### ජාතික රක්ෂණ භාර අරමුදල ( (NITF)

2006 අංක 28 දරණ ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මඟින් ස්ථාපනය කරන ලද ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය,

# පොදු සමාලෝචනය

පනතට කරන ලද සංශෝධනයක් මගින් 'මණ්ඩලයේ' විෂය පථය තුළට ග්‍රහණය කරනු ලැබ ඇත.

ජාතික රක්ෂණ භාර අරමුදල් පනත ප්‍රකාරව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලැබූ 'වර්ජන, කැරලි, සිවිල් කැළඹීම් හා ත්‍රස්ත අරමුදල' ජාතික රක්ෂණ භාර අරමුදලට පවරන ලදී. ජාතික රක්ෂණ භාර අරමුදල වෙනුවෙන් 'වර්ජන, කැරලි, සිවිල් කැළඹීම් හා ත්‍රස්ත අවදානම්' ආවරණය කෙරෙන රක්ෂණ කටයුතු කරන සමාගම්, අයකර ගන්නා වාරික ජාතික රක්ෂණ භාර අරමුදලට බැර කළ යුතුය.

2007 අංක 27 දරණ සංශෝධන පනත අනුව සියළු ලියාපදිංචි රක්ෂණ සමාගම් සාමාන්‍ය රක්ෂණ කටයුතු සඳහා වන ප්‍රතිරක්ෂණ වගකීමෙන් 50% නොඉක්මවන ප්‍රතිශතයක් ජාතික රක්ෂණ භාර අරමුදලට ලබා දිය යුතුය. මේ සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සියලු රක්ෂණ සමාගම් වෙත නියෝගයක් පනවමින්, 2013 ජනවාරි මස 01 වන දින සිට, සියළුම වර්ගයේ ප්‍රති රක්ෂණ සම්මුතීන් සහ වෛල්පික ප්‍රතිරක්ෂණ සැලසුම් සඳහා 30% ක් ජාතික රක්ෂණ භාර අරමුදලට දායක කළ යුතු බවට දක්වා ඇත. මීට පෙර මෙම ප්‍රතිශතය 20%ක් විය.

### අනෙකුත් අදාල කරුණු

### මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව (NCRS)

මෝටර් රථවාහන පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව නම් වූ ආයතනය ප්‍රවාහන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතී. මෝටර් රථවාහන රක්ෂණ ආවරන ලබාදෙන රක්ෂකයින් සෑම කෙනෙකුම තෙවන පාර්ශ්වික රක්ෂණ වාරිකයකින් 1% ක් මාර්ග ආරක්ෂක අරමුදලට දායක කළ යුතුය. මෙම ජාතික සභාවේ පාලක සභාවෙහිද රක්ෂණ මණ්ඩලයට නියෝජනයක් ඇත.

### අන්තර් නියාමන ආයතන සභාව (IRIC)

අන්තර් නියාමන ආයතන සභාව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිහිටුවන ලද්දකි. ඉහළ මට්ටමේ කමිටුවක් වන මෙහි ප්‍රධානත්වය ශ්‍රී ලංකා මහා බැංකුවේ අධිපතිවරයා විසින් උසුලනු ලබන අතර මෙය පිහිටුවීමේ අරමුණ වූයේ මූල්‍ය වෙළඳපොළෙහි ක්‍රමානුකූල වර්ධනය සඳහා අවශ්‍ය නිසි ප්‍රතිපත්ති සම්පාදනය හා සමස්ථ මූල්‍ය පද්ධතියේම අභිවෘද්ධිය උදෙසා සියළු නියාමන නියෝජිතයන් සම්බන්ධීකරණය කරමින් තොරතුරු හුවමාරු කර ගැනීමයි. රක්ෂණ මණ්ඩලය අන්තර් නියාමන ආයතන සභාවේද නියොජනය වෙයි.

### ශ්‍රී ලංකා රක්ෂණ සංගමය (IASL)

1989 දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ සාමාජිකත්වය පනත යටතේ ලියාපදිංචිය ලබා ඇති සෑම රක්ෂණ සමාගමකටම ලබා ගත හැක. ජාතික රක්ෂණ භාර අරමුදල් හැර අනෙක් සියළු රක්ෂණ සමාගම් මෙම සංගමයේ සාමාජිකයෝය.

සියළුම රක්ෂණ සමාගම් හි ප්‍රධාන විධායක නිලධාරීන්ගෙන් සමන්විත විධායක කමිටුව සමස්ථ කළමනාකරණය පිළිබඳ වගකීම් දරයි.

- ජීවිත රක්ෂණ සංසදය
- සාමාන්‍ය රක්ෂණ සංසදය
- මූල්‍ය තාක්ෂණ අනු කමිටුව
- නීති උපදේශන සංසදය
- මානව සම්පත් අනු කමිටුව
- තොරතුරු තාක්ෂණය පිළිබඳ අනු කමිටුව
- අලෙවිකරණය හා විකිණුම් සංසදය

යන කමිටු විසින් විධායක කමිටුවට සහය වෙමින් ස්වකීය වගකීම් හා අදාල වන්නාවූ විෂය ක්ෂේත්‍ර පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කෙරේ.

### සංගමයේ ප්‍රධාන අරමුණු:-

1. රක්ෂණය වන ජනතාව හා රක්ෂකයන්ගේ පොදු යහපත හා සුබසාධනය උදෙසා උපදෙස් සැපයීමටත්, සහයෝගීතාවටත් අවස්ථාව සලසනු වස් ශ්‍රී ලංකාව තුළ රක්ෂණය ව්‍යාපාරයෙහි නිරතව සිටින සියළු රක්ෂකයින් එකමුතු කිරීම.
2. රක්ෂණ ව්‍යාපාරය තුළ ඒකාකාරී යහපත් ක්‍රියා පිළිවෙළිවෙතක් හා උසස් සදාචාරාත්මක මට්ටමක් පවත්වා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම මගින් රක්ෂණ ව්‍යාපාරය පිළිබඳව රක්ෂණය වන ජනතාවගේ විශ්වාසය වර්ධනය කිරීම.
3. සාමාන්‍ය ජනතාව අතර රක්ෂණයේ අවශ්‍යතා හා වටිනාකම් පිළිබඳ දැනුවත්භාවය ගොඩනැගීම.
4. ව්‍යවස්ථාදායක සහ නියාමන අවශ්‍යතා නිරීක්ෂණය තුළින් රක්ෂණ කර්මාන්තයේ ස්ථායිථාවය හා වර්ධනය සඳහා අදාල බලධාරීන් වෙත කරුණු ඉදිරිපත් කිරීම.
5. වෙනත් රටවල රක්ෂණ ක්‍රමවේද හා තාක්ෂණික උපක්‍රම පරීක්ෂා කිරීම හා පුනරීක්ෂණය කිරීම මගින් වඩාත් සුදුසු ක්‍රමවේද ශ්‍රී ලංකා වෙළෙඳපොළට යොදා ගැනීම.
6. අධ්‍යාපන හා පුහුණු වැඩමුළු ඔස්සේ රක්ෂණ ක්ෂේත්‍රයේ වෘත්තීයභාවය ප්‍රවර්ධනය දිරිගැන්වීම හා ඊට සක්‍රියව සහායවීම, ඒ සඳහා පන්ති සම්මන්ත්‍රණ, වැඩමුළු, සංවාද, උපදේශන රැස්වීම් පැවැත්වීම.

### ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය (SLIBA)

මණ්ඩලය විසින් අනුමත කරන ලද එකම රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය වන්නේ ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමයයි. පනතේ 79 වන වගන්තිය අනුව රක්ෂණ තැරැව්කාර සමාගමක් ලෙස ක්‍රියා කිරීමට අපේක්ෂා කරන සෑම සමාගමක්ම, මණ්ඩලයේ ලියාපදිංචිය ලැබීමට පෙර මෙම සංගමයේ සාමාජිකත්වය ලබාගැනීම අවශ්‍ය වේ.

සංගමය විසින් සකස් කරනු ලැබූ එහි කටයුතු සඳහා අදාළ නීති මාලාව සාමාජික සමාගම් විසින් පිළිපදිනු ලැබිය යුතු වන්නේය.

### ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමයේ ප්‍රධාන අරමුණු

රක්ෂණ තැරැව්කරුවන්ගේ කාර්යභාරය පිළිබඳ මහජනතාව තුළ දැනුවත්භාවයක් ඇති කිරීම.

සාමාජිකයින් අතර තාක්ෂණික දැනුම වැඩි කිරීම හා ඉහළ මට්ටමක නිපුණතාවයක් සහ වෘත්තීය භාවයක් ගොඩනැගීම.

රක්ෂණ පාඨමාලාවන් හැදෑරීම සහ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමට සාමාජිකයින්ව දිරිමත් කිරීම හා සහයෝගය ලබාදීම.

# පොදු සමාලෝචනය

නියාමකයන්, රක්ෂකයින් සහ මහජනතාව සමඟින් හොඳ හිත සහ හිතකර සබඳතාවයන් පවත්වා ගැනීම.

### ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (SLII)

1982 වසරේ දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය ලාභ නොලබන සංවිධානයක් වන අතර එහි ප්‍රධාන අරමුණ වන්නේ රක්ෂණ ව්‍යාපාරයෙහි නියුක්ත වන්නන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීමයි. ආයතනය අරමුදල් සපයා ගන්නේ රක්ෂණ සමාගම්වලින් පිරිනැමෙන දායකත්ව තුළින් හා සාමාජිකයන්ගේ වාර්ෂික සාමාජික මුදල්වලිනි.

### ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ ප්‍රධාන අරමුණු

රක්ෂණය ක්ෂේත්‍රයේ නියුතු අයගේ පොදු සංවර්ධනය, ප්‍රගතිය හා කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය මධ්‍යම සංවිධානයක් ලෙස කටයුතු කිරීම හා ඔවුන්ගේ යහපත පිණිස මෙන්ම රක්ෂණ ව්‍යාපාරය වඩාත් කාර්යක්ෂම කිරීම හා කර්මාන්තය පිළිබඳව වෘත්තිකත්වය ලබා දීම.

රක්ෂණ පිළිබඳ වෘත්තීය සුදුසුකම් වර්ධනය කරවීමට ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම තුළින් රක්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කිරීම. ඕනෑම පිළිගත් අධ්‍යාපන ආයතනයක් හරහා රක්ෂණ ක්ෂේත්‍රයේ ඕනෑම අංශයක විෂයයන් වෘත්තීය මට්ටමින් හැදෑරීම සඳහා සහාය දැක්වීමටත්, උනන්දු කිරීමටත් විභාග පැවැත්වීම.

වෘත්තීය කරුණු පිළිබඳව සාකච්ඡා සම්මන්ත්‍රණ හෝ රැස්වීම් පැවැත්වීමටත්, පර්යේෂණ පත්‍රිකා, දේශන ආදිය ඉදිරිපත් කිරීමටත් සාමාජිකයින්ට වැදගත් වන්නා වූ සිදුවීම් වාර්තා හෝ ලැයිස්තු වැනි දෑ සංස්කරණයටත් ඉඩ සැලසීම.

ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ සාමාජිකයින්ගේ අයිතිවාසිකම් සහ සුභසාධනය ආරක්ෂා කිරීමටත් ඔවුන්ගේ ප්‍රවර්ධනය පුළුල් කිරීමට මෙන්ම පොදුවේ ගත්කළ රක්ෂණ නිලධාරීන්ගේත්, ආයතනික සාමාජිකයින්ගේත් තත්ත්වයන් ඉහළ නැංවීම උදෙසා අවශ්‍ය වෘත්තීමය අධීක්ෂණය හා පාලනය ඇති කිරීම.

මෙම ආයතනය ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනයට අනුබද්ධව ඇති අතර ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනය, ඉන්දියාවේ රක්ෂණ ආයතනය සහ ඉන්දියාවේ ජීවගණක සංගමය වැනි වෘත්තීය අයාතනවල විභාග ද මෙහෙයවනු ලබයි. රක්ෂණ කර්මාන්තයෙහි නියැලෙන්නන් සඳහා සංගමය විසින් කෙටිකාලීන රක්ෂණ ඩිප්ලෝමා පාඨමාලා ද පවත්වනු ලැබේ.

රක්ෂණ නියෝජිතයින් ලෙස කටයුතු කිරීමට කැමැත්තක් දක්වන අය සඳහා පූර්ව බඳවා ගැනීම් පරීක්ෂණ සිදු කිරීමේ වගකීම මණ්ඩලය විසින් මෙම ආයතනයට පවරා ඇත. රක්ෂණ ක්ෂේත්‍රයෙහි සාමාන්‍ය හා දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර පන්ති දෙවර්ගය සඳහාම ආයතනය විසින් පූර්ව බඳවා ගැනීමේ පරීක්ෂණ පවත්වනු ලැබේ.

### රක්ෂණ අධීක්ෂකයින්ගේ ජාත්‍යන්තර සංගමය (IAIS)

රක්ෂණ අධීක්ෂකයින්ගේ ජාත්‍යන්තර සංගමයේ සාමාජිකයකු වශයෙන්, ඔවුන් විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශන මෙන්ම ප්‍රධාන රක්ෂණ ක්‍රියා පිළිවෙත් සහ සංගමයේ ක්‍රියාකාරකම් ආදිය පිළිබඳ තොරතුරු ද නිතිපතා මණ්ඩලයට ලැබේ. එම සංගමය විසින් නිර්දේශ කරනු ලබන සමහර ප්‍රධාන රක්ෂණ ක්‍රම පිළිවෙත්, ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය ඵලදායී ලෙස අධීක්ෂණය කරනු හා මෙහෙයවනු පිණිස මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

# සංඛ්‍යානමය සමාලෝචනය

## රක්ෂණ කර්මාන්තය පිළිබඳ දළ විශ්ලේෂණය

### රක්ෂණ කර්මාන්තයේ සමස්ත කාර්යසාධනය

2012 වසර ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තයට තවත් සුභදායී වසරක් විය. 2012 වසර තුළ දී දීර්ඝකාලීන සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර අංශ දෙකෙහිම දළ ලිඛිත වාරික ආදායමේ වර්ධනයක් වාර්තා විය. 1 වන වගුවෙහි නිරූපණය වන ආකාරයට 2012 වසර තුළ දී රක්ෂණ කර්මාන්තය වාර්තා කළ මුළු දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 87,152 ක් විය. (2011 ඃ රුපියල් මිලියන 78,491). මෙය පසුගිය වසරට සාපේක්ෂව 11.03% ක වර්ධන අනුපාතයකි. 2011 වසරට සාපේක්ෂව අඩු වේගයකින් වර්ධනය වූවද, 2012 වසරේ වාරික ආදායමේ වැඩිවීමට ඉවහල් වූයේ සාර්ව ආර්ථික තත්ත්වයන්ගේ සමස්ත වර්ධනයත්, වැය කළ හැකි ආදායමේ ඉහළයාමත්, සාමාන්‍ය ජනතාව අතර රක්ෂණ නිපැයුම් පිළිබඳව ඇති දැනුම සහ අවබෝධය වඩාත් දියුණුවීමත්ය. මෙම සාධකයන් දීර්ඝකාලීන සහ සාමාන්‍ය රක්ෂණ නිපැයුම් සඳහා ඇති ඉල්ලුම තීව්‍ර කිරීමට ඉවහල් විය. 2012 වසරේ පැවති නියඟය සහ ගංවතුර වැනි අයහපත් කාලගුණික තත්ත්වයන් දිවයිනේ කෘෂිකාර්මික නිෂ්පාදන කෙරෙහි අයහපත් බලපෑම් ඇති කළ අතර යුරෝ ආර්ථික කලාපය තුළ පවත්නා වූ අර්බුදකාරී තත්ත්වය නිසාත්, ඉරානය මත පැන වූ සම්බාධක නිසාත් 2012 වසර තුළ දී ගෝලීය ආර්ථිකය අභියෝගාත්මක විය. එනමුත් මෙම සියළු අභියෝගයන් හමුවේ ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය 2012 වසර තුළ දී වර්ධනය විය.

දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයෙන් ඉපැයූ දළ ලිඛිත වාරික ආදායම 2012 වසර තුළ දී රුපියල් මිලියන 37,469 ක් වූ අතර (2011 ඃ රුපියල් මිලියන 35,162) එය 2011 වසර සමඟ සැසඳීමේ දී 6.56% ක වර්ධන අනුපාතයකි. 2012 වසර තුළ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙන් ඉපැයූ දළ ලිඛිත ආදායම රුපියල් මිලියන 49,683 ක් වූ අතර (2011 ඃ රුපියල් මිලියන 43,329) 2011 වසරට සාපේක්ෂව 14.67% ක සුවිශේෂී වර්ධන අනුපාතයක් විය. 2012 වසර තුළ දී දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය සමස්ත දළ ලිඛිත වාරික ආදායමෙන් 42.99% ක් (2011 ඃ 44.8%) හිමි කරගත් අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය 57.01% ක් (2011 ඃ 55.20%) හිමි කර ගන්නා ලදී. රක්ෂණ සමාගම් විසින් තහවුරු කළ පරිදි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය වෙනුවෙන් වූ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය සඳහා වූ වාරික ආදායම 2012 වසර තුළ දී රුපියල් මිලියන 2,250 ක (2011 ඃ රුපියල් මිලියන 1,950) අගයක් වාර්තා කරන ලදී. එම නිසා වර්ජන කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය සඳහා වූ වාරික ආදායම ඇතුළුව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙන් ඉපැයූ මුළු දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 51,933 (2011 ඃ රුපියල් මිලියන 45,279) ක් විය.

රක්ෂණ ඝනත්වය මඟින් ඒක පුද්ගල වාරික ආදායම නිරූපනය වන අතර 2012 වසර තුළ වාර්තා වූ රක්ෂණ ඝනත්වය රුපියල් 4,287.28 ක් විය. (2011 ඃ රුපියල් 3,761.11) මෙය 13.99% ක වර්ධනයක් වූ අතර මෙයට 2012 වසර තුළ ඉහළ ගිය වාරික ආදායමත්, මධ්‍ය වාර්ෂික ජනගහනයේ සිදු වූ සුළු අඩුවීමත් හේතු සාධක විය. සමස්ත වාරික ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගණනය කළ විට ව්‍යාප්තිය 2012 වසරේ දී 1.15% ක් විය. කෙසේ වූවද මෙය 2011 වසරේ වාර්තා වූ 1.20% ට සාපේක්ෂව අඩුවීමකි. දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට එය 2012 වසරේ දී 0.49% (2011 ඃ 0.54%) ක් වූ අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සඳහා එය 0.66% (2012 ඃ 0.66%) ක් විය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ වාරික ආදායමේ ව්‍යාප්තිය 2011 වසරට සාපේක්ෂව පසුබෑමක් දක්වන අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සඳහා 2011 වසරට සමාන අගයකින් පවත්වාගෙන යාමට හැකි වී තිබේ. 2012 වසර තුළ වාර්තා වූ දළ ලිඛිත වාරික ආදායමේ අඩු වර්ධන අනුපාතයත්, දළ දේශීය නිෂ්පාදිතයේ ඉහළ වර්ධන වේගයත් මෙයට හේතු සාධක වී ඇත.

### වගුව 1

***වාරික ආදායම සහ ව්‍යාප්තිය***

| | 2008 | 2009 | 2010 | 2011(අ) | 2012(ආ) |
|---|---|---|---|---|---|
| දීර්ඝකාලීන රක්ෂණය (රුපියල් මිලියන) | 23,613 | 24,005 | 31,152 | 35,162 | 37,469 |
| සාමාන්‍ය රක්ෂණය (රුපියල් මිලියන) | 34,558 | 33,548 | 35,101 | 43,329 | 49,683 |
| මුළු වාරික ආදායම (රුපියල් මිලියන) | 58,171 | 57,553 | 66,253 | 78,491 | 87,152 |
| මුළු වාරික ආදායම් වර්ධන අනුපාතය (%) | 12.10 | (1.06) | 15.12 | 18.47 | 11.03 |
| දළ දේශීය නිෂ්පාදිතය (රුපියල් බිලියන)* | 4,411 | 4,835 | 5,604 | 6,544 | 7,582 |
| දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන අනුපාතය (%)* | 6.0 | 3.5 | 8.0 | 8.2 | 6.4 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ව්‍යාප්තිය - මුළු වාරික ආදායම | 1.32 | 1.19 | 1.18 | 1.20 | 1.15 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ව්‍යාප්තිය - දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය | 0.54 | 0.50 | 0.56 | 0.54 | 0.49 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ව්‍යාප්තිය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය | 0.78 | 0.69 | 0.63 | 0.66 | 0.66 |
| රක්ෂණ ඝනත්වය - (මුළු වාරික ආදායම / ජනගහනය) (රුපියල්) | 2,877.33 | 2,814.33 | 3,207.91 | 3,761.11 | 4,287.28 |
| මධ්‍ය වාර්ෂික ජනගහනය ('000)* | 20,217 | 20,450 | 20,653 | 20,869 | 20,328 |

** මූලාශ්‍රය ඃ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව - 2012*

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*

*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන්:*

1. *2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය (SRCC & T) වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුළත් කර නොමැත.*
3. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම සෙලින්කෝ තකාෆුල් සමාගම වෙත 2009 අගෝස්තු 5 වැනි දින සිට තහනම් කරනු ලැබීය. 2010 වසරේ සිට විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් මණ්ඩලය වෙත යොමු කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

### රක්ෂණ සමාගම් සතු වත්කම්

පෙර වසරවල පරිදිම රක්ෂණ සමාගම් සතු මුළු වත්කම් 2012 වසර තුළ දී ද වර්ධනය විය. 2012 දෙසැම්බර් මස 31 වන දින රක්ෂණ සමාගම් විසින් වාර්තා කරන ලද මුළු වත්කම්වල අගය රුපියල් මිලියන 301,917 ක් විය. (2011 ෑ රුපියල් මිලියන 261,412). මෙය පසුගිය වසරට සාපේක්ෂව 15.49% ක වැඩිවීමකි. 2 වන වගුවේ දැක්වෙන පරිදි සුවිශේෂී කරුණක් වන්නේ රක්ෂණ සමාගම් සතු මුළු වත්කම් ප්‍රමාණය පසුගිය වසර පහ ඇතුළත ආසන්න වශයෙන් දෙගුණයක් වී ඇති බවයි.

**වගුව 2**
***රක්ෂණ සමාගම් සතු වත්කම්***

| | 2008 | 2009 | 2010 | 2011(අ) | 2012(ආ) |
|---|---|---|---|---|---|
| දීර්ඝකාලීන රක්ෂණය (රුපියල් මිලියන) | 97,730 | 118,305 | 139,647 | 165,519 | 182,826 |
| සාමාන්‍ය රක්ෂණය සහ කොටස් හිමියන් (රුපියල් මිලියන) | 58,263 | 62,740 | 82,450 | 100,192 | 124,209 |
| **එකතුව** | **155,993** | **181,045** | ***219,102** | ***261,412** | ***301,917** |

**3 වන වගුවට අනුකූලව සංයුක්ත රක්ෂණ සමාගම්වල අන්තර් කොටස් ගනුදෙනු (දීර්ඝකාලීන හා සාමාන්‍ය) ඉවත් කර ඇත.*

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන්:*
1. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුළත් කර නොමැත.*
2. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම සෙලින්කෝ තකාෆුල් සමාගම වෙත 2009 අගෝස්තු 5 වැනි දින සිට තහනම් කරනු ලැබීය. 2010 වසරේ සිට විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් මණ්ඩලය වෙත යොමු කර නොමැත.*
3. *අලියාන්ස්-ජීවිත, ආර්පිකෝ සහ එල්අයිසී හි කොටස් හිමියන්ට අයත් වත්කම් දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර යටතේ වාර්තා කර ඇත.*

### වත්කම්වල ව්‍යාප්තිය

3 වන වගුව මඟින් රක්ෂණ සමාගම් අතර දීර්ඝකාලීන සහ සාමාන්‍ය රක්ෂණය/ කොටස් හිමියන් අතර 2012 දෙසැම්බර් 31 වන දින වත්කම් ව්‍යාප්ත වී ඇති ආකාරය විශ්ලේෂණය කරනු ලැබේ.

2012 දෙසැම්බර් 31 දින රක්ෂණ සමාගම් සතු සමස්ත වත්කම් ප්‍රමාණය, රුපියල් මිලියන 5,118 ක් වූ අන්තර් කොටස් වත්කම් ඉවත් කිරීමෙන් පසු රුපියල් මිලියන 301,917 (2011 ෑ රුපියල් මිලියන 261,412) ක් විය. එස්එල්අයිසී විසින් රුපියල් මිලියන 120,143 ක් (2011 ෑ රුපියල් මිලියන 102,179) වටිනා වත්කම් වාර්තා කිරීම තුළින් සමස්ත වත්කම්වලින් 39.79% ක් හිමි කරගත් අතර 2011 වසරේ දී පරිදිම රක්ෂණ සමාගම් අතර විශාලතම වත්කම් හිමිකරුවා බවට පත් විය. සෙලින්කෝ සහ ඒඅයිඒ පිළිවෙළින් දෙවන සහ තෙවන විශාලතම වත්කම් හිමිකරුවන් බවට පත් වුයේ රුපියල් මිලියන 66,953 (22.18%) ක් සහ රුපියල් මිලියන 40,047 (13.56)% ක් වාර්තා කිරීම තුළිනි. යූනියන් සහ ජනශක්ති වෙත සමස්ත වත්කම්වලින් පිළිවෙළින් 8.50% ක් සහ 5.25% ක් හිමි වූ අතර එමඟින් වත්කම් හිමිකාරීත්වය තුළින් හතරවන සහ පස්වන ස්ථාන අත්කර ගන්නා ලදී. මෙහි දී සැලකිල්ලට ගත යුතු වැදගත් කරුණක් වනුයේ සමස්ත වත්කම්වලින් 89.28% (2011 ෑ 89.88) ප්‍රමුඛතම සමාගම් පහ අතර සංකේන්ද්‍රණය වීමත් ඉතිරි 10.72% අනිකුත් සමාගම් පහළව සතුවීමත්ය.

# සංඛ්‍යානමය සමාලෝචනය


## වගුව 3
### *රක්ෂණ සමාගම් අනුව වත්කම් විශ්ලේෂණය*

| රක්ෂකයා | වත්කම්වල ව්‍යාප්තිය 2011(අ) දීර්ඝකාලීන රක්ෂණය (රුපියල් '000) | සාමාන්‍ය රක්ෂණය කොටස් හිමියන් (රුපියල් '000) | අන්තර් අංශ ගනුදෙනු ඉවත් කිරීම (රුපියල් '000) | එකතුව (රුපියල් '000) | % | 2012(ආ) දීර්ඝකාලීන රක්ෂණය (රුපියල් '000) | සාමාන්‍ය රක්ෂණය/ කොටස් හිමියන් (රුපියල් '000) | අන්තර් අංශ ගනුදෙනු ඉවත් කිරීම (රුපියල් '000) | එකතුව (රුපියල් '000) | % |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඒඅයිඒ | 30,037,867 | 7,073,863 | - | 37,111,730 | 14.20 | 33,250,987 | 7,695,830 | 189 | 40,946,628 | 13.56 |
| ඒඅයිජී | - | 888,565 | - | 888,565 | 0.34 | - | 877,850 | - | 877,850 | 0.29 |
| අලියාන්ස්-සාමාන්‍ය | - | 1,799,715 | - | 1,799,715 | 0.69 | - | 2,042,415 | - | 2,042,415 | 0.68 |
| අලියාන්ස්-ජීවිත | 486,094 | - | - | 486,094 | 0.19 | 621,508 | - | - | 621,508 | 0.21 |
| අමානා තකාෆුල් | 555,382 | 1,431,698 | 55,823 | 1,931,257 | 0.74 | 778,592 | 1,421,675 | 62,580 | 2,137,687 | 0.71 |
| ආර්පිකෝ | 515,131 | - | - | 515,131 | 0.20 | 561,970 | - | - | 561,970 | 0.19 |
| ඒෂියන් ඒලායන්ස් | 2,353,009 | 2,365,947 | - | 4,718,956 | 1.81 | 3,396,594 | 2,309,537 | - | 5,706,131 | 1.89 |
| සෙලින්කෝ | 44,670,240 | 19,519,196 | 3,255,409 | 60,934,027 | 23.31 | 47,987,326 | 23,133,596 | 4,167,527 | 66,953,395 | 22.18 |
| කොන්ටිනෙන්ටල් | - | 1,230,942 | - | 1,230,942 | 0.47 | - | 1,316,043 | - | 1,316,043 | 0.44 |
| කෝපරේටිව් | 585,041 | 1,398,203 | 11,862 | 1,971,382 | 0.75 | 714,785 | 1,703,521 | 30,655 | 2,387,651 | 0.79 |
| එච්එන්බීඒ | 3,201,601 | 2,843,252 | - | 6,044,853 | 2.31 | 3,875,310 | 3,143,968 | - | 7,019,278 | 2.32 |
| ජනශක්ති | 5,147,108 | 7,825,564 | - | 12,972,672 | 4.96 | 6,263,405 | 9,580,533 | - | 15,843,938 | 5.25 |
| එල්අයිසී | 1,179,054 | - | - | 1,179,054 | 0.45 | 1,441,424 | - | - | 1,441,424 | 0.47 |
| එල්ඕඑල්සී | 64,320 | 598,610 | 13,305 | 649,625 | 0.25 | 125,900 | 1,753,956 | 3,814 | 1,876,042 | 0.62 |
| එම්බීඑස්එල් | 131,684 | 872,558 | - | 1,004,242 | 0.38 | 191,718 | 1,116,643 | - | 1,308,361 | 0.43 |
| ඔරියන්ට් | - | 776,924 | - | 776,924 | 0.30 | - | 928,425 | - | 928,425 | 0.31 |
| පීපල්ස් | - | 2,422,827 | - | 2,422,827 | 0.93 | - | 3,163,419 | - | 3,163,419 | 1.05 |
| සණස | 232,413 | 566,133 | - | 798,546 | 0.31 | 361,629 | 612,633 | - | 974,262 | 0.32 |
| එස්එල්අයිසී | 61,069,553 | 41,608,056 | 498,630 | 102,178,979 | 39.08 | 65,205,480 | 54,937,824 | - | 120,143,304 | 39.79 |
| යූඒඑල් | 15,290,943 | 6,970,169 | 464,977 | 21,796,135 | 8.33 | 18,048,978 | 8,471,496 | 853,645 | 25,666,829 | 8.50 |
| **එකතුව** | **165,519,440** | **100,192,223** | **4,300,007** | **261,411,656** | **100** | **182,825,606** | **124,209,364** | **5,118,410** | **301,916,560** | **100** |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන්:*
1. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුළත් කර නොමැත.*
2. *සංයුක්ත රක්ෂණ සමාගම්වල අනෙකුත් අංශවලින් ලැබිය යුතු ප්‍රමාණයන් (දීර්ඝකාලීන රක්ෂණය හා සාමාන්‍ය රක්ෂණ අංශයන්) අන්තර් අංශ ශේෂවලට ඇතුළත් වේ.*
3. *අලියාන්ස්-ජීවිත, ආර්පිකෝ සහ එල්අයිසී හි කොටස් හිමියන්ට අයත් වත්කම් දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය යටතේ වාර්තා කර ඇත.*
4. *ජනශක්ති සහ ජාතික රක්ෂණ සංස්ථාවේ වත්කම් එක්ව වාර්තා කර ඇත.*
5. *රක්ෂණ කටයුතුවල නියැලීම සෙලින්කෝ තකාෆුල් සමාගම වෙත 2009 අගෝස්තු 5 වැනි දින සිට තහනම් කරනු ලැබ ඇත. 2010 වසරේ සිට විගණනය කළ මූල්‍ය වාර්තා සහ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් මණ්ඩලය වෙත යොමු කර නොමැත.*

## රූප සටහන 1
### *සමාගම් මට්ටමින් සමස්ත වත්කම් සංකේන්ද්‍රගතවීම - 2012 දෙසැම්බර් 31*



# සංඛ්‍යානමය සමාලෝචනය

## රක්ෂණ සමාගම්වල කොටස් හිමියන්ගේ අරමුදල්

4 වන වගුවෙන් නිරූපනය වන පරිදි, රක්ෂණ සමාගම්වල කොටස් හිමියන්ගේ මුළු අරමුදල් 2012 දෙසැම්බර් 31 දින වන විට රුපියල් මිලියන 68,832 ක් දක්වා ඉහළ ගියේය. මෙය 2011 දෙසැම්බර් 31 දින වාර්තා කළ රුපියල් මිලියන 51,973 ට සාපේක්ෂව 32.44% ක සුවිශේෂී වර්ධනයකි.

2012 දෙසැම්බර් 31 දින වාර්තා වූ කොටස් හිමියන්ගේ අරමුදල් තුළ රුපියල් මිලියන 20,231 ක් වූ කොටස් ප්‍රාග්ධනය ද රුපියල් මිලියන 48,602 ක් වූ සංචිත ද ඇතුළත් විය. 2012 දෙසැම්බර් 31 පැවති සමස්ත කොටස් හිමියන්ගේ අරමුදල්වලින් අඩකටත් වඩා හිමිකම් දැරුවේ එස්එල්අයිසී විසිනි. ඔවුන් විසින් 2012 දෙසැම්බර් 31 දින සමස්ත කොටස් හිමියන්ගේ අරමුදල් වලින් 53.47% ක් වාර්තා කළ අතර එය 2011 දී වාර්තා කළ 47.59% හා සැසඳීමේ දී සැලකිය යුතු වර්ධනයකි. සෙලින්කෝ සහ යූඒඑල් සමස්ති කොටස් හිමියන්ගේ අරමුදල්වලින් පිළිවෙළින් 14.53% ක් සහ 5.91% ක් හිමි කර ගනිමින් දෙවන හා තෙවන ස්ථානවලට පත් විය. ඒඅයිඒ සහ ජනශක්ති විසින් සමස්ත කොටස් හිමියන්ගේ අරමුදල්වලින් 5.84% ක් සහ 4.91% ක් හිමි කර ගත් අතර මෙම සමාගම් පහ එක්ව සියළු රක්ෂණ සමාගම් සතු සමස්ත කොටස් හිමියන්ගේ අරමුදල්වලින් 84.66% ක් (2011 ඃ 82.28%)

### වගුව 4

### රක්ෂණ සමාගම්වල කොටස් හිමියන්ගේ මුළු අරමුදල්

| රක්ෂකයා | 2011 (අ) | | 2012 (ආ) | | | |
|---|---|---|---|---|---|---|
| | කොටස් හිමියන්ගේ මුළු අරමුදල් (රුපියල් '000) | % | කොටස් ප්‍රාග්ධනය (රුපියල් '000) | මුළු සංචිත (රුපියල් '000) | කොටස් හිමියන්ගේ මුළු අරමුදල් (රුපියල් '000) | % |
| ඒඅයිඒ | 3,547,019 | 6.82 | 300,000 | 3,717,462 | 4,017,462 | 5.84 |
| ඒඅයිජී | 233,964 | 0.45 | 536,265 | (306,926) | 229,339 | 0.33 |
| අලියාන්ස්-සාමාන්‍ය | 680,780 | 1.31 | 250,000 | 545,430 | 795,430 | 1.16 |
| අලියාන්ස්-ජීවිත | 222,543 | 0.43 | 492,499 | (337,624) | 154,874 | 0.23 |
| අමානා තකාෆුල් | 775,144 | 1.49 | 1,250,001 | (429,266) | 820,735 | 1.19 |
| ආර්පිකෝ | 511,703 | 0.98 | 503,000 | (34,004) | 468,996 | 0.68 |
| ඒෂියන් එලායන්ස් | 1,245,631 | 2.40 | 1,062,500 | 362,451 | 1,424,951 | 2.07 |
| සෙලින්කෝ | 8,524,906 | 16.40 | 1,424,822 | 8,579,237 | 10,004,059 | 14.53 |
| කොන්ටිනෙන්ටල් | 454,866 | 0.88 | 500,000 | 6,953 | 506,953 | 0.74 |
| කෝපරේටිව් | 722,319 | 1.39 | 561,527 | 274,622 | 836,149 | 1.21 |
| එච්එන්බීඒ | 1,615,932 | 3.11 | 1,171,875 | 696,406 | 1,868,281 | 2.71 |
| ජනශක්ති | 2,975,041 | 5.72 | 1,496,000 | 1,880,380 | 3,376,380 | 4.91 |
| එල්අයිසී | 408,343 | 0.79 | 500,000 | 38,001 | 538,001 | 0.78 |
| එල්ඕඑල්සී | 237,695 | 0.46 | 600,000 | (21,853) | 578,147 | 0.84 |
| එම්බීඑස්එල් | 395,350 | 0.76 | 779,487 | (375,211) | 404,276 | 0.59 |
| ඔරියන්ට් | 733,739 | 1.41 | 750,000 | (76,439) | 673,561 | 0.98 |
| පීපල්ස් | 594,534 | 1.14 | 600,000 | 263,002 | 863,002 | 1.25 |
| සණස | 369,956 | 0.71 | 332,686 | 69,489 | 402,175 | 0.58 |
| එස්එල්අයිසී | 24,734,068 | 47.59 | 6,000,000 | 30,805,018 | 36,805,018 | 53.47 |
| යූඒඑල් | 2,989,668 | 5.75 | 1,119,873 | 2,944,804 | 4,064,677 | 5.91 |
| **එකතුව** | **51,973,202** | **100** | **20,230,534** | **48,601,931** | **68,832,465** | **100** |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන්:*

1. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුළත් කර නොමැත.*
2. *රක්ෂණ කටයුතු වල නියැලීම සෙලින්කෝ තකාෆුල් සමාගම වෙත 2009 අගෝස්තු 5 වැනි දින සිට තහනම් කරනු ලැබ ඇත. 2010 වසරේ සිට විගණනය කළ මූල්‍ය වාර්තා සහ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් මණ්ඩලය වෙත යොමු කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

හිමි කර ගන්නා ලදී.

**ප්‍රධාන මූල්‍ය අංශ අතර මුළු වත්කම් බෙදී යාම**

5 වන වගුවෙන් නිරූපනය වන අකාරයට ආර්ථිකයේ ප්‍රධාන මූල්‍ය අංශ සතු මුළු වත්කම් 2012 දෙසැම්බර් 31 වන දින රුපියල් බිලියන 9,032.9 ක් වූ අතර එය 2011 දෙසැම්බර් 31 දින වාර්තා කළ රුපියල් බිලියන 7,708.3 හා සැසඳීමේ දී 17.18% ක වර්ධනයකි. රුපියල් බිලියන 6,381.4 ක් හිමි වූ බැංකු අංශය සමස්ත වත්කම්වලින් 70.6% කට හිමිකම් පෑවේය. ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන සහ අනෙකුත් විශේෂිත මූල්‍ය ආයතන මුළු වත්කම්වලින් පිළිවෙළින් 16% ක් සහ 6.9% ක් හිමි කර ගනු ලැබිණි. 2012 දෙසැම්බර් 31 දින රුපියල් බිලියන 301.9 ක් හිමි කර ගනිමින් රක්ෂණ අංශය සමස්ත වත්කම්වලින් 3.3% ක් හිමි කර ගත් අතර මෙය 2011 වසරේ වාර්තා කළ 3.4% හා සැසඳීමේ දී ඉතා කුඩා අඩුවීමකි. මෙහි දී දැකිය හැකි වැදගත් කරුණක් වන්නේ බැංකු අංශය සතු වත්කම් පංගුව 2008 වසරේ සිට 2012 වසර දක්වා වසරින් වසර අඛණ්ඩව වර්ධනය වී ඇති බවයි. තැන්පතු භාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන සතු වත්කම් ද 2010 සිට 2012 දක්වා අඛණ්ඩව වර්ධනය වී ඇත. 2 වන රූප සටහන මඟින් ප්‍රධාන මූල්‍ය අංශ අතර වත්කම් බෙදීයාම නිරූපණය කෙරේ.

**වගුව 5**

**ප්‍රධාන මූල්‍ය අංශ අතර මුළු වත්කම් බෙදී යාම**


| මූල්‍ය අංශ | වත්කම් බෙදීයාම | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2008 | | 2009 | | 2010 | | 2011(අ) | | 2012(ආ) | |
| | රුපියල් බිලියන | % | රුපියල් බිලියන | % | රුපියල් බිලියන | % | රුපියල් බිලියන | % | රුපියල් බිලියන | % |
| බැංකු අංශය | 3,294.6 | 68.1 | 3,832.0 | 68.2 | 4,527.3 | 68.9 | 5,375.6 | 69.7 | 6,381.4 | 70.6 |
| තැන්පතු භාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන | 285.9 | 5.9 | 315.1 | 5.6 | 295.0 | 4.5 | 427.1 | 5.5 | 621.2 | 6.9 |
| අනෙකුත් විශේෂිත මූල්‍ය ආයතන | 239.7 | 5.0 | 265.3 | 4.7 | 354.3 | 5.4 | 338.8 | 4.4 | 282.8 | 3.1 |
| ගිවිසුම්ගත ඉතිරි කිරීම් ආයතන | 863.8 | 17.8 | 1,022.6 | 18.3 | 1,178.7 | 17.9 | 1,305.4 | 16.9 | 1,445.6 | 16.0 |
| රක්ෂණ සමාගම් | 156.0 | 3.2 | 181.0 | 3.2 | 219.10 | 3.3 | 261.4(අ) | 3.4 | 301.9(ආ) | 3.3 |
| **එකතුව** | **4,840.0** | **100** | **5,616.0** | **100** | **6,574.4** | **100** | **7,708.3** | **100** | **9,032.9** | **100** |

*මූලාශ්‍රය :*
*ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව - 2012 (රක්ෂණ සමාගම් සහ ගිවිසුම් ගත ඉතිරි කිරීම් ආයතනවල වත්කම් මණ්ඩලයට යොමු කළ දත්තවලට අනුකූලව පුනර්යුක්ත කර ඇත.)*

*(අ) ප්‍රතිශ්ධාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

**රූප සටහන 2**

**ප්‍රධාන මූල්‍ය අංශ අතර මුළු වත්කම් බෙදීයාම - 2012 දෙසැම්බර් 31**



# සංඛ්‍යානමය සමාලෝචනය

### 2012 දෙසැම්බර් 31 පැවති ශාඛා ජාලය, සේවා දායකයින් සහ නියෝජිතයින්

6 වන වගුවෙන් නිරූපණය වනුයේ 2012 දෙසැම්බර් 31 දින දිවයිනේ පැවති රක්ෂණ සමාගම්වල ශාඛා ජාලය, සේවා දායකයින් සහ නියෝජිතයින් පිළිබඳ තොරතුරු වේ.

2012 දෙසැම්බර් 31 දින සියළුම රක්ෂණ සමාගම් සතුව දිවයින පුරා පැවති ශාඛාවන් සංඛ්‍යාව 1,184 ක් විය. බස්නාහිර පළාත තුළ වැඩිම ශාඛා සංඛ්‍යාව පිහිටා තිබුණු අතර එය ශාඛා 390ක් විය. දකුණු සහ වයඹ පළාත් තුළ පිළිවෙළින් දෙවන සහ තෙවන විශාලතම ශාඛා සංඛ්‍යාව වන ශාඛා 143 ක් සහ 116 ක් ස්ථාන ගත වී තිබිණි. 2012 දෙසැම්බර් 31 ක්‍රියාත්මකව පැවති අවම ශාඛා සංඛ්‍යාව ස්ථානගත වී තිබුණේ නැගෙනහිර පළාත තුළ වන අතර එය ශාඛා 71 ක් විය.

සියළුම රක්ෂණ සමාගම්වල සේවාදායකයින් 12,471 ක් දිවයිනේ පළාත් 9 තුළ සේවයේ නියුක්තව සිටි අතර එයින් සේවාදායකයින් 7,704 ක් ස්ථානගත වි සිටියේ බස්නාහිර පළාත තුළය. මෙය සමස්ථ සේවක සංඛ්‍යාවෙන් 61.77% ක් විය.

දකුණු සහ මධ්‍යම පළාත් දෙවන සහ තුන්වන විශාලතම සේවාදායකයින් සංඛ්‍යාවක් ස්ථානගත කළ පළාත් වූයේ පිළිවෙළින් සේවාදායකයින් 948 ක් සහ 800 ක් ස්ථානගත කිරීමෙනි. අඩුම සේවාදායකයින් සංඛ්‍යාව ස්ථානගත වී සිටියේ නැගෙනහිර පළාතේ වන අතර එය සේවාදායකින් 343 ක් විය. මෙය මුළු සේවාදායකයින්ගෙන් 2.75% ක් විය.

රක්ෂණ සමාගම්වලට අනුයුක්තව සිටි මුළු නියෝජතයන් සංඛ්‍යාව 36,801 ක් වූ අතර එයින් නියෝජිතයන් 14,351 ක් ස්ථානගත වි සිටියේ බස්නාහිර පළාත තුළය. එය සමස්ත නියෝජිතයන්ගෙන් 39% ක් විය. නැගෙනහිර පළාත තුලින් අඩුම නියෝජිත සංඛ්‍යාව වන නියෝජිතයන් 1,916 ක් වාර්තා විය. 6 වන වගුවෙන් නිරූපණය වන සුවිශේෂී සාධකය වනුයේ අනෙකුත් පළාත් හා සැසඳීමේ දී බස්නාහිර පළාත තුළ සංකේන්ද්‍රණය වූ විශාල ශාඛාවන් සංඛ්‍යාව, සේවාදායකයින් සංඛ්‍යාව සහ නියෝජිතයන් සංඛ්‍යාවයි.

9 වන රූප සටහන මඟින් දිවයිනේ පළාත් 9 තුළ 2012 දෙසැම්බර් 31 දින පැවති ශාඛා ජාලය, සේවාදායකයින් සහ නියෝජිතයන් නිරූපණය වෙයි.


### වගුව 6

*2012 දෙසැම්බර් 31 ක්‍රියාත්මක වූ ශාඛා සංඛ්‍යාව, සේවා දායකයින් සහ නියෝජිතයින්*

| පළාත | ශාඛා සංඛ්‍යාව | සේවාදායකයින් සංඛ්‍යාව | නියෝජිතයින් සංඛ්‍යාව |
|---|---|---|---|
| මධ්‍යම පළාත | 112 | 800 | 3,338 |
| නැගෙනහිර පළාත | 71 | 343 | 1,916 |
| උතුරු මැද පළාත | 95 | 540 | 2,363 |
| වයඹ පළාත | 116 | 780 | 3,592 |
| උතුරු පළාත | 83 | 364 | 2,704 |
| සබරගමුව පළාත | 95 | 500 | 2,257 |
| දකුණු පළාත | 143 | 948 | 4,080 |
| ඌව පළාත | 79 | 492 | 2,200 |
| බස්නාහිර පළාත | 390 | 7,704 | 14,351 |
| **එකතුව** | **1,184** | **12,471** | **36,801** |

### රූප සටහන 3

*2012 දෙසැම්බර් 31 පැවති ශාඛා ජාලය, සේවාදායකයින් සහ නියෝජිතයින්*



# සංඛ්‍යානමය සමාලෝචනය

## දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය

### දළ ලිඛිත වාරික ආදායම

2012 වර්ෂය තුළ දී දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 37,469 ක් වූ අතර (2011 ඃ රුපියල් මිලියන 35,162) 6.56% ක වර්ධනයක් දක්නට ලැබිණි. එක් එක් රක්ෂණ සමාගම විසින් පසුගිය වසර පහ තුළ උපයා ඇති දළ ලිඛිත වාරික ආදායම සහ ඊට අදාළ ප්‍රතිශත 7 වන වගුවෙහි දැක්වේ.

සෙලින්කෝ මෙවර ද වෙළඳපොළ ප්‍රමුඛයා බවට පත්ව ඇති අතර එම සමාගම විසින් රුපියල් මිලියන 10,829 ක (2011 ඃ රුපියල් මිලියන 9,816) දළ ලිඛිත වාරික ආදායමක් උපයාගෙන තිබේ. මෙම අගය වෙළඳපොළ සමස්ථ දළ ලිඛිත වාරික ආදායමෙන් ප්‍රතිශතයක් ලෙස 28.9% ක් විය. එස්එල්අයිසී සහ ඒඅයිඒ වෙළඳපොලේ දෙවන සහ තෙවන ස්ථාන හිමිකර ගත් අතර එම සමාගම් දෙක මඟින් උපයාගෙන ඇති දළ ලිඛිත වාරික ආදායම පිළිවෙළින් රුපියල් මිලියන 7,369 ක් (2011 ඃ රුපියල් මිලියන 6,743) සහ රුපියල් මිලියන 6.493 ක් (2011 ඃ රුපියල් මිලියන 7,846) පමණ වේ. මෙම අගයන් සමස්ත ආදායමෙන් ප්‍රතිශතයක් ලෙස 19.67% සහ 17.34% බැගින් වේ.

එස්එල්අයිසී දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ මෙතෙක් කලක් රඳවාගෙන සිටි තෙවන ස්ථානය අභිබවමින් මෙම වසරේදී දෙවන ස්ථානය හිමි කරගත් අතර ඒඅයිඒ සමාගමට තෙවන ස්ථානයට පත්වීමට සිදු විණි. යූඒඑල් සහ ඒෂියන්ස් එලායන්ස් රුපියල් මිලියන 5,106 ක (2011 ඃ රුපියල් මිලියන 4,472) සහ රුපියල් මිලයන 2,034 ක (2011 ඃ රුපියල් මිලියන 1,579) දළ ලිඛිත වාරික ආදායමත් උපයා ගනිමින් සිව්වන සහ පස්වන ස්ථාන අත් කර ගැනීමට සමත් විය. එමෙන්ම ඉහත සමාගම් දෙක 13.63% ක සහ 5.43% ක වෙළඳපොළ පංගු අත් කර ගැනීමට සමත් විය. 2011 වර්ෂයේ පස්වන ස්ථානය ලබා ගැනීමට සමත්ව තිබූ ජනශක්ති හට මෙවර හිමි වූයේ හය වන ස්ථානය වන අතර 5.40% ක වෙළඳපොළ පංගුවක් අත් කර ගෙන තිබේ. ඉහත නම් සඳහන් ප්‍රමුඛ සමාගම් පහ මඟින් දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි සමස්ථ දළ ලිඛිත වාරික ආදායමෙන් 84.97% ක් අත්පත් කරගෙන ඇත.

පහත දක්වා ඇති 4 වන රූප සටහන මඟින් එක් එක් සමාගම අත්පත් කර ගත් වෙළඳපොළ පංගුව ප්‍රතිශතයක් වශයෙන් දක්වා ඇත.

**වගුව 7**

***දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි දළ ලිඛිත වාරික ආදායම සඳහා සමාගම් මට්ටමින් වන වෙළඳපොළ පංගුව***


| රක්ෂකයා | 2008 | | 2009 | | 2010 | | 2011(අ) | | 2012(ආ) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වාරික ආදායම (රුපියල් '000) | වෙළඳපොළ පංගුව (%) | වාරික ආදායම (රුපියල් '000) | වෙළඳපොළ පංගුව (%) | වාරික ආදායම (රුපියල් '000) | වෙළඳපොළ පංගුව (%) | වාරික ආදායම (රුපියල් '000) | වෙළඳපොළ පංගුව (%) | වාරික ආදායම (රුපියල් '000) | වෙළඳපොළ පංගුව (%) |
| ඒඅයිඒ | 4,342,218 | 18.39 | 4,632,490 | 19.30 | 7,783,925 | 24.99 | 7,846,447 | 22.32 | 6,495,863 | 17.34 |
| අලියාන්ස්-ජීවිත | 4,013 | 0.02 | 101,816 | 0.42 | 204,814 | 0.66 | 351,299 | 1.00 | 532,142 | 1.42 |
| අමානා තකාෆුල් | 188,676 | 0.80 | 207,097 | 0.86 | 240,156 | 0.77 | 303,786 | 0.86 | 359,919 | 0.96 |
| ආර්පිකෝ | | - | | - | | - | - | - | 100,280 | 0.27 |
| ඒෂියන් එලායන්ස් | 970,077 | 4.11 | 1,009,031 | 4.20 | 1,242,608 | 3.99 | 1,579,191 | 4.49 | 2,034,084 | 5.43 |
| සෙලින්කෝ | 8,257,279 | 34.97 | 7,522,328 | 31.34 | 8,786,120 | 28.21 | 9,815,943 | 27.91 | 10,829,470 | 28.90 |
| කෝපරේටිව් | 131,004 | 0.55 | 149,401 | 0.62 | 233,540 | 0.75 | 269,579 | 0.77 | 312,056 | 0.83 |
| එච්එන්බීඒ | 914,170 | 3.87 | 984,866 | 4.10 | 1,084,480 | 3.48 | 1,290,367 | 3.67 | 1,500,028 | 4.00 |
| ජනශක්ති | 1,426,160 | 6.05 | 1,431,628 | 5.96 | 1,685,409 | 5.42 | 1,871,986 | 5.32 | 2,025,075 | 5.40 |
| එල්අයිසී | 255,099 | 1.08 | 251,150 | 1.05 | 252,656 | 0.81 | 295,859 | 0.84 | 301,721 | 0.81 |
| එල්ඕඑල්සී | - | - | - | - | - | - | 51,427 | 0.15 | 106,238 | 0.28 |
| එම්බීඑස්එල් | 52,637 | 0.22 | 55,606 | 0.24 | 89,984 | 0.28 | 143,156 | 0.41 | 192,780 | 0.52 |
| සණස | 69,617 | 0.29 | 61,563 | 0.26 | 73,030 | 0.23 | 128,113 | 0.36 | 203,616 | 0.54 |
| එස්එල්අයිසී | 4,497,919 | 19.05 | 4,819,860 | 20.08 | 6,009,859 | 19.29 | 6,743,073 | 19.18 | 7,369,027 | 19.67 |
| යූඒඑල් | 2,503,887 | 10.60 | 2,778,184 | 11.57 | 3,465,505 | 11.12 | 4,471,627 | 12.72 | 5,106,323 | 13.63 |
| **එකතුව** | **23,612,756** | **100** | **24,005,020** | **100** | **31,152,086** | **100** | **35,161,853** | **100** | **37,468,622** | **100** |
| **වර්ධන අනුපාතය (%)** | **14.04** | | **1.66** | | **29.77** | | **12.87** | | **6.56** | |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

# සංඛ්‍යානමය සමාලෝචනය

**රූප සටහන 4**

***දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි 2012 වර්ෂයේදී දළ ලිඛිත වාරික ආදායම සමාගම් මට්ටමින් අත් කරගෙන ඇති වෙළෙඳපොළ කොටස***




### දළ ලිඛිත ආදායම ජනනය කළ ප්‍රමුඛතම සමාගම් පහ පිළිබඳ සමාලෝචනය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

පසුගිය වසර පහ තුළ දී දළ ලිඛිත වාරික ආදායම වැඩියෙන්ම ජනනය කළ ප්‍රමුඛතම සමාගම් පහ පිළිබඳව සාරාංශයක් 5 වන රූප සටහන මඟින් දැක්වේ.

2008 වසර සිට 2011 වසර දක්වා සෙලින්කෝ ආයතනයේ වෙළඳපොළ කොටස ක්‍රමයෙන් අඩුවූවත් 2012 වර්ෂයේ දී මඳ වශයෙන් ඉහළ නංවා ගැනීමට එම ආයතනය සමත්ව තිබේ. එමෙන්ම මෙම වසරේ ද 28.90% ක (2011 ; 27.92%) වෙළඳපොළ පංගුවක් අත් කර ගනිමින් දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රමුඛයා බවට පත්ව ඇත.

එස්එල්අයිසී දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි දෙවන ස්ථානයට පත්ව ඇති අතර පසුගිය වසර පහ තුළ දී එම සමාගම මඟින් සමස්ථ වෙළඳපොළ දළ ලිඛිත වාරික ආදායමෙන් 19% - 20% අතර ප්‍රමාණයන් හිමි කර ගැනීමට සමත් වී ඇත.

ඒඅයිඒ ආයතනය 2010 සහ 2011 වසරවල දී අත්පත් කරගෙන තිබූ වෙළඳපොළ දෙවන ස්ථානය මෙවර අහිමි වූයේ සමාගමේ වෙළඳපොළ පංගුව 22.32% සිට 17.34% දක්වා අඩු වීමෙනි. එමෙන්ම මෙම වසරේ මෙම සමාගම මඟින් අත්පත් කරගෙන ඇති වෙළඳපොල කොටස වන 17.34% 2008 වසරේ සිට මෙතෙක් ලබා ඇති අවම වෙළඳපොළ කොටසයි.


යූඒඑල් 2008 වර්ෂයේ සිට මේ දක්වා වෙළඳපොළ සිව්වන ස්ථානයේ රැඳී සිටින අතර පසුගිය වසර තුන එනම් 2010 වසරේ සිට 2012 වසර දක්වා කාලය තුළ දී සැලකිය යුතු අන්දමින් ඔවුන්ගේ වෙළඳපොළ පංගුව වර්ධනය කරගෙන ඇත. එමෙන්ම 2012 වර්ෂය තුළ දී 13.63% (2011 ; 12.72%) වෙළඳපොළ පංගුවක් අත් කර ගැනීමට සමත් විය.

දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයේ කැපී පෙනෙන වෙනසක් ඇති කරමින් ඒෂියන් එලායන්ස් මෙම වසරේ දී වෙළඳපොළ පස්වැන්නා බවට පත් වී ඇත. මෙමඟින් 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ජනශක්ති ආයතනය වෙළඳපොළේ රඳවාගෙන තිබූ ස්ථානය එම සමාගමට අහිමි විය. එසේ සිදුවූයේ ඒෂියන් එලායන්ස් ඔවුන්ගේ වෙළඳපොළ කොටස වන 5.43% (2011 ; 4.49%) ජනශක්ති රක්ෂණ සමාගම මෙවර අතපත් කරගත් කොටස වන 5.40% ට වඩා ඉහල අගයක් වාර්තා කිරීම නිසාය.

# සංඛ්‍යානමය සමාලෝචනය

## රූප සටහන 5

**ඉහළම දළ ලිඛිත වාරික ආදායමක් උපයා ඇති ප්‍රමුඛතම සමාගම් පහ පිළිබඳ සමාලෝචනය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**




| | සෙලින්කෝ | එස්එල් අයිසී | ඒඅයිඒ | යූඒඑල් | ඒෂියන් එලායන්ස් |
|---|---|---|---|---|---|
| 2008 | 34.97 | 19.05 | 18.39 | 10.60 | 4.11 |
| 2009 | 31.34 | 20.08 | 19.30 | 11.57 | 4.20 |
| 2010 | 28.21 | 19.29 | 24.99 | 11.12 | 3.99 |
| 2011(අ) | 27.91 | 19.18 | 22.32 | 12.72 | 4.49 |
| 2012(ආ) | 28.90 | 19 .67 | 17.34 | 13.63 | 5.43 |


*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

### දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ රක්ෂණ ඔප්පු

හයවන රූප සටහනේ දැක්වෙන ආකාරයට 2012 වර්ෂයේ දී සියළුම රක්ෂණ ආයතන මඟින් රක්ෂණ ඔප්පු 514,472 ක් අලෙවි කර ඇත. (2011 ඃ 526,023). එමෙන්ම 2012 වර්ෂය අවසන් වන විට පැවතියේ රක්ෂණ ඔප්පු 2,461,573 වන අතර 2011 වර්ෂය අවසානයේ වාර්තා කල රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2,355,449 විය. මෙම මූල්‍ය වර්ෂය අවසන් වන විට පැවති බල පවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව රටේ සමස්ථ ජනගහනයෙන් 12.1% පමණ වන අතර 2011 වර්ෂය අවසානයේ දී මෙම අගය 11.30% ලෙස දැක්විණි. ඒ අනුව මෙම අගය 0.8% පමණ ප්‍රතිශතයකින් ඉහළ ගොස් ඇති බව පෙනී යයි. එමෙන්ම බල පවත්නා ජීවිත රක්ෂණ ඔප්පු ප්‍රමාණය රටේ ශ්‍රම බලකායෙන් ප්‍රතිශතයක් ලෙස 29.10% ලෙස දැක්විය හැකි අතර 2011 මෙය 27.50% ලෙස පැවතිනි.

## රූප සටහන 6

**නිකුත් කරන ලද ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව හා බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව**




| | 2008 | 2009 | 2010 | 2011(අ) | 2012 (ආ) |
|---|---|---|---|---|---|
| නිකුත් කරන ලද නව ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව | 567,621 | 468,317 | 516,139 | 526,023 | 514,472 |
| බල පවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව | 2,082,358 | 2,068,548 | 2,214,976 | 2,355,449 | 2,461,573 |
| බල පවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ජනගහනයෙන් ප්‍රතිශතයක් ලෙස | 10.3 | 10.1 | 10.7 | 11.3 | 12.1 |
| බල පවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ශ්‍රම බලකායෙන් ප්‍රතිශතයක් ලෙස | 25.8 | 25.6 | 27.3 | 27.5 | 29.1 |

*මූලාශ්‍රය ඃ මුළු ජනගහනය හා මුළු ශ්‍රම බලකාය (ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව - 2012)*

*(අ) මණ්ඩලයට ඉදිරිපත් කරන ලද ජීවගණක වාර්තාවලට අනුව*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

# සංඛ්‍යානමය සමාලෝචනය

## දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ සමස්ත වත්කම්

විවිධ වත්කම් ප්‍රභේද අනුව දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් සංකේන්ද්‍රගතවීම 7 වන රූප සටහන මඟින් සහ 8 වන වගුවෙන් දැක්වෙයි.

දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජන සමස්ත වත්කම්වල වටිනාකමින් 2012 වර්ෂය අවසන් වන විට රුපියල් මිලියන 97,876 (2011 ෘ රුපියල් මිලියන 84,744) ක් විය. මෙම අගය සමස්ථ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම්වලින් ප්‍රතිශතයක් ලෙස 53.54% (2011 ෘ 51.2%) ලෙස පෙන්නුම් කරයි. මේ අනුව සමස්ත වර්ෂය තුළ දී සියළු ජීවිත රක්ෂණ සමාගම් රාජ්‍ය සුරැකුම්පත්වල අවම ව්‍යවස්ථාපිත ආයෝජනය වන 30% ආයෝජනය කර තිබේද යන වග මණ්ඩලය විසින් සහතික වන ලදී. ඊට අමතරව දිගුකාලීන රක්ෂණ අරමුදලෙහි ශේෂ වත්කම් රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත ප්‍රකාර 2011 මාර්තු 01 දින දරන නිර්ණය කිරීම් අංක 01 අනුව ආයෝජනය කළ යුතු අතර මෙම නිර්නායකය ද 2012 වසර තුළ සියළු රක්ෂණ සමාගම් විසින් සපුරා ඇති බව මණ්ඩලය විසින් පිරික්සන ලදී.

2012 වර්ෂය අවසන් වන විට සමස්ථ දිගුකාලීන ව්‍යාපාරයේ වත්කම්වලින් 17.4% (2011 ෘ 15.61%) එනම්, රුපියල් මිලියන 31,805 (2011 ෘ රුපියල් මිලියන 25,841) බැංකු තැන්පතු මත ආයෝජනය කර ඇති අතර මෙය දෙවන විශාලතම ආයෝජනයයි. සීමිත සමාගම්වල කොටස් ආයෝජනය රුපියල් මිලියන 19,142 (2011 ෘ රුපියල් මිලියන 23,113) වූ අතර මෙය සමස්ත වත්කම් ආයෝජනයෙන් 10.47% (2011 ෘ 13.96%) කි.

රාජ්‍ය සුරැකුම්පත්, බැංකු තැන්පතු සහ සීමිත සමාගම්වල කොටස් ආයෝජනය සමස්ත වත්කම්වලින් 81.41% (2011 ෘ 80.77%) ලෙස දැක්වුණු අතර ශේෂ වත්කම් 18.59% (2011 ෘ 19.23%) ණයකර, ඉඩම් හා ගොඩනැගිලි, ඒකක භාර, රත්රන් ආදියෙහි ආයෝජනය කර ඇත.

**වගුව 8**


***2012 දෙසැම්බර් 31 දිනට දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් සංකේන්ද්‍රගතවීම***

| | 2011(අ) | | 2012(ආ) | |
|---|---|---|---|---|
| **වත්කම් වර්ගය** | **රුපියල් '000** | **%** | **රුපියල් '000** | **%** |
| රාජ්‍ය ණය සුරැකුම්පත් | 84,743,648 | 51.20 | 97,876,440 | 53.54 |
| ස්කන්ධ | 23,113,400 | 13.96 | 19,141,823 | 10.47 |
| සංස්ථා ණය | 10,687,124 | 6.46 | 12,967,889 | 7.09 |
| ඉඩම් හා ගොඩනැගිලි | 5,880,476 | 3.55 | 5,912,017 | 3.23 |
| තැන්පතු | 25,841,259 | 15.61 | 31,805,243 | 17.40 |
| ඒකක භාර | 1,292,291 | 0.78 | 1,019,741 | 0.56 |
| රත්රන්වල ආයෝජන | 110,916 | 0.07 | 31,832 | 0.02 |
| දිගුකාලීන රක්ෂණ ඔප්පු මත ණය | 4,247,196 | 2.57 | 4,833,303 | 2.64 |
| වෙනත් වත්කම් | 7,954,503 | 4.80 | 7,721,484 | 4.22 |
| මුදල් හා මුදල් හා සමාන දෑ | 1,648,626 | 1.00 | 1,515,834 | 0.83 |
| **එකතුව** | **165,519,439** | **100** | **182,825,606** | **100** |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

**රූප සටහන 7**

***2012 දෙසැම්බර් 31 දිනට දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් සංකේන්ද්‍රගතවීම***



# සංඛ්‍යානමය සමාලෝචනය

### ආයෝජන ප්‍රතිලාභ - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

9 වන වගුවෙහි දක්වා ඇති ආකාරයට 2012 වර්ෂයේ සමස්ථ ආයෝජන ප්‍රතිලාභ රුපියල් මිලියන 17,013 (2011 ඃ රුපියල් මිලියන 16,814) විය. එමෙන්ම 2012 වර්ෂය තුලදී දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයේ සාමාන්‍ය ආයෝජනය රුපියල් මිලියන 165,748 (2011 ඃ රුපියල් මිලියන 141,220) ක් විය.

2012 වර්ෂය තුළ දී රාජ්‍ය සුරැකුම්පත්වල සාමාන්‍ය ආයෝජනය රුපියල් මිලියන 91,310 (2011 ඃ රුපියල් මිලියන 77,391) ලෙස දැක්වුණු අතර එම වත්කම් ආයෝජන ප්‍රතිලාභ 11.92% (2011 ඃ 13.57%) උපයා ගැනීමට සමත් විය.

එසේම 2011 වර්ෂය සමඟ මෙම ප්‍රතිලාභය සලකා බැලීමේ දී ප්‍රතිශතය අඩුවීමක් දක්නට ලැබේ. සීමිත සමාගම්වල සාමාන්‍ය කොටස් ආයෝජනයෙන් ලද ප්‍රතිලාභය රුපියල් මිලියන 331 (2011 ඃ රුපියල් මිලියන 2,578) වූ අතර එම අගය රුපියල් මිලියන 576.2 (2011 ඃ රුපියල් මිලියන 1,743, ප්‍රාග්ධන ලාභ) ප්‍රාග්ධන අලාභවලින් සහ රුපියල් මිලියන 906.84 (2011 ඃ රුපියල් මිලියන 834.4) ලාභාංශ ආදායමකින් සමන්විත විය. ණයකර ආයෝජනය සඳහා ප්‍රාග්ධන ප්‍රතිලාභ වශයෙන් රුපියල් මිලියන 1,634 (2011 ඃ රුපියල් මිලියන 1,320) උපයාගෙන ඇති අතර එම අගය ආයෝජන ප්‍රතිලාභ ප්‍රතිශතයක් වශයෙන් 13.82% ක් ලෙස දැක්වෙයි. මෙය 2011 වසරේ වාර්තා කල ආයෝජන ප්‍රතිලාභ 13.69% සමඟ සසඳා බැලීමේ දී ඉතා සුළු වර්ධනයක් පෙන්නුම් කරයි. එමෙන්ම 2012 වසරේ දී උපරිම ආයෝජන ප්‍රතිලාභයක් පෙන්නුම් කර ඇත්තේ රත්රන්වල කරනු ලැබූ ආයෝජන වන අතර එය 37.14% (2011 ඃ 12.41%) ක ප්‍රතිලාභ අනුපාතයක් දැක්වෙයි. මෙම ඉහළ ප්‍රතිලාභ අනුපාතය කෙරෙහි බලපෑ මූලික සාධකය වූයේ ලෝක වෙළඳපොළේ රත්රන් මිල සැලකිය යුතු ලෙස ඉහළ යාමයි. ඉඩම් සහ ගොඩනැගිලි මත වූ ආයෝජන ප්‍රතිලාභ මෙම වසරේ දි සැලකිය යුතු අන්දමින් පහළ ගොස් ඇති අතර 0.92% (2011 ඃ 5.76%) ලෙස පෙන්නුම් කරයි.

බැංකු සහ මූල්‍ය ආයතනවල තැන්පතු සඳහා රුපියල් මිලියන 3,908 (2011 ඃ රුපියල් මිලියන 2,143) පොලී ආදායමක් උපයාගෙන ඇති අතර මෙම මුදල බැංකු තැන්පත් සඳහා වූ පොලී ආදායම රුපියල් මිලියන 3,784 (2011 ඃ රුපියල් මිලියන 2,110) සහ මූල්‍ය ආයතනවල කරන ලද තැන්පතු සඳහා ඉපයූ පොලී රුපියල් මිලියන 124 (2011 ඃ රුපියල් මිලියන 33) ලෙස වෙන් කර හඳුනාගත හැක. සමස්ථ බැංකු සහ මූල්‍ය ආයතනවල තැන්පතු සඳහා වූ සාමාන්‍ය පොලී අනුපාතය 13.56% ලෙස දැක්විය හැකි අතර මෙම ප්‍රමාණය 2011 වර්ෂයේ දී 9.53% ලෙස පෙන්නුම් කෙරිණි. මෙය පොලී අනුපාතයේ වැඩිවීම නිසා සිදුවිය. ඒකක භාර සහ දිගුකාලීන රක්ෂණ ඔප්පු මත වූ ණය සඳහා ඉතාමත් අවම ආයෝජන ප්‍රතිලාභයක් ජනනය කරගෙන ඇති අතර පිළිවෙළින් 0.85% (2011 ඃ 0.10%) සහ 1.83% (2011 ඃ 1.80%) ලෙස දැක්විය හැකිය.

**වගුව 9**

***සවිස්තරාත්මක සාමාන්‍ය ආයෝජනය සහ ආයෝජන ප්‍රතිලාභ - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය***

| වර්ගීකරණය | 2011(අ) | | | 2012(ආ) | | |
|---|---|---|---|---|---|---|
| | ආයෝජන ආදායම (රුපියල් '000) | සාමාන්‍ය ආයෝජනය (රුපියල් '000) | අයෝජන ප්‍රතිලාභ අනුපාතය (%) | ආයෝජන ආදායම (රුපියල් '000) | සාමාන්‍ය ආයෝජනය (රුපියල් '000) | ආයෝජන ප්‍රතිලාභ අනුපාතය (%) |
| **රජයේ ණය සුරැකුම්පත්** | 10,498,652 | 77,390,998 | 13.57 | 10,882,660 | 91,310,044 | 11.92 |
| - භාණ්ඩාගාර බැඳුම්කර | 9,915,052 | | | 9,148,241 | | |
| - භාණ්ඩාගාර බිල්පත් | 216,852 | | | 171,757 | | |
| - වෙනත් (රිපෝ) | 366,748 | | | 1,562,662 | | |
| **ස්කන්ධ** | 2,577,888 | 22,442,235 | 11.49 | 330,634 | 21,127,612 | 1.56 |
| - ප්‍රාග්ධන ලාභ/පාඩු | 1,743,484 | | | (576,202) | | |
| - ලාභාංශ | 834,404 | | | 906,836 | | |
| **සංස්ථා ණය** | 1,320,450 | 9,646,911 | 13.69 | 1,634,076 | 11,827,507 | 13.82 |
| - ණයකර | 1,289,580 | | | 1,495,343 | | |
| - වෙළඳ පත්‍රිකා | 18,365 | | | 132,990 | | |
| - වත්කම් මගින් සනාථ කරනු ලබන සුරැකුම්පත් (Asset Backed Securities) | - | | | 1,836 | | |
| - වෙනත් සමාන මූල්‍ය උපකරණ | 12,505 | | | 3,907 | | |
| **ඉඩම් හා ගොඩනැගිලි** | 183,310 | 3,181,262 | 5.76 | 54,127 | 5,896,246 | 0.92 |
| **තැන්පතු** | 2,142,848 | 22,496,627 | 9.53 | 3,907,852 | 28,823,251 | 13.56 |
| - බැංකු | 2,110,036 | | | 3,784,069 | | |
| - මූල්‍ය ආයතන | 32,812 | | | 123,783 | | |
| **ඒකක භාර** | (1,326) | 1,269,393 | (0.10) | 9,844 | 1,156,016 | 0.85 |
| **රත්රන්** | 6,880 | 55,458 | 12.41 | 26,509 | 71,374 | 37.14 |
| **ජීවිත රක්ෂණ ඔප්පු මත ණය** | 75,942 | 4,219,003 | 1.80 | 83,169 | 4,540,250 | 1.83 |
| **වෙනත්** | 8,883 | 517,753 | 1.72 | 84,137 | 995,439 | 8.45 |
| **එකතුව** | **16,813,527** | **141,219,640** | **11.91** | **17,013,008** | **165,747,739** | **10.26** |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන්:*
*1. අලියන්ස් ජීවිත, ආපිකෝ සහ එල්අයිසී යන සමාගම්හි කොටස් හිමියන්ට අයත් ආයෝජන සහ ආයෝජන ප්‍රතිලාභ වාර්තා කර ඇත්තේ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය යටතේය.*

# සංඛ්‍යානමය සමාලෝචනය


### ජීවිත රක්ෂණ ඔප්පු අවලංගුවීම

2012 වර්ෂය තුළ දී සමස්ථ දිගුකාලීන රක්ෂණ ඔප්පු අවලංගුවීම 359,812 දක්වා පහත වැටී ඇත. මෙම අගය 2011 වසරේ දී වාර්තා වූ 371,196 සමඟ සසඳා බැලීමේ දී 3.07% ක පහත යාමකි. එමෙන්ම බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු ප්‍රමාණය සමඟ සසඳා බැලීමේ දී අවලංගු වූ රක්ෂණ ඔප්පු ප්‍රමාණයවූ 14.62% 2011 වර්ෂයේ වාර්තා වූ 15.76% සමග සැසඳීමේදී පහත වැටී ඇත.

8 වන රූප සටහනේ දක්වා ඇති පරිදි නව ජීවිත රක්ෂණ ඔප්පු අවලංගුවීම 2012 වර්ෂයේ දී 96,299 (2011 ඃ 82,080) දක්වා ඉහළ ගොස් ඇති අතර මෙම ප්‍රමාණය 17.32% ක වර්ධනයක් ලෙස පෙන්නුම් කෙරේ. කෙසේ වෙතත් 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා නව ඔප්පු අවලංගු වීමේ ප්‍රතිශතයේ අඩුවීමක් දක්නට ලැබුණු අතර එය 2012 වසරේ දී වැඩිවීමක් වාර්තාවිය. නව රක්ෂණ ඔප්පු නිකුත් කිරීමට සාපේක්ෂව රක්ෂණ ඔප්පු අහිමිවීමේ ප්‍රතිශතය 18.72% දක්වා 2012 වර්ෂයේ දී වර්ධනය වී ඇති අතර 2011 වර්ෂයේ දී මෙම අගය 15.6% ලෙස සටහන් විය.

**රූප සටහන 8**

***දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයේ 2008 වර්ෂයේ සිට 2012 දක්වා රක්ෂණ ඔප්පු අවලංගුවීම් අනුපාතය***




| | 2008 | 2009 | 2010 | 2011(අ) | 2012(ආ) |
|---|---|---|---|---|---|
| අවලංගු වූ නව රක්ෂණ ඔප්පු | 108,764 | 94,232 | 84,413 | 82,080 | 96,299 |
| අවලංගු වූ මුළු රක්ෂණ ඔප්පු | 455,989 | 506,005 | 432,707 | 371,196 | 359,812 |
| අවලංගු වූ නව රක්ෂණ ඔප්පු ප්‍රමාණය නිකුත් කරන ලද නව රක්ෂණ ඔප්පු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස | 19.16 | 20.12 | 16.35 | 15.60 | 18.72 |
| අවලංගු වූ මුළු රක්ෂණ ඔප්පු ප්‍රමාණය බලපවත්නා මුළු රක්ෂණ ඔප්පු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස | 21.90 | 24.46 | 19.54 | 15.76 | 14.62 |

අවලංගු වූ නව රක්ෂණ ඔප්පු

අවලංගු වූ මුළු රක්ෂණ ඔප්පු

අවලංගු වූ නව රක්ෂණ ඔප්පු ප්‍රමාණය නිකුත් කරන ලද නව රක්ෂණ ඔප්පු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස

අවලංගු වූ මුළු රක්ෂණ ඔප්පු ප්‍රමාණය බලපවත්නා මුළු රක්ෂණ ඔප්පු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස

*(අ) මණ්ඩලයට ඉදිරිපත් කරන ලද ජීව ගණක වාර්තාවලට අනුව*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

### රක්ෂණ සමාගම්වල නුබුන්වත් බව - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

10 වන වගුවෙහි නිරූපණය කර ඇත්තේ 2012 දෙසැම්බර් 31 වන දිනට එක් එක් රක්ෂණ සමාගම්වල පැවති නුබුන්වත් ආන්තිකය, අවශ්‍ය නුබුන්වත් ආන්තිකය, නුබුන්වත් අනුපාතය සහ රක්ෂණ ඔප්පු වගකීම් වටිනාකමයි.

**වගුව 10**

***දීර්ඝකාලීන රක්ෂණ සමාගම්වල නුබුන්වත් බව සහ රක්ෂණ ඔප්පුවල වගකීම් වටිනාකම - 2012 දෙසැම්බර් 31 දිනට විශ්ලේෂණය***

| රක්ෂකයා | දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය(අ) | | | රක්ෂණ ඔප්පු වගකීම් වටිනාකම(අ) (රුපියල් '000) |
|---|---|---|---|---|
| | පවත්නා නුබුන්වත් ආන්තිකය (රුපියල් '000) | අවශ්‍ය නුබුන්වත් ආන්තිකය (5% ඔප්පු වගකීම් වටිනාකම) (රුපියල් '000) | නුබුන්වත් අනුපාතය | |
| ඒඅයිඒ | 2,830,968 | 1,119,992 | 2.53 | 22,399,842 |
| අලියාන්ස්-ජීවිත | 85,512 | 18,545 | 4.61 | 370,898 |
| අමානා තකාෆුල් | 66,297 | 28,044 | 2.36 | 560,880 |
| ආර්පිකෝ | 100,937 | 2,712 | 37.22 | 54,243 |
| ඒෂියන් එලායන්ස් | 268,979 | 142,881 | 1.88 | 2,857,628 |
| සෙලින්කෝ | 15,397,387 | 1,492,705 | 10.32 | 29,854,100 |
| කෝපරේටිව් | 69,652 | 30,117 | 2.31 | 602,337 |
| එච්එන්බීඒ | 379,706 | 166,611 | 2.28 | 3,332,214 |
| ජනශක්ති | 1,037,592 | 254,354 | 4.08 | 5,087,080 |
| එල්අයිසී | 373,851 | 36,250 | 10.31 | 725,000 |
| එල්ඕඑල්සී | 91,883 | 5,782 | 15.89 | 115,642 |
| එම්බීඑස්එල් | 20,587 | 6,921 | 2.97 | 138,424 |
| සණස | 39,956 | 18,081 | 2.21 | 361,629 |
| එස්එල්අයිසී | 21,127,655 | 1,918,571 | 11.01 | 38,371,425 |
| යූඒඑල් | 2,010,982 | 678,640 | 2.96 | 13,572,802 |
| **එකතුව** | **43,901,944** | **5,920,206** | **7.42** | **118,404,144** |

*(අ) තාවකාලික සංඛ්‍යා*

# සංඛ්‍යානමය සමාලෝචනය

## සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

### දළ ලිඛිත වාරික ආදායම

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ නියුතු සියළුම රක්ෂණ සමාගම් 2012 වර්ෂයේ දී ජනනය කරන ලද දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 49,683 වූ අතර එය 2011 වර්ෂයේදී වාර්තා වූ රුපියල් මිලියන 43,329 හා සසඳන විට 14.67% වර්ධනයකි. මෙය 11 වන වගුවෙහි දැක්වේ. රක්ෂණ සමාගම් විසින් තහවුරු කරන ලද 2012 වර්ෂයේ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය (SRCC & TC) වාරික ආදායම රුපියල් මිලියන 2,250 කි. (2011 ඃ රුපියල් මිලියන 1,950) ඒ අනුව වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම ද ඇතුළත්වූ දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 51,933 කි (2011 ඃ රුපියල් මිලියන 45,279).

පෙර වර්ෂය මෙන්ම මෙම වර්ෂයේදිත් එස්එල්අයිසී සමාගම සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රමුඛතම රක්ෂකයා බවට පත් වෙමින් දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 12,359 ක් (2011 ඃ රුපියල් මිලියන 11,135) වාර්තා කර ඇති අතර එය සමස්ථ දළ ලිඛිත වාරික ආදායමෙන් 24.88% කි. (2011 ඃ 25.70%) සෙලින්කෝ සහ ජනශක්ති සමාගම් විසින් උපයන ලද දළ ලිඛිත වාරික ආදායම පිළිවෙළින් රුපියල් මිලියන 10,435 ක් (2011 ඃ රුපියල් මිලියන 9,559) සහ රුපියල් මිලියන 5,773 ක් (2011 ඃ රුපියල් මිලියන 5,086) ඒ අනුව එම සමාගම් දෙක සාමාන්‍ය රක්ෂණ අංශයේ දෙවන හා තෙවන ස්ථාන අත්කරගෙන සිටින අතර එම සමාගම් පිළිවෙළින් මුළු වෙළඳපොළ පංගුවෙන් 21% ක් (2011 ඃ 22.06%) සහ 11.62% (2011 ඃ 11.74%) ක් අත්කරගෙන ඇත. යූඑල් සහ පීපල්ස් සමාගම ජනනය කරන ලද දළ ලිඛිත වාරික ආදායම පිළිවෙළින් රුපියල් මිලියන 4,436 ක් (2011 ඃ රුපියල් මිලියන 4,055) සහ රුපියල් මිලියන 2,795 (2011 ඃ රුපියල් මිලියන 2,285) ක් විය. ඒ අනුව එම සමාගම් සාමාන්‍ය රක්ෂණ වෙළඳපොළෙහි හතරවන සහ පස්වන ස්ථානයන් අත්කරගෙන ඇත. යූඑල් සහ පීපල්ස් විසින් වාර්තා කොට ඇති වෙළඳපොළ පංගුව පිළිවෙළින් 8.93% (2011 ඃ 9.36%) ක් සහ 5.63% (2011 ඃ 5.27%) වේ. වර්ෂ 2012 දී සාමාන්‍ය රක්ෂණ වෙළඳපොළෙහි ප්‍රමුඛතම රක්ෂණ සමාගම් 5 විසින් වාර්තා කොට ඇති වෙළඳපොළ පංගුව මුළු වෙළඳපොළේ දළ ලිඛිත වාරික වටිනාකමින් 72.06% කි. ඉතිරි 27.94% වෙළඳපොළේ සිටින අනෙකුත් සාමාන්‍ය රක්ෂණ සමාගම් 12 අතර බෙදී ගොස් ඇත. කෙසේ වෙතත් සාමාන්‍ය රක්ෂණ වෙළඳපොළෙහි ප්‍රමුඛතම රක්ෂණ සමාගම් 5 අතර වෙළඳපොළ බෙදීයාම 2012 වසරේ දී, 2011 වසරට සාපේක්ෂව තරමක අඩුවීමක් ඇති අතර එය 2011 වර්ෂයේ දී 74.53% ක් ලෙස වාර්තා විය.

එක් එක් රක්ෂණ සමාගම් විසින් 2012 වර්ෂයේ දී වාර්තා කරන ලද දළ ලිඛිත වාරික ආදායම අනුව වෙළඳපොළ පංගුව 9 වන රූප සටහන මඟින් දැක්වේ.

**වගුව 11**

**සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි සමාගම්වල දළ ලිඛිත වාරික ආදායමේ වෙළඳපොළ පංගුව**

| රක්ෂකයා | 2008 | | 2009 | | 2010 | | 2011(අ) | | 2012(ආ) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වාරිකය (රු'000) | වෙළඳපොළ පංගුව % | වාරිකය (රු'000) | වෙළඳපොළ පංගුව % | වාරිකය (රු'000) | වෙළඳපොළ පංගුව % | වාරිකය (රු'000) | වෙළඳපොළ පංගුව % | වාරිකය (රු'000) | වෙළඳපොළ පංගුව % |
| ඒඅයිඩබ් | 2,045,252 | 5.92 | 2,503,628 | 7.46 | 2,490,843 | 7.10 | 2,456,347 | 5.67 | 2,143,253 | 4.31 |
| ඒඅයිජී | 932,730 | 2.70 | 879,285 | 2.62 | 890,387 | 2.54 | 942,901 | 2.18 | 819,448 | 1.65 |
| අලියාන්ස්-සාමාන්‍ය | 601,103 | 1.74 | 1,174,822 | 3.50 | 1,356,660 | 3.86 | 1,379,406 | 3.18 | 1,397,128 | 2.81 |
| අමානා තකාෆුල් | 835,188 | 2.42 | 953,798 | 2.84 | 908,756 | 2.59 | 916,754 | 2.12 | 1,125,837 | 2.27 |
| ඒෂියන් එලායන්ස් | 459,771 | 1.33 | 496,749 | 1.48 | 397,789 | 1.13 | 582,257 | 1.34 | 1,133,240 | 2.28 |
| සෙලින්කෝ | 11,287,233 | 32.66 | 9,081,297 | 27.07 | 8,724,292 | 24.85 | 9,558,942 | 22.06 | 10,434,917 | 21.00 |
| සෙලින්කෝ තකාෆුල් | 178,734 | 0.52 | 28,324 | 0.08 | - | - | - | - | - | - |
| කොන්ටිනෙන්ටල් | - | - | - | - | 359,105 | 1.02 | 1,149,121 | 2.65 | 1,545,226 | 3.11 |
| කෝපරේටිව් | 522,449 | 1.51 | 596,183 | 1.78 | 644,814 | 1.84 | 922,859 | 2.13 | 1,135,015 | 2.28 |
| එච්එන්බී | 924,709 | 2.68 | 1,130,781 | 3.37 | 1,255,190 | 3.58 | 1,623,830 | 3.75 | 1,635,305 | 3.29 |
| ජනශක්ති | 3,937,285 | 11.39 | 4,272,926 | 12.74 | 4,324,170 | 12.32 | 5,086,207 | 11.74 | 5,773,429 | 11.62 |
| එල්ඕඑල්සී | - | - | - | - | - | - | 364,735 | 0.84 | 1,295,133 | 2.61 |
| එම්බීඑස්එල් | 294,317 | 0.85 | 271,309 | 0.81 | 467,606 | 1.33 | 636,738 | 1.47 | 1,049,147 | 2.11 |
| ඔරියන්ට් | - | - | - | - | - | - | 1,749 | 0.00 | 308,546 | 0.62 |
| පීපල්ස් | - | - | - | - | 847,064 | 2.42 | 2,284,578 | 5.27 | 2,795,448 | 5.63 |
| සණස | 216,412 | 0.63 | 184,409 | 0.55 | 234,914 | 0.67 | 232,374 | 0.54 | 297,025 | 0.60 |
| එස්එල්අයිසී | 9,140,845 | 26.45 | 8,764,539 | 26.13 | 8,766,027 | 24.97 | 11,134,583 | 25.70 | 12,359,087 | 24.88 |
| යූඑල් | 3,182,236 | 9.21 | 3,210,217 | 9.57 | 3,433,830 | 9.78 | 4,055,443 | 9.36 | 4,436,052 | 8.93 |
| **එකතුව** | **34,558,264** | **100** | **33,548,267** | **100** | **35,101,447** | **100** | **43,328,824** | **100** | **49,683,236** | **100** |
| **වර්ධන අනුපාතය (%)** | **10.82** | | **(2.92)** | | **4.63** | | **23.44** | | **14.67** | |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*

*(ආ) තාවකාලික සංඛ්‍යා*


*සටහන්:*

1. *2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය (SRCC & T) වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුළත් කර නොමැත.*
3. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම සෙලින්කෝ තකාෆුල් සමාගම වෙත 2009 අගෝස්තු 5 වැනි දින සිට තහනම් කරනු ලැබීය. 2010 වසරේ සිට විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් මණ්ඩලය වෙත යොමු කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

### රූප සටහන 9

**_සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි සමාගම් මට්ටමින් දළ ලිඛිත වාරික ආදායමේ වෙළඳපොළ පංගුව_**




*සටහන්*

1. *2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය (SRCC & T) වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුළත් කර නොමැත.*
3. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම සෙලින්කෝ තකාෆුල් සමාගම වෙත 2009 අගෝස්තු 5 වැනි දින සිට තහනම් කරනු ලැබීය. 2010 වසරේ සිට විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් මණ්ඩලය වෙත යොමු කර නොමැත.*


# සංඛ්‍යානමය සමාලෝචනය

**දළ ලිඛිත වාරික ආදායම ජනනය කිරීම අතින් ප්‍රමුඛතම සමාගම් පහ - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

2012 වර්ෂය තුළ දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම් ජනනය කිරීම අතින් ප්‍රමුඛතම වෙළඳපොළ පංගුව වාර්තා කරන ලද සමාගම් පහ 10 වන රූප සටහන මඟින් නිරූපණය කරයි. 2010 වසරේ සිට අඛණ්ඩව ප්‍රමුඛතම සමාගම ලෙස එස්එල්අයිසී වාර්තා වන අතර එය 2012 වර්ෂයේ දී වාර්තා කරන ලද වෙළඳපොළ පංගුව 24.88% කි. 2012 වර්ෂයේ දී සෙලින්කෝ 21% ක වෙළඳපොළ පංගුවක් වාර්තා කරමින් වෙළඳපොළ තුළ දෙවන ස්ථානය වාර්තා කර ඇති අතර, 2008 වසරේ සිට 2012 වසර දක්වා ක්‍රමයෙන් එහි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වෙළඳපොළ පංගුවේ අඩුවීමක් වර්ෂයක් පාසා නිරූපණය කර ඇත. 2008 වසරේ සිට සාමාන්‍ය රක්ෂණ වෙළඳපොළේ තෙවන ස්ථානය ජනශක්ති හිමි කරගෙන සිටින අතර 2012 වසරේ දී වාර්තා කරන ලද වෙළඳපොළ පංගුව 11.62% කි. 2008 වසරේ සිට සාමාන්‍ය රක්ෂණ වෙළඳපොළේ හතරවන ස්ථානයේ යූනියන් පවතින අතර 2012 වසරේ දී වෙළඳපොළ පංගුවේ ඉතා සුළු අඩුවීමක් පෙන්නුම් කරමින් 8.93% ක වෙළඳපොළ පංගුවක් එය වාර්තා කර ඇත. 2010 වර්ෂයේ දී ව්‍යාපාර කටයුතු ආරම්භ කළ පීපල්ස් සාමාන්‍ය රක්ෂණ වෙළඳපොළේ පස්වන ස්ථානයට පත්ව ඇත්තේ ඒඅයිඒ අභිබවමින්ය. පීපල්ස් විසින් 2012 වර්ෂයේ දී වාර්තා කර ඇති වෙළඳපොළ පංගුව 5.63% ක් වන අතර, එය 2011 වර්ෂයේ දි 5.27% ලෙස වාර්තා වී ඇත.

**රූප සටහන 10**

***2012 වර්ෂයේ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම ජනනය කිරීම අතින් ප්‍රමුඛතම සමාගම් පහ***




| | එස්එල්අයිසී | සෙලින්කෝ | ජනශක්ති | යූනියන් | පීපල්ස් |
|---|---|---|---|---|---|
| 2008 | 26.45 | 32.66 | 11.39 | 9.21 | - |
| 2009 | 26.13 | 27.07 | 12.74 | 9.57 | - |
| 2010 | 24.97 | 24.85 | 12.32 | 9.78 | 2.42 |
| 2011(අ) | 25.70 | 22.06 | 11.74 | 9.36 | 5.27 |
| 2012(ආ) | 24.88 | 21.00 | 11.62 | 8.93 | 5.63 |

*(අ) ප්‍රතිශෝධිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

# සංඛ්‍යානමය සමාලෝචනය

### සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම රක්ෂණ උප පන්ති අනුව විශ්ලේෂණය

2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ එක් එක් රක්ෂණ උප පන්ති විසින් ජනනය කරන ලද දළ ලිඛිත වාරික ආදායම 12 වන වගුවෙන් හා 11 වන රූප සටහනෙන් දැක්වේ.

රුපියල් මිලියන 31,616 ක (2011 : රුපියල් මිලියන 27,141) දළ ලිඛිත වාරික ආදායමක් වාර්තා කරමින් පෙර වර්ෂවල මෙන්ම මෙම වර්ෂයේදීත් රථ වාහන රක්ෂණ උප පන්තියට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රමුඛතාවය ලැබී ඇති අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායමෙන් 63.64% කොටසක් රථවාහන රක්ෂණ උප පන්තිය මඟින් නියෝජනය වේ. 2011 වසරට සාපේක්ෂව 16.49%ක වර්ධනයක් රථ වාහන රක්ෂණ උප පන්තිය විසින් වාර්තා කොට ඇති අතර 2009 වර්ෂයේ සිට රථ වාහන රක්ෂණ උප පන්තියේ දළ ලිඛිත වාරික ආදායම අඛණ්ඩ වර්ධනයක් වාර්තා කර ඇත. 2012 වර්ෂයේ දී විවිධ රක්ෂණ උප පන්තිය විසින් රුපියල් මිලියන 10,733 ක (2011 : රුපියල් මිලියන 9,134) දළ ලිඛිත වාරික ආදායමක් වාර්තා කරමින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු දළ ලිඛිත වාරික ආදායමින් 21.60% ක කොටසක් වාර්තා කර ඇති අතර එය 2011 වර්ෂයට සාපේක්ෂව 17.51% ක වර්ධනයකි. ගිනි රක්ෂණ උප පන්තිය විසින් රුපියල් මිලියන 5,422 ක (2011 : රුපියල් මිලියන 5,376) දළ ලිඛිත වාරික ආදායමක් වාර්තා කිරීම නිසා 2012 වසරේ දී 0.85% ක වර්ධනයක් වාර්තා කර ඇත. මුහුදු රක්ෂණ උප පන්තිය විසින් 2012 වර්ෂයේ දී වාර්තා කරන ලද දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 1,913 ක් (2011 : රුපියල් මිලියන 1,678) වූ අතර එය මුළු දළ ලිඛිත වාරික ආදායමෙන් 3.85% ක් වේ. 2011 වසරට සාපේක්ෂව මුහුදු රක්ෂණ උප පන්තිය 13.98% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

**වගුව 12**

**දළ ලිඛිත වාරික ආදායම රක්ෂණ උප පන්ති අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| උප පන්තිය | දළ ලිඛිත වාරිකය (රුපියල් '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2011(අ) | 2012(ආ) |
| ගිනි | 6,826,563 | 7,049,399 | 5,012,443 | 5,376,094 | 5,421,688 |
| මුහුදු | 1,826,549 | 1,442,729 | 1,498,832 | 1,678,027 | 1,912,657 |
| රථ වාහන | 18,717,735 | 17,897,763 | 20,948,782 | 27,141,119 | 31,616,009 |
| විවිධ | 7,187,417 | 7,158,375 | 7,641,390 | 9,133,584 | 10,732,881 |
| **එකතුව** | **34,558,264** | **33,548,266** | **35,101,447** | **43,328,824** | **49,683,236** |

| උප පන්තිය | වර්ධනය (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2011 (අ) | 2012 (ආ) |
| ගිනි | 9.02 | 3.26 | (28.90) | 7.25 | 0.85 |
| මුහුදු | 11.62 | (21.01) | 3.89 | 11.96 | 13.98 |
| රථ වාහන | 9.78 | (4.38) | 17.05 | 29.56 | 16.49 |
| විවිධ | 15.25 | (0.40) | 6.75 | 19.53 | 17.51 |
| **එකතුව** | **10.82** | **(2.92)** | **4.63** | **23.44** | **14.67** |

| උප පන්තිය | ප්‍රතිශතාත්මක කොටස (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2011 (අ) | 2012 (ආ) |
| ගිනි | 19.75 | 21.01 | 14.28 | 12.41 | 10.91 |
| මුහුදු | 5.29 | 4.30 | 4.27 | 3.87 | 3.85 |
| රථ වාහන | 54.16 | 53.35 | 59.68 | 62.64 | 63.64 |
| විවිධ | 20.80 | 21.34 | 21.77 | 21.08 | 21.60 |
| **එකතුව** | **100** | **100** | **100** | **100** | **100** |


*(අ) ප්‍රතිශ්ධාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන්*
1. *2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය (SRCC & T) වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුළත් කර නොමැත.*
3. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම සෙලින්කෝ තකාෆුල් සමාගම වෙත 2009 අගෝස්තු 5 වැනි දින සිට තහනම් කරනු ලැබීය. 2010 වසරේ සිට විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් මණ්ඩලය වෙත යොමු කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

**රූප සටහන 11**

**දළ ලිඛිත වාරික ආදායම රක්ෂණ උප පන්ති අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**




අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා
ආ) තාවකාලික සංඛ්‍යා

සටහන් :
1. 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය (SRCC & T) වාරික ආදායම සලකා බලා නොමැත.
2. අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුළත් කර නොමැත.
3. රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම සෙලින්කෝ තකාෆුල් සමාගම වෙත 2009 අගෝස්තු 5 වැනි දින සිට තහනම් කරනු ලැබීය. 2010 වසරේ සිට විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් මණ්ඩලය වෙත යොමු කර නොමැත.

# සංඛ්‍යානමය සමාලෝචනය

### සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි ශුද්ධ ඉපැයූ වාරික සහ දරන ලද ශුද්ධ හිමිකම් පෑම්

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ එක් එක් රක්ෂණ අනුපන්ති විසින් 2012 වර්ෂයේදී වාර්තා කරන ලද ශුද්ධ ඉපැයූ වාරිකය රුපියල් මිලියන 38,418 ක් (2011 ඃ රුපියල් මිලියන 31,817) වූ අතර එය 13 වන වගුවෙන් නිරූපණය වේ. 2012 වසරේ දී රුපියල් මිලියන 23,269 ක් (2011 ඃ රුපියල් මිලියන 20,292) ලෙස දරන ලද සමස්ථ ශුද්ධ හිමිකම් පෑම් වටිනාකමක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියළුම රක්ෂණ අනුපන්ති විසින් වාර්තා කොට තිබුණ අතර එය සමස්ථ හිමිකම් පෑමේ අනුපාතය ලෙස 60.57% කින් නිරූපණය වේ. මෙම අනුපාතය 2011 වර්ෂයේ දී 63.78% ක් ලෙස වාර්තා වී තිබුණි.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ එක් එක් රක්ෂණ අනුපන්ති අතරින් වැඩිම ශුද්ධ හිමිකම් පෑම් අනුපාතයක් විවිධ රක්ෂණ අනුපන්තිය විසින් වාර්තා කර තිබූ අතර එය 63.96% ක් ලෙස වාර්තා වී ඇත. මෙම අනුපාතය 2011 වර්ෂයේ දී වාර්තා කර තිබූ 66.05% අනුපාතික අගයට වඩා අඩුවීමක් ලෙස වාර්තා වේ. මුහුදු හා රථ වාහන රක්ෂණ අනුපන්ති විසින් 2012 වසරේ දි වාර්තා කර ඇති ශුද්ධ හිමිකම් පෑම් අනුපාතයන් පිළිවෙළින් 62.79% (2011 ඃ 28.93%) ක් සහ 61.33% (2011 ඃ 65.39%) ලෙස වාර්තා වේ. මුහුදු රක්ෂණ අනුපන්තියේ හිමිකම් පෑමේ අනුපාතයේ කැපී පෙනෙන වැඩිවීමක් 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ දී වාර්තා වී ඇති අතර ඒ සඳහා 2012 වර්ෂයේ දී සිදුව ඇති ශුද්ධ ඉපැයූ වාරිකවල අඩුවීමත් ශුද්ධ හිමිකම් පෑම්වල වැඩිවීමත් හේතුවී ඇත. ගිනි රක්ෂණ අනුපන්තිය විසින් 2012 වර්ෂයේ අඩුම ශුද්ධ හිමිකම් පෑම් අනුපාතයක් වාර්තා කර ඇති අතර එය 26.82% වේ. (2011 ඃ 42.28%) 2012 වර්ෂයේදී දරන ලද ශුද්ධ හිමිකම්පෑමේ අගයෙහි අඩුවීම මේ සඳහා හේතුවී ඇත.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය විසින් 2012 වර්ෂයේදී දරන ලද ශුද්ධ වියදම් වටිනාකම රුපියල් මිලියන 14,662 ක් (2011 ඃ රුපියල් මිලියන 12,105) වූ අතර එය 38.16% ක (2011 ඃ 38.04%) ශුද්ධ වියදම් අනුපාතක අගයක් ලෙස වාර්තා විය.

ශුද්ධ හිමිකම් පෑම් අනුපාතිකයේ හා ශුද්ධ වියදම් අනුපාතකියේ එකතුවෙන් සෑදෙන ශුද්ධ ඒකාබද්ධ අනුපාතය 2012 වර්ෂයේ දී 98.73% ක් ලෙස වාර්තා වී ඇති අතර, මෙය 2011 වර්ෂයේ වාර්තා වූ අනුපාතය වන 101.82% අනුව අඩුවිමක් පෙන්නුම් කරයි. 98.73% ක් ලෙස 2012 වර්ෂයේදී වාර්තා වූ ශුද්ධ ඒකාබද්ධ අනුපාතය මඟින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ආයතන විසින් දරන ලද ශුද්ධ හිමිකම් පෑම් වටිනාකම් හා දරන ලද ශුද්ධ වියදම් වටිනාකමෙහි එකතුව එකී රක්ෂකයන් විසින් උපයන ලද ශුද්ධ වාරික වටිනාකමට වඩා අඩු අගයක් ලෙස වාර්තා වී පැවතුන බව නිරූපණය කරයි. 2012 දී මෙලෙස වාර්තා වූ ශුද්ධ හිමිකම් පෑමේ අනුපාතය හා ශුද්ධ ඒකාබද්ධ අනුපාතය පසුගිය වර්ෂ පහ තුළ දී වාර්තා වූ අඩුම අනුපාතික අගය ද වේ.

**වගුව 13**

**සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ශුද්ධ ඉපැයූ වාරික, ශුද්ධ හිමිකම් පෑම්, ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතය**

| උප පන්තිය | ශුද්ධ ඉපැයූ වාරිකය (රුපියල් '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2011(අ) | 2012(ආ) |
| ගිනි | 1,068,721 | 1,199,158 | 1,098,186 | 1,141,591 | 1,413,296 |
| මුහුදු | 692,776 | 580,333 | 674,476 | 802,677 | 546,600 |
| රථ වාහන | 16,596,674 | 17,593,582 | 18,356,887 | 23,575,071 | 29,291,164 |
| විවිධ | 5,486,205 | 5,200,212 | 5,282,148 | 6,298,058 | 7,166,796 |
| **එකතුව** | **23,844,376** | **24,573,285** | **25,411,697** | **31,817,397** | **38,417,856** |

| උප පන්තිය | දරන ලද ශුද්ධ හිමිකම් පෑම් ( රුපියල් '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2011(අ) | 2012(ආ) |
| ගිනි | 879,742 | 953,478 | 529,448 | 482,646 | 379,091 |
| මුහුදු | 250,938 | 221,210 | 216,143 | 232,189 | 343,195 |
| රථ වාහන | 11,240,430 | 11,680,229 | 11,733,879 | 15,416,753 | 17,963,038 |
| විවිධ | 3,372,917 | 4,166,757 | 3,091,110 | 4,160,145 | 4,583,943 |
| **එකතුව** | **15,744,027** | **17,021,674** | **15,570,580** | **20,291,734** | **23,269,267** |

| උප පන්තිය | ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
| ගිනි | 82.32 | 79.51 | 48.21 | 42.28 | 26.82 |
| මුහුදු | 36.22 | 38.12 | 32.05 | 28.93 | 62.79 |
| රථ වාහන | 67.73 | 66.39 | 63.92 | 65.39 | 61.33 |
| විවිධ | 61.48 | 80.13 | 58.52 | 66.05 | 63.96 |
| **එකතුව** | **66.03** | **69.27** | **61.27** | **63.78** | **60.57** |

| | 2008 | 2009 | 2010 | 2011(අ) | 2012(ආ) |
|---|---|---|---|---|---|
| ශුද්ධ වියදම් (රුපියල් '000) | 12,766,838 | 12,907,013 | 10,058,322 | 12,105,102 | 14,662,230 |
| ශුද්ධ වියදම් අනුපාතය (%) | **53.54** | **52.52** | **39.58** | **38.04** | **38.16** |
| ශුද්ධ ඒකාබද්ධ අනුපාතය (%) | **119.57** | **121.79** | **100.85** | **101.82** | **98.73** |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන්*


1. *2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය (SRCC & T) වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුළත් කර නොමැත.*
3. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම සෙලින්කෝ තකාෆුල් සමාගම වෙත 2009 අගෝස්තු 5 වැනි දින සිට තහනම් කරනු ලැබීය. 2010 වසරේ සිට විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් මණ්ඩලය වෙත යොමු කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

12 වැනි රූප සටහනේ රක්ෂණකරුවන් විසින් 2008 සිට 2012 වසර දක්වා වාර්තා කරන ලද ශුද්ධ ඉපැයූ වාරික, දරන ලද ශුද්ධ හිමිකම් පෑම්, ශුද්ධ වියදම්, ශුද්ධ හිමිකම් පෑමේ අනුපාතය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතයට අදාල අගයන් පෙන්නුම් කරයි.

**රූප සටහන 12**

***ශුද්ධ ඉපැයූ වාරික, ශුද්ධ හිමිකම් පෑම්, ශුද්ධ වියදම්, ශුද්ධ හිමිකම් පෑමේ අනුපාතය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය***




*(අ) ප්‍රතිශ්ධාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යාවන්*

*සටහන්*

1. *2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය (SRCC & T) වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුළත් කර නොමැත.*
3. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම සෙලින්කෝ තකාෆුල් සමාගම වෙත 2009 අගෝස්තු 5 වැනි දින සිට තහනම් කරනු ලැබීය. 2010 වසරේ සිට විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් මණ්ඩලය වෙත යොමු කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

### දළ ලිඛිත වාරික ආදායම, ප්‍රතිරක්ෂණය හා රඳවා ගැනීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

රක්ෂණකරුවන් විසින් ජනනය කරන ලද දළ ලිඛිත වාරික ආදායම, ප්‍රතිරක්ෂණ වාරිකය සහ රඳවාගත් වාරික ආදායම සාමාන්‍ය රක්ෂණ පංති අනුව වර්ග කර 14 වන වගුවෙන් දක්වා ඇත.

2012 වසර තුළ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුලින් ජනිත කළ මුළු දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 49,683 (2011 : රුපියල් මිලියන 43,329) වූ අතර රුපියල් මිලියන 8,706 (2011 : රුපියල් මිලියන 7,628) ප්‍රතිරක්ෂණ වාර මුදල් වශයෙන් වෙන් කර ඇත. එම නිසා සමස්ථ රඳවා ගැනීමේ අනුපාතය 82.48% (2011 : 82.40%) ලෙස වාර්තා වී ඇත.

2011 වර්ෂය තුළ දී මෙන්ම, 2012 වර්ෂය තුළ දී ද රථ වාහන රක්ෂණය ඉහළම රඳවා ගැනීමේ අනුපාතයක් වාර්තා කර ඇති අතර, එය ඉතා අඩු ප්‍රතිරක්ෂණ බැඳියාවක් මෙන්ම, ඉතා ඉහළ අවදානම් දරා ගැනීමක් ලෙස පෙන්නුම් කරයි.

2012 වසරේ දී විවිධ රක්ෂණවල රඳවා ගැනීමේ අනුපාතය 74.25% (2011 : 74.79%) වූ අතර මුහුදු රක්ෂණයේ රඳවා ගැනීමේ අනුපාතය 30.86% (2011 : 49.50%) ලෙස සීඝ්‍ර අඩුවීමක් 2011 වසරට සාපේක්ෂව පෙන්නුම් කරයි.

2012 වසර තුළ දී ද, ගිනි රක්ෂණය අඩුම රඳවා ගැනීමේ අනුපාතය 23.62% (2011 : 23.92%) වාර්තා කරන ලදී.

13 වන රූප සටහන මගින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රතිරක්ෂණ වාරිකය සහ රක්ෂකයන් විසින් රඳවා ගනු ලබන වාරිකය නිරූපනය කරයි.

**වගුව 14**
**දළ ලිඛිත වාරිකය ප්‍රතිරක්ෂණ වාරිකය සහ රඳවා ගැනීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| උප පන්තිය | දළ ලිඛිත වාරිකය (රුපියල් '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2011(අ) | 2012(ආ) |
| ගිනි | 6,826,563 | 7,049,399 | 5,012,443 | 5,376,094 | 5,421,688 |
| මුහුදු | 1,826,549 | 1,442,729 | 1,498,832 | 1,678,027 | 1,912,657 |
| රථ වාහන | 18,717,735 | 17,897,763 | 20,948,782 | 27,141,119 | 31,616,009 |
| විවිධ | 7,187,417 | 7,158,375 | 7,641,390 | 9,133,584 | 10,732,881 |
| **මුළු දළ ලිඛිත වාරිකය** | **34,558,264** | **33,548,266** | **35,101,447** | **43,328,824** | **49,683,236** |

| උප පන්තිය | ප්‍රතිරක්ෂණ වාරිකය ( රුපියල් '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2011(අ) | 2012(ආ) |
| ගිනි | 5,861,973 | 5,904,806 | 4,233,236 | 4,090,136 | 4,140,881 |
| මුහුදු | 1,174,809 | 892,411 | 813,665 | 847,392 | 1,322,355 |
| රථ වාහන | 655,220 | 533,720 | 316,594 | 387,211 | 478,481 |
| විවිධ | 2,482,405 | 1,918,389 | 2,020,031 | 2,302,942 | 2,764,139 |
| **මුළු ප්‍රතිරක්ෂණ වාරිකය** | **10,174,407** | **9,249,326** | **7,383,526** | **7,627,681** | **8,705,856** |

| උප පන්තිය | රඳවා ගැනීම (රුපියල් '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
| ගිනි | 964,590 | 1,144,593 | 779,208 | 1,285,958 | 1,280,807 |
| මුහුදු | 651,740 | 550,318 | 685,167 | 830,635 | 590,302 |
| රථ වාහන | 18,062,516 | 17,364,043 | 20,632,188 | 26,753,908 | 31,137,528 |
| විවිධ | 4,705,012 | 5,239,986 | 5,621,359 | 6,830,643 | 7,968,742 |
| **මුළු ශුද්ධ ලිඛිත වාරිකය** | **24,383,858** | **24,298,940** | **27,717,922** | **35,701,143** | **40,977,380** |

| උප පන්තිය | රඳවා ගැනීම දළ ලිඛිත වාරිකයෙන් ප්‍රතිශතයක් ලෙස (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
| ගිනි | 14.13 | 16.24 | 15.55 | 23.92 | 23.62 |
| මුහුදු | 35.68 | 38.14 | 45.71 | 49.50 | 30.86 |
| රථ වාහන | 96.50 | 97.02 | 98.49 | 98.57 | 98.49 |
| විවිධ | 65.46 | 73.20 | 73.56 | 74.79 | 74.25 |
| **සමස්ත රඳවා ගැනීම් අනුපාතය** | **70.56** | **72.43** | **78.97** | **82.40** | **82.48** |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*


*සටහන්*

1. *2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය (SRCC & T) වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුළත් කර නොමැත.*
3. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම සෙලින්කෝ තකාෆුල් සමාගම වෙත 2009 අගෝස්තු 5 වැනි දින සිට තහනම් කරනු ලැබීය. 2010 වසරේ සිට විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් මණ්ඩලය වෙත යොමු කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

**රූප සටහන 13**

***ප්‍රතිරක්ෂණ වාරිකය සහ රක්ෂකයන් විසින් රඳවා ගනු ලැබීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය***




*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යාවන්*

*සටහන්*

1. *2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රක්ෂණ සමාගම්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම ගණනය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය (SRCC & T) වාරික ආදායම සලකා බලා නොමැත.*
2. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුළත් කර නොමැත.*
3. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම සෙලින්කෝ තකාෆුල් සමාගම වෙත 2009 අගෝස්තු 5 වැනි දින සිට තහනම් කරනු ලැබීය. 2010 වසරේ සිට විගණනය කරන ලද මුල්‍ය වාර්තා හා 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් මණ්ඩලය වෙත යොමු කර නොමැත.*

## සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සහ කොටස් හිමියන්ගේ වත්කම්

15 වන වගුවේ දැක්වෙන පරිදි 2012 වසර අවසානයේ කොටස් හිමියන්ගේ වත්කම්ද සහිතව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු වත්කම්හි වටිනාකම රුපියල් මිලියන 124,209 ලෙස වාර්තා විය. එය 2011 වසර අවසානයේ වාර්තා වූ රුපියල් මිලියන 100,192 ට සාපේක්ෂව 23.97% ක ඉහළ යාමකි.

2012 වසරේ දී රජයේ ණය සුරැකුම්වල කරන ලද ආයෝජනය රුපියල් මිලියන 28,776 ක් (2011 : රුපියල් මිලියන 24,686) වූ අතර එය සමස්ථ වත්කම්වල 23.17% ක ඉහළම ප්‍රතිශතයක් ලෙස වාර්තා විය. රක්ෂණකයන් සිය තාක්ෂණික සංචිතයෙන් අවම වශයෙන් 20% ක ප්‍රමාණයක් රජයේ ණය සුරැකුම්පත්වල ආයෝජන වශයෙන් වසර පුරාවට පනතට අනුව පවත්වාගෙන යන්නේ ද යන බව මණ්ඩලය දැඩි ලෙස විමර්ශණය කරනු ලබන අතර ඉතිරි වත්කම් නිර්ණායක 1 හි සඳහන් කර ඇති ආකාරයට ආයෝජනය කළ යුතුය.

ස්කන්ධවල කරනු ලැබූ ආයෝජනය (එයට පරිපාලිත සමාගම්වල හා ආශ්‍රිත සමාගම්වල කරන ලද ආයෝජන ඇතුළත් වේ) රුපියල් මිලියන 28,761 ලෙස 2012 වසර අවසානයේ වාර්තා වූ අතර (2011 : රුපියල් මිලියන 27,438) එය 23.15% ක ප්‍රතිශත අගයක් සමස්ථ වත්කම් තුළ නිරූපණය කෙරේ.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුල අනෙකුත් වැදගත් වත්කම් වර්ග ලෙස තැන්පතු, ඉඩම් හා ගොඩනැගිලි සහ වෙනත් වත්කම් දැක්විය හැක.

14 වන රූප සටහන මගින්, කොටස් හිමියන්ගේ වත්කම්ද ඇතුළුව, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් හි සංකේන්ද්‍රගත වීම නිරූපනය කරයි.

# සංඛ්‍යානමය සමාලෝචනය

## වගුව 15

### සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල වත්කම් සංකේන්ද්‍රගත වීම (කොටස් හිමියන් ද ඇතුළුව)


| | 2011(අ) | | 2012(ආ) | |
|---|---|---|---|---|
| **වත්කම් වර්ගය** | **රුපියල් '000** | **%** | **රුපියල් '000** | **%** |
| රජයේ ණය සුරැකුම්පත් | 24,685,973 | 24.64 | 28,775,983 | 23.17 |
| ස්කන්ධ | 27,438,223 | 27.39 | 28,760,828 | 23.15 |
| සංස්ථා ණය | 3,687,683 | 3.68 | 3,929,208 | 3.16 |
| ඉඩම් හා ගොඩනැඟිලි | 7,866,583 | 7.85 | 11,872,473 | 9.56 |
| තැන්පතු | 6,773,175 | 6.76 | 12,511,581 | 10.07 |
| ඒකක භාර | 1,011,658 | 1.02 | 1,277,123 | 1.03 |
| රත්රන්වල ආයෝජන | 344,224 | 0.34 | 7,130 | 0.01 |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණ | 5,475,110 | 5.46 | 5,862,208 | 4.72 |
| ඔප්පු හිමියන්ගෙන් සහ අතරමැදියන්ගෙන් ලැබිය යුතු | 8,470,381 | 8.45 | 11,054,128 | 8.90 |
| දේපල, පිරියත සහ උපකරණ | 2,091,000 | 2.09 | 3,150,112 | 2.54 |
| වෙනත් වත්කම් | 11,203,447 | 11.18 | 15,628,623 | 12.58 |
| මුදල් හා මුදල් සමාන දෑ | 1,144,766 | 1.14 | 1,379,967 | 1.11 |
| **එකතුව** | **100,192,223** | **100** | **124,209,364** | **100** |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*

*සටහන්*
1. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුළත් කර නොමැත.*
2. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම සෙලින්කෝ තකාෆුල් සමාගම වෙත 2009 අගෝස්තු 5 වැනි දින සිට තහනම් කරනු ලැබීය. 2010 වසරේ සිට විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් මණ්ඩලය වෙත යොමු කර නොමැත.*
3. *අලියාන්ස්-ජීවිත, ආර්පිකෝ සහ එල්අයිසී හි කොටස් හිමියන්ට අයත් වත්කම් දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර යටතේ වාර්තා කර ඇත.*

## රූප සටහන 14

### සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සහ කොටස් හිමියන්ගේ වත්කම්වල සංකේන්ද්‍රගත වීම - 2012 දෙසැම්බර් 31




*සටහන්*
1. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුළත් කර නොමැත.*
2. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම සෙලින්කෝ තකාෆුල් සමාගම වෙත 2009 අගෝස්තු 5 වැනි දින සිට තහනම් කරනු ලැබීය. 2010 වසරේ සිට විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් මණ්ඩලය වෙත යොමු කර නොමැත.*
3. *අලියාන්ස්-ජීවිත, ආර්පිකෝ සහ එල්අයිසී හි කොටස් හිමියන්ට අයත් වත්කම් දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර යටතේ වාර්තා කර ඇත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

### සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ හා කොටස් හිමියන්ගේ ආයෝජන

වගුව 16 මගින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි සහ කොටස් හිමියන්ගේ වත්කම් වලට අදාල සාමාන්‍ය ආයෝජන, ආයෝජිත ප්‍රතිලාභ සහ ආයෝජන ඵලදා අනුපාතයන් විවිධ වත්කම් වර්ගීකරණයන් යටතේ දක්වා ඇත.

2012 වසර තුළ දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි සහ කොටස් හිමියන්ගේ ආයෝජන රුපියල් මිලියන 80,407 ක් (2011 ඃ රුපියල් මිලියන 61,891) වූ අතර මෙමගින් රුපියල් මිලියන 9,050 ක (2011 ඃ රුපියල් මිලියන 5,885) ආයෝජන ආදායමක් ඉපයීමට හැකියාව ලැබිණි. මෙහි ආයෝජන ඵලදා අනුපාතය 11.25% ක් වූ අතර එය 2011 දී වාර්තා වූ 9.51% ක ආයෝජන ඵලදා අනුපාතය අභිබවා යන්නක් විය.

2012 වසර තුළ දී, රජයේ ණය සුරැකුම් පත් වල සාමාන්‍ය ආයෝජනය රුපියල් මිලියන 26,731 ක් (2011 ඃ රුපියල් මිලියන 22,110) විය. මෙමගින් රුපියල් මිලියන 2,929 (2011 ඃ රුපියල් මිලියන 2,178) ආයෝජන ආදායමක් ඉපයූ අතර එය 10.96% (2011 ඃ 9.85%) ක ආයෝජන ඵලදා අනුපාතයක් ලෙස වාර්තා විය.

ස්කන්ධ සාමාන්‍ය ආයෝජනය රුපියල් මිලියන 28,100 ක් ලෙස 2012 වසර තුලදී (2011 ඃ රුපියල් මිලියන 24,417) වාර්තා වූ අතර ඒ තුලින් රුපියල් මිලියන 1,335 ක ලාභාංශ ආදායමක්ද, රුපියල් මිලියන 2,878 ක ප්‍රාග්ධන ලාභද ජනනය කර ඇති අතර එහි ආයෝජන ඵලදා අනුපාතය 14.99% ක් (2011 ඃ 11.71%) ලෙස වාර්තා විය. සැලකිය යුතු ලෙස ප්‍රාග්ධන ලාභ ඉපයීම් ඉහළ යාම ස්කන්ධ ආයොජන සඳහා ඉහළ ඵලදා අනුපාතයක් වාර්තා වීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

විවිධ වූ සංස්ථා ණය 2012 වසර තුළ දී රුපියල් මිලියන 3,808 ක සාමාන්‍ය ආයෝජනය ක් ලෙස වාර්තා වූ අතර එය ආයෝජන ආදායම රුපියල් මිලියන 507 ඉපයීමට සමත්විය. එහි ඵලදා අනුපාතය 13.31% ක් වූ අතර 2011 වසරේ දී වාර්තා වූ 11.80% ක ඵලදා අනුපාතය ඉක්මවා යෑමක් විය.

2012 වර්ෂයේ දී තැන්පතු ආයෝජන ආදායම රුපියල් මිලියන 1,105 ක් (2011 ඃ රුපියල් මිලියන 332) වූ අතර එය බැංකු පොලී ආදායම රුපියල් මිලියන 969 ක් (2011 ඃ රුපියල් මිලියන 301) සහ මූල්‍ය ආයතන තැන්පතු ආදායම රුපියල් මිලියන 136 කින් (2011 ඃ රුපියල් මිලියන 31) සමන්විත විය.

2012 වසර තුළ දී ඉහළ පොලී අනුපාතයක් තැන්පතු මත ලැබීම් හේතුකොට ගෙන, 11.46% ඉහළ ආයෝජන ඵලදා අනුපාතයක් වාරතා කරමින් 2011 වසරේ ජනනය කළ 6.31% ආයෝජන ඵලදා අනුපාතයට වඩා ඉහළ අගයක් වාර්තා කිරීමට හේතු විය.

ඒකක භාර රුපියල් මිලියන 91 ක ආයෝජන ආදායමක් ජනනය කළ අතර, එය රුපියල් මිලියන 1,144 ක සාමාන්‍ය ආයෝජනයක ප්‍රතිඵලයකි. එහි ආයෝජන ඵලදා අනුපාතය 7.94% ක් ලෙස 2012 වසර තුළ වාර්තා වේ.

2012 වසර තුළ දී රත්රන්වල ආයෝජනය 2011 වසරට සාපේක්ෂව සැලකිය යුතු ඉහළ යාමක් පෙන්නුම් නොකළ ද, රත්රන් ආයෝජන ඵලදා අනුපාතය ආයෝජන ඵලදා අනුපාත අතරින් ඉහළම අනුපාතය ලෙස 36.38% (2011 ඃ 3.67%) ජනනය කිරීමට එහි වටිනාකම් ඉහළ යාම හේතු පාදක විය.

**වගුව 16**

***සවිස්තරාත්මක ආයෝජන ආදායම සහ සාමාන්‍ය ආයෝජනය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය***

| වර්ගය | 2011(අ) | | | 2012(ආ) | | |
|---|---|---|---|---|---|---|
| | ආයෝජිත ආදායම (රුපියල් '000) | සාමාන්‍ය ආයෝජනය (රුපියල් '000) | ආයෝජන ඵලදා අනුපාතය (%) | ආයෝජිත ආදායම (රුපියල් '000) | සාමාන්‍ය ආයෝජනය (රුපියල් '000) | ආයෝජන ඵලදා අනුපාතය (%) |
| **රජයේ ණය සුරැකුම්පත්** | 2,177,556 | 22,109,889 | 9.85 | 2,928,938 | 26,730,978 | 10.96 |
| - භාණ්ඩාගාර බැඳුම්කර | 1,395,074 | | | 1,539,102 | | |
| - භාණ්ඩාගාර බිල්පත් | 459,160 | | | 465,303 | | |
| - වෙනත් (ප්‍රති සුරැකුම්) | 323,322 | | | 924,533 | | |
| **ස්කන්ධ** | 2,860,225 | 24,417,443 | 11.71 | 4,213,149 | 28,099,526 | 14.99 |
| - ප්‍රාග්ධන ලාභ/අලාභ | 1,927,588 | | | 2,877,721 | | |
| - ලාභාංශය | 932,637 | | | 1,335,428 | | |
| **සංස්ථා ණය** | 346,125 | 2,934,122 | 11.80 | 506,779 | 3,808,445 | 13.31 |
| - ණයකර | 275,141 | | | 371,262 | | |
| - වෙළඳ පත්‍රිකා | 37,809 | | | 126,050 | | |
| - වෙනත් මූල්‍ය පත්‍රිකා | 33,175 | | | 9,467 | | |
| **ඉඩම් හා ගොඩනැගිලි** | 420 | 5,801,888 | 0.01 | 297 | 9,869,528 | 0.00 |
| **තැන්පතු** | 332,399 | 5,268,606 | 6.31 | 1,104,827 | 9,642,378 | 11.46 |
| - බැංකු | 301,234 | | | 968,611 | | |
| - මූල්‍ය ආයතන | 31,165 | | | 136,216 | | |
| **ඒකක භාර** | 31,487 | 621,502 | 5.07 | 90,869 | 1,144,391 | 7.94 |
| **රත්රන්** | 6,369 | 173,575 | 3.67 | 63,911 | 175,677 | 36.38 |
| **වෙනත්** | 130,242 | 563,644 | 23.11 | 141,484 | 936,494 | 15.11 |
| **එකතුව** | **5,884,823** | **61,890,669** | **9.51** | **9,050,254** | **80,407,417** | **11.25** |

*(අ) ප්‍රතිශ්ඨාපිත විගණන සංඛ්‍යා*
*(ආ) තාවකාලික සංඛ්‍යා*
*සටහන්*
1. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුළත් කර නොමැත.*
2. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම සෙලින්කෝ තකාෆුල් සමාගම වෙත 2009 අගෝස්තු 5 වැනි දින සිට තහනම් කරනු ලැබීය. 2010 වසරේ සිට විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් මණ්ඩලය වෙත යොමු කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

### රක්ෂණ සමාගම්වල නුබුන්වත් බව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

2012 වසර අවසානයේ රක්ෂකයන් විසින් වාර්තා කරන ලද පවත්නා නුබුන්වත් ආන්තිකය, අවශ්‍යය නුබුන්වත් ආන්තිකය, නුබුන්වත් අනුපාතය සහ තාක්ෂණික සංචිත වටිනාකම් 17 වැනි වගුවෙහි දක්වා ඇත.

**වගුව 17**

***සාමාන්‍ය රක්ෂණ සමාගම්වල නුබුන්වත්බව විශ්ලේෂණය සහ තාක්ෂණික සංචිත - 2012 දෙසැම්බර් 31***

| රක්ෂකයා | සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය(අ) | | | තාක්ෂණික සංචිත(අ) (රුපියල් '000) |
|---|---|---|---|---|
| | පවත්නා නුබුන්වත් ආන්තිකය (රුපියල් '000) | අවශ්‍ය නුබුන්වත් ආන්තිකය (රුපියල් '000)) | නුබුන්වත් අනුපාතය | |
| ඒඅයිඒ | 1,364,325 | 361,071 | 3.78 | 1,515,737 |
| ඒඅයිජී | 144,519 | 80,553 | 1.79 | 304,886 |
| අලියාන්ස්-සාමාන්‍ය | 633,271 | 104,957 | 6.03 | 486,330 |
| අමානා තකාෆුල් | 377,592 | 204,437 | 1.85 | 476,721 |
| ඒෂියන් ඒලායන්ස් | 452,750 | 191,160 | 2.37 | 592,088 |
| සෙලින්කෝ | 2,004,353 | 1,769,616 | 1.13 | 5,283,307 |
| කොන්ටිනන්ටල් | 342,110 | 210,849 | 1.62 | 619,195 |
| කෝපරේටිව් | 488,475 | 216,330 | 2.26 | 634,588 |
| එච්එන්බීඒ | 918,382 | 263,914 | 3.48 | 855,641 |
| ජනශක්ති | 2,320,097 | 1,034,816 | 2.24 | 3,510,174 |
| එල්ඕඑල්සී | 295,071 | 240,374 | 1.23 | 883,883 |
| එම්බීඑස්එල් | 199,440 | 187,716 | 1.06 | 518,511 |
| ඔරියන්ට් | 576,189 | 50,665 | 11.37 | 165,938 |
| පීපල්ස් | 798,605 | 527,566 | 1.51 | 1,878,856 |
| සණස | 74,906 | 50,000 | 1.50 | 133,417 |
| එස්එල්අයිසී | 9,785,301 | 2,857,512 | 3.42 | 12,614,203 |
| යූඒඑල් | 1,559,525 | 742,831 | 2.10 | 2,872,507 |
| **එකතුව** | **22,334,911** | **9,094,367** | **2.46** | **33,345,982** |

*(අ) තාවකාලික සංඛ්‍යා*

*සටහන්*

1. *අවශ්‍ය කරන ලද සම්පූර්ණ තොරතුරු මණ්ඩලය වෙත යොමු කර නොමැති බැවින් ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ඉහත විශ්ලේෂණය සඳහා ඇතුළත් කර නොමැත.*
2. *රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීම සෙලින්කෝ තකාෆුල් සමාගම වෙත 2009 අගෝස්තු 5 වැනි දින සිට තහනම් කරනු ලැබීය. 2010 වසරේ සිට විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ දත්ත සමාගම විසින් මණ්ඩලය වෙත යොමු කර නොමැත.*

# සංඛ්‍යානමය සමාලෝචනය

## රක්ෂණ තැරැව්කාර සමාගම්

### රක්ෂණ තැරැව්කාර සමාගම්වල කාර්යසාධනය

2012 වසර තුළ දී රක්ෂණ වෙළඳපොළ තුළ රක්ෂණ තැරැව්කාර සමාගම් 55 ක් ක්‍රියාත්මක වූ අතර මෙය 2011 වසර තුළ දී 46 ක් ලෙස වාර්තා විය.

18 වන වගුවේ දැක්වෙන පරිදි රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් දිගුකාලීන හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන් තුළින් රුපියල් මිලියන 12,727 ක් 2012 වසර තුළ දී දළ ලිඛිත වාරිකයන් ලෙස ජනනය කළ අතර, එය 2011 වසර තුළ රුපියල් මිලියන 10,489 ක් ලෙස වාර්තා විය. රක්ෂණ තැරැව්කරුවන් විසින් ජනනය කළ දළ ලිඛිත වාරිකයන්, සමස්ථ රක්ෂණ කර්මාන්තයේ ජනනය කරන ලද දළ ලිඛිත වාරිකය වූ රුපියල් මිලියන 87,152 න් 14.60% ක ප්‍රතිශතයක් නියෝජනය කරන ලදී. රක්ෂණ තැරැව්කරුවන් විසින් දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයට රුපියල් මිලියන 195 ක සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට රුපියල් මිලියන 12,532 ක දළ ලිඛිත වාරිකයන් ජනනය කර ඇත. එම අගයන් රක්ෂණ තැරැව්කරුවන් විසින් ජනනය කළ සමස්ථ දළ ලිඛිත වාරිකයෙන්, දිගුකාලීන රක්ෂණයට 1.53% ක සහ සාමාන්‍ය රක්ෂණය සඳහා 98.47% ක නියෝජනයකි.

පසුගිය වසර මෙන්, 2012 වසරේ ද, රක්ෂණ තැරැව්කරුවන් විසින් ජනනය කළ දිගුකාලීන රක්ෂණ වාරිකය සහ සාමාන්‍ය රක්ෂණ වාරිකය පිළිවෙළින් 0.52% සහ 25.22% ක නියෝජනයක් සමස්ථ දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල දළ ලිඛිත වාරිකයන් තුළ විය.

දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය තුළ රක්ෂණ තැරැව්කරුවන්ගේ දායකත්වය ඉතා අඩු මට්ටමක පැවතුන ද, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ අතරමැදියන් ලෙස ඔවුන්ගේ දායකත්වය ඉතා වැදගත් සහ ඉහළ අගයක් බව ඉහත දත්ත මඟින් පෙන්නුම් කරයි.

රුපියල් මිලියන 100 කට වැඩි දළ ලිඛිත වාරික ආදායම් දායකත්වයක් ලබාදුන් රක්ෂණ තැරැව්කාර සමාගම් 21 ක් 2012 වසර තුළදී වාර්තා වූ අතර, එම සමාගම් 21 රුපියල් මිලියන 12,051 ක දළ ලිඛිත වාරික ආදායමක් ජනනය කරන ලදී. රුපියල් මිලියන 675 ක් වූ දළ ලිඛිත වාරික ආදායමක් අනෙකුත් තැරැව්කාර ආයතන 34 විසින් ජනනය කර ඇත.

2003 වසරේ සිට 2012 වසර දක්වා රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් ජනනය කරන ලද දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ වාරික ආදායම රූප සටහන් 15 මඟින් නිරූපණය වේ.

**වගුව 18**


***රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් ජනනය කරන ලද දළ ලිඛිත වාරික ආදායම - 2012***

| | | දළ ලිඛිත වාරික ආදායම (රුපියල් '000) | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | දිගුකාලීන | | සාමාන්‍ය | | එකතුව | |
| | රක්ෂණ තැරැව්කාර සමාගමේ නම | රුපියල් '000 | % | රුපියල් '000 | % | රුපියල් '000 | % |
| 1 | ඒඩීඉසෙඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 5,149 | 2.64 | 262,350 | 2.09 | 267,499 | 2.10 |
| 2 | එයිට්කන් ස්පෙන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 920 | 0.47 | 412,487 | 3.29 | 413,407 | 3.25 |
| 3 | ඇල්ෆින්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 310 | 0.16 | 674,331 | 5.38 | 674,641 | 5.30 |
| 4 | ඇසට්ලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | - | - | 954,962 | 7.62 | 954,962 | 7.50 |
| 5 | සීඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 59 | 0.03 | 1,834,940 | 14.64 | 1,834,999 | 14.42 |
| 6 | කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 60,116 | 30.82 | 1,649,828 | 13.17 | 1,709,944 | 13.44 |
| 7 | ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 8,981 | 4.61 | 781,673 | 6.24 | 790,654 | 6.21 |
| 8 | එසාජී කර්මිජී ඇන්ඩ් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | 7,630 | 3.91 | 284,285 | 2.27 | 291,915 | 2.29 |
| 9 | ෆින්ලේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 17,065 | 8.75 | 1,289,993 | 10.29 | 1,307,058 | 10.27 |
| 10 | ග්ලෝබල් ඉන්ෂුවරන්ස් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 69 | 0.04 | 432,648 | 3.45 | 432,717 | 3.40 |
| 11 | ඉන්ඩස්ට්‍රියල් ඇන්ඩ් කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 1,439 | 0.74 | 318,815 | 2.54 | 320,254 | 2.52 |
| 12 | එල්ඇම් ඇන්ඩ් ඒ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 1,451 | 0.74 | 244,284 | 1.95 | 245,735 | 1.93 |
| 13 | ලයිෆ් ඇන්ඩ් ජෙනරල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් | 229 | 0.12 | 109,931 | 0.88 | 110,160 | 0.87 |
| 14 | නේෂන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | 6,726 | 3.45 | 786,908 | 6.28 | 793,634 | 6.24 |
| 15 | ප්‍රෝකෙයා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 1,140 | 0.58 | 175,673 | 1.40 | 176,813 | 1.39 |
| 16 | ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් ඇෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 185 | 0.09 | 652,462 | 5.21 | 652,647 | 5.13 |
| 17 | රිලයන්ස් ඒවීජී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | 34,122 | 17.50 | 229,247 | 1.83 | 263,369 | 2.07 |
| 18 | රිලයන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 2,531 | 1.30 | 200,184 | 1.60 | 202,715 | 1.59 |
| 19 | සේනාරත්න ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 2,753 | 1.41 | 214,405 | 1.71 | 217,158 | 1.71 |
| 20 | ස්ට්‍රැටජික් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 308 | 0.16 | 236,918 | 1.89 | 237,226 | 1.86 |
| 21 | සෙනිත් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 158 | 0.08 | 153,786 | 1.23 | 153,944 | 1.21 |
| | **උප එකතුව** | **151,341** | **77.60** | **11,900,110** | **94.96** | **12,051,451** | **94.70** |
| | **අනෙකුත් රක්ෂණ තැරැව්කාර සමාගම් (34)** | **43,679** | **22.40** | **631,479** | **5.04** | **675,158** | **5.30** |
| | **මුළු එකතුව** | **195,020** | **100** | **12,531,589** | **100** | **12,726,609** | **100** |

# සංඛ්‍යානමය සමාලෝචනය

**රූප සටහන 15**

***රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් ජනනය කරන ලද දළ ලිඛිත වාරික ආදායම 2003 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා***




| | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| දීර්ඝකාලීන රක්ෂණ දළ ලිඛිත වාරික ආදායම (රුපියල් මිලියන) | 76 | 88 | 103 | 144 | 158 | 195 | 188 | 243 | 296 | 195 |
| සාමාන්‍ය රක්ෂණ දළ ලිඛිත වාරික ආදායම (රුපියල් මිලියන) | 3,573 | 4,117 | 5,208 | 6,028 | 7,393 | 8,781 | 8,698 | 9,317 | 10,193 | 12,532 |
| තැරැව්කාරුවන්ගේ දායකත්වය මුළු දළ ලිඛිත වාරික ආදායමෙන් (ප්‍රතිශතයක් ලෙස) | 15.11 | 14.23 | 14.27 | 14.34 | 14.55 | 15.43 | 15.44 | 14.43 | 13.36 | 14.60 |

# සංඛ්‍යානමය සමාලෝචනය

### රක්ෂණ සමාගම් සඳහා කෙටි යෙදුම්

| | | |
|---|---|---|
| ඒඅයිඒ | - | ඒඅයිඒ ඉන්ෂුවරන්ස් පීඑල්සී (පෙර අවීවා එන්ඩීබී ඉන්ෂවරන්ස් පීඑල්සී) |
| ඒඅයිජී | - | ඒඅයිජී ඉන්ෂුවරන්ස් ලිමිටඩ් (පෙර චාටිස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්) |
| අලියාන්ස් - සාමාන්‍ය | - | අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් |
| අලියාන්ස් - ජීවිත | - | අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් |
| අමානා තකාෆුල් | - | අමානා තකාෆුල් පීඑල්සී |
| ආර්පිකෝ | - | ආර්පිකෝ ඉන්ෂුවරන්ස් ලිමිටඩ් |
| ඒෂියන් එලායන්ස් | - | ඒෂියන් එලායන්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී |
| සෙලින්කෝ තකාෆුල් | - | සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් |
| සෙලින්කෝ | - | සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී |
| කොන්ටිනන්ටල් | - | කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් |
| කෝපරේටිව් | - | කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් |
| එච්එන්බීඒ | - | එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී |
| ජනශක්ති | - | ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී |
| එල්අයිසී | - | ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) ලිමිටඩ් |
| එල්ඕඑල්සී | - | එල්ඕඑල්සී ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් |
| එම්බීඑස්එල් | - | එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් |
| එන්අයිසීඑල් | - | නැෂනල් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් |
| එන්අයිටීඑෆ් | - | ජාතික රක්ෂණ භාර අරමුදල |
| ඔරියන්ට් | - | ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් |
| පීපල්ස් | - | පීපල්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් |
| සණස | - | සීමාසහිත සණස රක්ෂණ සමාගම |
| එස්එල්අයිසී | - | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් |
| යූඒඑල් | - | යූනියන් ඇෂුවරන්ස් පීඑල්සී |

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## අධීක්ෂණ සමාලෝචනය - 2012

### රක්ෂණ සමාගම්

1. **මණ්ඩලයට ඉදිරිපත් කරන ලද වාර්තා පිළිබඳ සමාලෝචනය**

**අ) වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ජීව ගණකාධිකරණ වාර්තා**

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව සියළු රක්ෂකයන් විසින් ඔවුන්ගේ වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අදාළ මූල්‍ය වර්ෂය අවසන් වී හය මසක් ඇතුළත මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු වේ. තව ද දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරවල නියුක්තව සිටින රක්ෂකයින් විසින් ජීවගණකාධිකරණ වාර්තාවක් සහ එහි සංක්ෂිප්තයක් ද වාර්ෂික ව්‍යවස්තානුකූල වාර්තාව සමඟ ඉදිරිපත් කළ යුතු වේ. මණ්ඩලය විසින් මෙම වාර්තාවල නිරවද්‍යතාවය හා පනතේ අඩංගු නියමයන්ට හා රෙගුලාසිවලට ඇති අනුකූලතාවය හා එම වාර්තා නියමිත දිනට මණ්ඩලයට ඉදිරිපත් කිරීම ඉතා සමීප සමාලෝචනයකට ලක් කරන ලදී. තව ද ජීවගණකාධිකරණ වාර්තා සමලෝචනය කිරීමට උපදේශක ජීවගණකාධිකරණයකුගේ සහය ලබා ගත් අතර සැලකිල්ලට භාජනය විය යුතු කරුණු පැහැදිලි කිරීම් අවශය වූ විට අදාළ රක්ෂණ සමාගම්වලින් එම පැහැදිලි කිරීම් ලබා ගන්නා ලදී.

වාර්තා විමර්ශනය කිරීමේදී මණ්ඩලය විසින් ව්‍යවස්ථානුකූල අවශ්‍යතාවලින් බැහැර වූ වාර්තා පිළිබඳව අදාළ සමාගම් දැනුවත් කර ඒවා නිශ්චිත කාලසීමාවක් තුළ දී නිවැරදි කිරීම පිණිස උපදෙස් ලබා දෙන ලදී. තව ද අදාළ වාර්තා පරීක්ෂා කිරීමේ දී හඳුනාගත් සෙසු විෂමතා ක්ෂේත්‍රගත පිවිසුම්වල දී අදාළ සමාග ම්වල ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන් දැනුවත් කරනු ලැබිණ.

**ආ)කාර්තුමය වාර්තා**

පනතේ විධිවිධාන ප්‍රකාරව සමාගම්වල මූල්‍ය තත්ත්වය නිරීක්ෂණය කිරීමට සහ අනුකූල අවශ්‍යතා නිරීක්ෂණය කිරීම සඳහා එක් එක් කාර්තුව අවසන් වී දින 45ක් ඇතුළත සියළුම රක්ෂණ සමාගම් විසින් තමන්ගේ කාර්තුමය වාර්තා මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු වේ. ඒ අනුව 2012 වසරේ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබූ සියළුම කාර්තුමය වාර්තා ඔවුන්ගේ කාර්තුමය කාර්යය සාධනය සහ මූල්‍ය තත්ත්වය තක්සේරු කර ගැනීම සඳහා විමර්ශනයට ලක් කෙරිණි.

සමස්ථ රක්ෂණ කර්මාන්තයේම කාර්යය සාධනය ඇගයීම පිණිස එක් එක් රක්ෂකයාගේ කාර්තුමය කාර්යය සාධනය දිගුකාලීන හා සාමාන්‍ය යන රක්ෂණ ව්‍යාපාර දෙකෙහිම වාරික ආදායම ප්‍රාරක්ෂණ ලාභය සහ ශුද්ධ ලාභය පදනම් කර ගනිමින් සිදු කරන ලදී. තව ද එක් එක් රක්ෂකයාගේ කාර්යය සාධනය අවබෝධ කර ගැනීම සඳහා අනුපාත ගණනය කොට ලාභදායීත්වය, වියදම හා වන්දි විශ්ලේෂණය කර වසරේ සෑම කාර්තුවකදීම පෙර කාර්තුවල අනුපාතයන් සමඟ සසඳා බලන ලදී.

තව ද කාර්තු අවසානයෙහි එක් එක් රක්ෂකයාගේ මූල්‍ය තත්ත්වය නිරීක්ෂණය කිරීම සඳහා ඔවුන්ගේ වත්කම් වගකීම් තත්ත්වය නිරීක්ෂණය කරනු ලැබූ අතර ඔවුන්ගේ ද්‍රවශීලතාවය හා ප්‍රාග්ධන ප්‍රමාණවත් බව පිළිබඳ අනුපාත විශ්ලේෂණය කිරීමෙන් සිදු කරනු ලැබිණි.

කාර්තුමය වාර්තා නිරීක්ෂණය කිරීමේ දී හඳුනා ගන්නා අනුකූල නොවීම්, අක්‍රමිකතා සහ සාවද්‍යතා කෙරෙහි එම සමාගම්වල අවධානය යොමු කරවා නිශ්චිත කාල සීමාවක දී ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය උපදෙස් සපයන ලදී.

**ඇ)මාසික වාර්තා**

මණ්ඩලය විසින් නිකුත් කළ නියෝග අනුව රක්ෂකයින් තිදෙනෙකු මාසික වාර්තා එක් එක් මාසය අවසන් වී දින 15ක් ඇතුළත දී මණ්ඩලයට ලබා දිය යුතුය. එසේ ඉදිරිපත් කරන ලද මාසික වාර්තා මණ්ඩලය විසින් සමාලෝචනයට ලක් කරන ලද්දේ අදාළ රක්ෂණ සමාගම්වල මූල්‍ය තත්ත්වයත් ව්‍යාපාර කටයුතුත් වඩාත් සමීපව හා නිරතුරුව විමර්ශනය කිරීමේ අදහසිනි. අදාළ වාර්තා සමාලෝචනයේ දී අනකුලතා නොවීම හෝ අක්‍රමිකතා හඳුනා ගනු ලැබුවහොත් ඒවා නියමිත කාල සීමාවක් තුළ දී නිවැරදි කරන ලෙස අදාළ සමාග ම්වලට උපදෙස් සපයන ලදී.

**ඈ) අවදානම් තක්සේරු කිරීමේ සාරාංශය**

රක්ෂණ සමාගම්වල ආයතනික ව්‍යුහය සහ හිමිකම, ව්‍යාපාර ආකෘතිය, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ ව්‍යුහය, අලෙවිකරණය සහ බෙදා හැරීම, හිමිකම් පාලනය, අවදානම් කළමනාකරණ කටයුතු ආදී කරුණු ඇතුළත්ව මණ්ඩලයට වාර්ෂිකව ඉදිරිපත් කරනු ලබන අවදානම් තක්සේරු කිරීමේ සාරාංශයන් මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලැබිණි.

2. **අනෙකුත් මූල්‍ය විශ්ලේෂණය**

මණ්ඩලය විසින් හසුරුවනු ලබන පැමිණිලි සහ විමර්ශන කටයුතුවලට අදාළව නිවැරදි තීරණ ගැනීමට උපකාරයක් ලෙස රැස් කරගන්නා වූ මූල්‍ය තොරතුරු මනා ලෙස විශ්ලේෂණය කරන ලදී.

3. **නුබුන්වන් ආන්තික හැකියාවේ සීමාව පිළිබඳ අනුකූලතාව අධීක්ෂණය කිරීම**

2011 වර්ෂයේ දී සංශෝධනයට ලක් වූ සාමාන්‍ය හා දිගු කාලීන රක්ෂකයන් සඳහා වන නුබුන්වත් ආන්තික නීතීන් 2011 අප්‍රේල් මස පළමු වනදා සිට බලාත්මක වූ අතර එහි විධි විධානවලට අනුව සියළුම රක්ෂිකයින් විසින් සෑම අවස්ථාවක දීම සාමාන්‍ය සහ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරවල අවම නුබුවත් ආන්තික පවත්වා ගෙන යා යුතුය.

සියළුම රක්ෂකයින් විසින් ඔවුන්ගේ මාසික / කාර්තුමය සහ වාර්ෂික ව්‍යවස්ථාමය වාර්තා සමඟ නුබුන්වත් ආන්තික අනුපාත ගණනය කිරීම් ඉදිරිපත් කළ යුතු වේ. ඒ අනුව 2012 වර්ෂයේ දී ද මණ්ඩලය විසින් දීර්ඝකාලීන මෙන්ම සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල යෙදී සිටින සියළුම රක්ෂකයින්ගේ නුබුන්වත් ආන්තික අනුපාත ඉතා සියුම්ව අධීක්ෂණයට ලක් කරනු ලැබිණි. අපේක්ෂිත නුබුන්වත් ආන්තික අනුපාත ඉෂ්ඨ කිරීමට අපොහොසත් වන්නේ නම් හෝ නුබුන්වත් ආන්තිකය ගණනය කිරීම සාවද්‍ය වන්නේ නම් ඒවා නියමිත කාලසීමාවක් තුළ දී නිවැරදි කරන ලෙසට අදාළ සමාගම්වලට උපදෙස් ලබා දෙන ලදී.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## 4. රක්ෂණ කර්මාන්තය අධීක්ෂණය සඳහා වන අවදානම් සංවේදී අවම ප්‍රාග්ධන ආකෘතිය

අවදානම් සංවේදී අවම ප්‍රාග්ධන ආකෘතිය නිර්මාණය කිරීම ආරම්භ වූයේ මණ්ඩලයේ සිය අධීක්ෂණ ක්‍රියාවලිය වඩාත් උසස් කිරීමට සහ වෙළඳපොළ හවුල්කාරයින්ට ඔවුන්ගේ ව්‍යාපාරවල ඇති ව්‍යාපාර අවදානම ඵලදායී ලෙස කළමනාකරණය කර ගැනීමට අවශ්‍ය හැකියාවන් ලබාදීමයට. එම ආකෘතිය සැකසීමට අවශ්‍ය උපදෙස් දීම සඳහා ලෝක බැංකුව සහ FIRST INITIATIVE ආයතනය විසින් Deloitte Touche Tohmatsu India (Pvt) Ltd. පත් කරන ලදී.

මෙම ව්‍යාපෘතියේ ප්‍රථම අදියර වන විශ්ලේෂණ අධ්‍යයන වාර්තාව (Market Analysis Report) ඉදිරිපත් කිරීම 2010 වසරේ දී අවසන් කරනු ලැබීය. එහි දී ශ්‍රී ලංකාවේ රක්ෂණ වෙළඳපොළ පිළිබඳ හැදෑරීමක් සහ ඊට අදාළ ගැටළු හඳුනා ගැනීමක් ද සිදු කොට තිබිණි. තවදුරටත් මෙම වාර්තාව රක්ෂණ කර්මාන්තය කෙරෙහි බලපෑම් කරන්නා වූ හෝ අනාගතයේ බලපෑම් කරන්නට ඉඩ ඇති වර්ධන සාධක සහ සීමා කිරීම් හෙළිදරව් කිරීමට සමත් විය.

මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර වන ගුණාත්මක වාර්තාව (Qualitative Report) 2011 පෙබරවාරි මස දී රක්ෂණ කර්මාන්තය වෙත ඉදිරිපත් කෙරිණි. එමඟින් අවදානම් සංවේදී අවම ප්‍රාග ්ධන ආකෘතියට අදාළ පුළුල් මූලධර්ම හා ව්‍යුහය යෝජනා කරන ලදි. මෙම ගුණාත්මක වාර්තාවේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රයේ සුවිශේෂ ව්‍යුහයට ගැලපෙන්නා වූ අවදානම් සාධක හඳුනා ගැනීමත් ඒවා පැහැදිලි කිරීමත්ය.

තෙවන අදියර වන ප්‍රමාණාත්මක වාර්තාව (Quantitative Report) රක්ෂණ කර්මාන්තයට ඉදිරිපත් කිරීම 2011 ඔක්තෝබර් මස දී සිදු විණි. එහි දී ගුණාත්මක වාර්තාව විසින් නිර්දේශ කරන ලද විවිධ අවදානම් කාණ්ඩ සඳහා වන ප්‍රාග්ධන අය කිරීම් සුදුසු අන්දමින් හඳුනා ගැනීමත් යෝග්‍ය පරිදි ප්‍රමාණාත්මක කිරීමත් කරනු ලැබිණි. රක්ෂකයින්ගේ වත්කම් හා වගකීම් තක්සේරු කිරීමේ ක්‍රමවේදයන්හි ඇතිවන වෙනස්වීම් ද මෙම වාර්තාව විසින් හෙළිදරව් කරන ලදී.

තවද ප්‍රමාණාත්මක වාර්තාව රක්ෂණ කර්මාන්තයට හඳුනාවාදීමේ හමුවක් මණ්ඩලය විසින් සංවිධානය කරන ලද අතර මෙහි දී ඉහත සඳහන් වාර්තා දෙකම පිළිබඳ තම අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් රක්ෂණ කර්මාන්ත සහභාගීවූවන්ට ලබා දෙන ලදී.

මෙම ව්‍යාපෘතියේ උපදේශකවරුන් විසින් 2012 වසරේ මණ්ඩලයේ කාර්යය මණ්ඩලයට පුහුණු වැඩසටහන් පැවැත්විය. රක්ෂණ කර්මාන්තයෙන් ලැබුණු අදහස් අනුව නීතිරීති කෙටුම්පත් (Draft Rules) සංශෝධනය කිරීම ව්‍යාපෘතියේ උපදේශකවරුන් විසින් සිදු කරනු ලැබීය. සැලසුම් කළ පරිදි 2012 තෙවන කාර්තුවේ දී පෙරහුරු පරීක්ෂණ ආරම්භ කළ අතර ඊට අදාළ ආකෘති පත්‍ර ස්වකැමැත්ත මත පිරවීම සඳහා සියළුම රක්ෂණ සමාගම් අතර බෙදා හරින ලදී. ඒ අනුව 2012.09.30 වැනි දිනට රක්ෂණ සමාගම් දහ අටක් ඊට සහභාගී වී ඇත.

## 5. නිශ්චිත ආයෝජනවල අනුකූලතාව අධීක්ෂණය කිරීම

### අ) රජයේ සුරැකුම්පත් හි අයෝජනය කිරීම

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 25 වන පරිච්ඡේදයට අනුව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සඳහා වූ තාක්ෂණික සංචිත වත්කම්වලින් 20% ට නොඅඩු ප්‍රමාණයක් සහ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර සඳහා වූ දිගුකාලීන රක්ෂණ අරමුදල් වත්කම්වලින් 30%කට නොඅඩු ප්‍රමාණයක් රක්ෂකයින් විසින් රජයේ සුරැකුම්පත්වල ආයෝජන ලෙස පවත්වාගෙන යා යුතු වේ. මණ්ඩලය විසින් සියළුම රක්ෂකයින්ගේ 2012 වර්ෂයේ සෑම කාර්තුවකම මාසික අධීක්ෂණයට යටත් වූ රක්ෂකයින් මාසිකවත්, වාර වාර්තා විමර්ශනයට ලක් කරමින් ඉහත කී රෙගුලාසිවලට ඔවුන්ගේ ඇති අනුකූලතා අධීක්ෂණය කරන ලදී. තව ද වාර්තාවල සඳහන් රාජ්‍ය සුරැකුම්පත්හි කරන ලද ආයෝජනවල නිරවද්‍යතාවත්, එම ආයෝජනයන්වල අයිතිය හා හිමිකාරත්වයත් සහතික කර ගැනීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන තැන්පතු පිළිබඳ ප්‍රකාශ මණ්ඩලය විසින් විමර්ශනයට ලක් කරනු ලැබිණි. රාජ්‍ය සුරැකුම්පත් ආයෝජනයන්හි විෂමතා දක්නට ලැබුණු කල්හි ඒවා නිවැරදි කරනු පිණිස අදාළ සමාගම් වෙත දැනුම් දෙන ලදී.

### ආ) නිර්ණයන් අනුව කෙරෙන වෙනත් ආයෝජන

2011 මාර්තු 01 දින දරන නිර්ණය කිරීම් අංක 1 (2011 ඔක්තෝබර් 20 දින සංශෝධිත)ට අනුව සියළුම රක්ෂකයින්විසින් ඔවුන්ගේ තාක්ෂණික සංචිතයන්හි ශේෂව තිබෙන වත්කම් හා දිගුකාලීන රක්ෂණ අරමුදලෙහි ශේෂව තිබෙන වත්කම් පනත ප්‍රකාශයට පත් කර ඇති ආකාරයට ආයෝජනය කිරීම අවශ්‍ය වේ. ඒ අනුව රක්ෂණ සමාගම් විසින් කරන ලද ආයෝජනයන් නිර්ණය කිරීම අංක 10 අනුකූලව පවතීදැයි මණ්ඩලය විසින් අධීක්ෂණය කොට, නිර්ණය කිරීම්වලින් බැහැරව ක්‍රියා කළ අවස්ථා නිවැරදි කරන ලෙස අදාළ සමාගම්වලට උපදෙස් දෙන ලදී.

## 6. ක්ෂේත්‍රගත විමර්ශන

2012 වසර තුළ දී මණ්ඩලය විසින් රක්ෂණ සමාගම් පහක ක්ෂේත්‍රගත විමර්ශනවල යෙදුන අතර එහි දී ඔවුන්ගේ මෙහෙයුම්, පද්ධතීන්, ප්‍රතිපත්ති හා පරිපාටීන් අධීක්ෂණය කොට පනතේ වගන්තිවලට ඒවායේ ඇති අනුකූලතාව තහවුරු කර ගන්නා ලදී. තවදුරටත් අදාළ රක්ෂණ සමාගම්වල කාර්යය හා පරිපාටීන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම පිණිස ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, විගණක කමිටුව/ මණ්ඩලයේ සාමාජිකයන්, ජීවගණකඥයා සහ අභ්‍යන්තර හා බාහිර විගණකයින් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. එයට අමතරව තවදුරටත් වැඩි දියුණු කළ යුතු අංශ පිළිබඳ අවශ්‍ය නිර්දේශයන් ක්ෂේත්‍රගත විමර්ශන වාර්තා මඟින් ඉදිරිපත් කරන ලදී.

## 7. සමාගම්වල ක්‍රියාකාරීත්වය පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවට ඉදිරිපත් කිරීම

රක්ෂණ කර්මාන්තයේ සමස්ථ කාර්යය සාධනය අවබෝධ කර ගැනීම සඳහා 2012 වර්ෂයේ රක්ෂකයින් වෙතින් ලබා ගත් තොරතුරු පදනම් කොටගෙන ඔවුන්ගේ වාරික ආදායම්, ලාභදායීත්වය, ද්‍රවශීලත්වය, ප්‍රාග්ධනය රඳවා ගැනීම් යනාදිය පිළිබඳ අනුපාතයන් ගණනය කරනු ලැබිණි. ඒ අනුව රක්ෂණ සමාග ම්වල මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු කාර්තුමය පදනමින් මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පද්ධති ස්ථායීතා

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීය.

**8. ප්‍රතිරක්ෂණ ක්‍රියාපරිපාටි සමාලෝචනය**

පනතේ විධිවිධානවලට අනුකූලව සියළුම රක්ෂණ සමාගම් සහතික කරන ලද ප්‍රතිරක්ෂණ ගිවිසුම්, කොන්ත්‍රාත්තු හා ක්‍රියා පරිපාටීන් වාර්ෂිකව මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කරන ලද ලියකියවිලි මණ්ඩලය විසින් පරීක්ෂා කිරීමෙන් රක්ෂණ සමාගම්වල අවදානම් අවම කර ගැනීමට ප්‍රමාණවත් තරම් ප්‍රතිරක්ෂකයින් විසින් ප්‍රතිරක්ෂණාවරණ ලබාගෙන ඇතිදැයි තහවුරු කරගනු ලැබිණි. තව ද රක්ෂකයින් විවිධ ප්‍රතිරක්ෂකයින් සමඟ ප්‍රතිරක්ෂණ ක්‍රියාපරිපාටියට ඇතුළුවන විට අදාළ රක්ෂණ සමාගම් පනතේ 31 (1) වගන්තිය යටතේ මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබ ඇති මාර්ගෝපදේශ අනුගමනය නොකළ සමාගම් සඳහා නිවැරදි කිරීම් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.

**9. චක්‍රලේඛ අංක 18 ප්‍රකාරව වාර්ෂික අනුකූලතා සහතික ඉදිරිපත්කිරීම**

සෑම රක්ෂකයෙකු විසින්ම සෑම වසරකම පෙබරවාරි සහ අගෝස්තු 15 දිනට හෝ ඊට පෙර අර්ධ වාර්ෂික අනුකූලතා සහතික මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව 2012 වර්ෂයේ දී මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අනුකූලතා සහතික සමාලෝචනයට ලක් කර පනතෙහි සියලු නෛතික හා නියාමන විධිවිධානවලට අනුකූලව සියලු රක්ෂකයින් කටයුතු කර ඇති බවටත් තව ද, මෙහි දී අනුමැතිය ලත් ප්‍රතිරක්ෂකයින් සමඟ ගිවිසුම් සහ අවබෝධාත්මක ප්‍රතිරක්ෂණ ක්‍රියා පරිපාටීන්වලට ඇතුළත්වීමේ දී මණ්ඩලයේ මාර්ගෝපදේශ අනුගමනය කළ බවත්, නුබුන්වත් ආන්තික නියමයන්ට අනුකූලවන බවටත් සාමාන්‍ය රක්ෂණ ඔප්පු වාරික ගෙවීම් සහතිකවලට අනුකූලවන බවත් මණ්ඩලය විසින් තහවුරු කර ගන්නා ලදී.

**10. රක්ෂණ සමාගම්වල නිර්දේශිත ප්‍රතිපත්ති ප්‍රකාශන සංශෝධනය කිරීම**

රක්ෂණ සමාගම්වල මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කිරීමේ නියමයන් ඇතුලත් නිර්දේශිත ප්‍රතිපත්ති ප්‍රකාශනය වෙනස් කිරීම සඳහා මණ්ඩලය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහයෝගය ඇතිව මණ්ඩලය විසින් සංශෝධනය කරන ලදී. රක්ෂණ ගිවිසුම්වල මූල්‍ය වාර්තා ක්‍රියා පිළිවෙළ 2012 වසරේ SLFRS අනුව සංශෝධනය වීමෙන්, ඉහත සඳහන් පරිදි නිර්දේශිත ප්‍රතිපත්ති ප්‍රකාශන ද සංශෝදනය කිරීමට අවශ්‍ය විය. ඉහත කී සංශෝධනයන්ට අනුරූපව රක්ෂණ සමාගම්වලින් ඒකාකාරී බවින් යුක්තව වැඩිමනක් තොරතුරු මණ්ඩලයට ලබා ගත හැකි වන බැවින් මණ්ඩලයේ කාර්ය භාරයක් වන නියාමන හා අධීක්ෂණ කටයුතු මනා ලෙස ඉටු කිරීමට හැකි වේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතන සංශෝධිත කෙටුම්පත් නිර්දේශිත ප්‍රතිපත්ති ප්‍රකාශන රක්ෂණ කර්මාන්තයේ සහභාගීකරුවන්ගේ ද මණ්ඩලයේ ද එකඟත්වයෙන් අවසන් කරනු ලැබූ අතර එම සංශෝධිත ප්‍රකාශන අනාගතයේ දී රක්ෂණ කර්මාන්තයට බෙදා හැරීමට බලාපොරොත්තු වේ.

## රක්ෂණ තැරැව්කරුවෝ

**1. කාර්තුමය වාර්තා අන්තර්කාලීන මූල්‍ය ප්‍රකාශන සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය**

2010 පෙබරවාරි 25 දින දරණ අංක 1642/16 දරන ගැසට් නිවේදනයේ (පළමු උප ලේඛනය) වගන්ති ප්‍රකාරව සියළුම රක්ෂණ තැරැව්කරුවන් ඔවුන්ගේ කාර්තුමය වාර්තා හා අන්තර්වාර මූල්‍ය ප්‍රකාශන එක් එක් කාර්තුව අවසන් වී දින 45ක් ඇතුළත මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු වේ. එසේ රක්ෂණ තැරැව්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද වාර්තා මණ්ඩලය මඟින් සමාලෝචනය කර එහි දී හඳුනාගනු ලබන අසම්පූර්ණ අංශයන්, වැරදි සහගත ගණනය කිරීම් වෙනස් වූ ආකෘතීන් යනා දී අක්‍රමිකතා පිළිබඳ තැරැව්කරුවන් දැනුවත් කරනු ලබන අතර එයට අදාළ නිවැරදි කිරීම් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙනු ලැබිණි.

රක්ෂණ තැරැව්කරුවන් සිය මූල්‍ය වර්ෂය අවසන්ව සය මසක් ඇතුළත සිය විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු අතර ඔවුන්ගේ මූල්‍ය තත්ත්වය අවබෝධ කර ගැනීම පිණිස එම විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මණ්ඩලය විසින් සමාලෝචනය කරන ලදී.

**2. වාරික එකතු කිරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම**

පනතේ 89 වන පරිච්ඡේදයට අනුව රක්ෂකයන් වෙනුවෙන් රක්ෂණ වාරික එකතු කරනු ලබන රක්ෂණ තැරැව්කරුවන්, එකතු කරනු ලබන රක්ෂණ වාරික දෙසතියක් ඇතුළත ඒ ඒ අදාළ රක්ෂකයන් වෙත ප්‍රේෂණය කළ යුතුය. මෙම විධිවිධානවලට තැරැව්කරුවන්ගේ ඇති අනුකූලතාවය මණ්ඩලය විසින් කාර්තුමය වාර්තා නිරීක්ෂණය කිරීම තුළදීත් ක්ෂේත්‍රගත නිරීක්ෂණයන් තුළිනුත් අධීක්ෂණය කරනු ලබන අතර ඉහත විදිවිධානවලට අනුකූලතාවය නොදැක්වූ තැරැව්කරුවන්ට එරෙහිව අවශ්‍ය පියවර ගනු ලැබිණි.

**3. ක්ෂේත්‍රගත විමර්ශන**

මණ්ඩලයේ නීතිරීතීන්ට අනුකූල ආකාරයෙන් රක්ෂණ තැරැව් ව්‍යාපාරය ක්‍රියාත්මක කරන්නේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා 2012 වසරේ දී මණ්ඩලය විසින් රක්ෂණ තැරැව්කරුවන් හත් දෙනෙකුගේ පරිශ්‍රයන් තුළ දී ක්ෂේත්‍රගත විමර්ශනවල යෙදුනේය. මෙම ක්ෂේත්‍රගත විමර්ශනවල දී හඳුනාගත් අනුකූලතාවයෙන් බැහැරවුණු අවස්ථා නිශ්චිත කාලසීමක් තුළ දී නිවැරදි කිරීමට උපදෙස් ලබා දෙන ලදී.

**4. බලපත්‍ර අළුත් කිරීම**

2013 වසර සඳහා රක්ෂණ තැරැව්කරුවන්ගේ බලපත්‍ර අළුත් කිරීම සඳහා මණ්ඩලය කාර්තුමය වාර්තා හා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඇගයීමකට ලක් කර ඔවුන්ගේ මූල්‍ය තත්ත්වය තහවුරු කරන ලදී.

**5. නව බලපත්‍ර ලබාදීම**

ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරන ලද නව රක්ෂණ තැරැව්කරුවන්ගේ ව්‍යාපාර සැලසුම්, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන, ශුද්ධ ප්‍රාග්ධන තත්ත්වය යනාදිය මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලැබූ අතර අපේක්ෂිත අවශ්‍යතා සම්පූර්ණ කොට තිබූ රක්ෂණ තැරැව්කරුවන් පස් දෙනෙකුට ලියාපදිංචිය ලබා දීම සිදු කරන ලදී.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## නියාමන සමාලෝචනය

### රක්ෂණ සමාගම් ලියාපදිංචි කිරීම

රක්ෂණ සමාගම් ලෙස ලියාපදිංචි වීම සඳහා මෙම වසර තුළ දී ඉල්ලීම් නොලද බැවින් ලියාපදිංචිය ලැබූ රක්ෂකයින්ගේ සංඛ්‍යාව 22ක් ලෙස නොවෙනස්ව පවතී.

ඇමුණුම 1 ඃ මණ්ඩලය මඟින් ලියාපදිංචි කරන ලද සියළු රක්ෂණ සමාගම්වල නාම ලේඛනය හා ඔවුන්ට ක්‍රියා කිරීමට අවසර ලබා දී ඇති රක්ෂණ ව්‍යාපාර පන්ති/පන්තිය දැක්වේ.

### නව රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචි කිරීම සහ රක්ෂණ තැරැව්කාර සමාගම්වල ලියාපදිංචිය අළුත් කිරීම.

මෙම වසර තුළ දී රක්ෂණ තැරැව්කරුවන් වශයෙන් කටයුතු කිරීම සඳහා මණ්ඩලය විසින් සමාගම් 11කට ලියාපදිංචිය ලබා දුනි.

ඉන් සමාගම් හතරක් දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ තැරැව් ව්‍යාපාර කටයුතුවල නියැලීමටත්, එක් සමාගමක් දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නියැලීමටත් ලියාපදිංචිය ලැබූ අතර අනෙක් සමාගම් හය සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ලියාපදිංචිය ලැබූහ.

2013 වසරට ලියාපදිංචිය අළුත් කිරීම සඳහා රක්ෂණ තැරැව්කාර සමාගම් 44කින් ඉල්ලීම් මණ්ඩලයට ලැබුණු අතර, පනතේ අවශ්‍යතා සම්පූර්ණ කර තිබූ නිසා සමාගම් 44 ම ලියාපදිංචිය අළුත් කිරීමට පියවර ගන්නා ලදී.

2012 වසරට සිය ලියාපදිංචිය අළුත් කිරීම සඳහා එක් රක්ෂණ තැරැව්කාර සමාගමක් විසින් කරන ලද ඉල්ලීම, ඔවුන්ගේ පාලිත සමාගම් නියෝජ්‍ය සභාපතිවරයා, රක්ෂණ සමාගමක අධ්‍යක්ෂවරයකු ලෙස ද කටයුතු කිරීම හේතුවෙන් පනතේ 84 (i) (ඇ) (ii) වගන්තියට අනුව ප්‍රතික්ෂේප කරන ලදී.

එකී 84 (i) (ඇ) (ii) වගන්තිය ප්‍රකාරව, රක්ෂණ තැරැව්කරුගේ අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන නිලධරයා; හෝ ඒ තැරැව්කරුගේ උප සමාගමක, හවුල්කාර සමාගමක හෝ පාලිත සමාගමක අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන විධායක නිලධාරියකු, රක්ෂකයකුගේ අධ්‍යක්ෂවරයකු හෝ කොටස් හිමියකු හෝ සේවා නියුක්තකයෙකු වන අවස්ථාවක මණ්ඩලය විසින් තැරැව්කරුවකුගේ ලියාපදිංචිය අත්හිටුවීම හෝ අවලංගු කිරීම හෝ තැරැව්කරු වෙත නිකුත් කරන ලද සහතිකයක් අළුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ කළ හැකිය.

ඇමුණුම II ඃ මණ්ඩලයේ ලියාපදිංචි සියළු රක්ෂණ තැරැව්කාර සමාගම්වල නාම ලේඛනය හා ඔවුන්ට ක්‍රියා කිරීමට අවසර දී ඇති රක්ෂණ තැරැව්කාර පන්ති / පන්තිය දැක්වේ.

### බලාත්මක කිරීමේ ක්‍රියාවලිය

### රක්ෂණ සමාගම්

#### අත්හිටුවීම්

මේ වසර තුළ දී මණ්ඩලය විසින් කිසිදු අත්හිටුවීමක් පනවා නැත. එහෙත් 2009 වසරේදී සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් වෙත පනවා ඇති අත්හිටුවීම තවදුරටත් ක්‍රියාත්මකව පවතී.

අංක SC (FR) 191/09 දරණ මූලික අයිතිවාසිකම් නඩුවේ දී ශ්‍රේෂ්ඨාධිකරණය ලබාදුන් නියෝගය අනුව යමින් සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් වෙත ඉදිරිපත් කරනු ලබන අව්‍යාජ රක්ෂණ හිමිකම් ඉල්ලීම් ක්‍රමවත්ව බේරුම් කිරීම සඳහා එකී සමාගමේ වත්කම් බැහැර කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා මණ්ඩලය විසින් සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹෙන ලදී.

#### විධාන

රුපියල් මිලියන 500ක අවම ශුද්ධ ප්‍රාග්ධනයක් පවත්වාගෙන යාමේ කොන්දේසියකට යටත් කොට ලියාපදිංචිය ලබාදුන් රක්ෂණ සමාගමකට, ඔවුන්ගේ වර්තමාන ශුද්ධ ප්‍රාග්ධනය රුපියල් මිලියන 500 දක්වා වැඩි කිරීම සඳහා අතිරේක ප්‍රාග්ධනයක් 2013 පෙබරවාරි මස අග වන විට ආවිලයනය කරන ලෙසට විධානයක් පනතේ 18(7) වගන්තිය යටතේ මණ්ඩලය විසින් නිකුත් කරන ලදී.

පනතේ 18(7) වගන්තියට අනුව එම වගන්තියේ (1) හා (2) වන උප වගන්තිවල දැක්වෙන විධිවිධාන කෙසේ වුවද, මෙම පනත යටතේ රක්ෂණකරුවකු වෙත නිකුත් කරන ලද බලපත්‍රයක් 18(1) වන උප වගන්තියෙහි සඳහන් කවර හෝ එක් හේතුවක් හෝ ඊට වැඩි හේතු ගණනාවක් මත අවලංගු කිරීමක් හෝ අත්හිටුවීමක් කිරීම වෙනුවට සහ එකී 18(1) වන උප වගන්තියෙහි සඳහන් හා ඒ රක්ෂණකරු විසින් සිදු කරන ලද ක්‍රියාවේ හෝ නොකර හැරීමේ ස්වභාවය, බලපත්‍රය අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට තුඩුදෙන ස්වභාවයේ ක්‍රියාවක් හෝ නොකර හැරීමක් නොවන අවස්ථාවක

අ) ඒ ක්‍රියාව හෝ නොකර හැරීම පැවැත්වීම වැළැක්වීම; හා

ආ) ඒ ක්‍රියාවේ හෝ නොකර හැරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූ විපාක යථාවත් කිරීම හා නිවැරදි කිරීම

පිණිස මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් පියවර ගන්නා ලෙස රක්ෂණකරුවාට විධාන කරනු ලැබිය හැකිය.

වෙනත් රක්ෂණ සමාගමක 2007 වසරේ සිට පැවති මූල්‍ය තත්ත්වය හා ඔවුන් සිය ව්‍යාපාර කටයුතු පවත්වාගෙන ගිය ආකාරය සුපරීක්ෂාකාරීව සලකා බැලීමෙන් අනතුරුව, එකී සමාගමේ මූල්‍ය ස්ථාවරත්වය හා ස්ථිරසාරත්වය යහපත්ව පවත්වාගෙන යාමේ අරමුණින් යුතුව මණ්ඩලය විසින් එම සමාගමට පනතේ 57 වගන්තියට අනුව විධාන නිකුත් කර ඇත.

මහජනතාවට හෝ ජාතික වශයෙන් හෝ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම්වලට හෝ හානිදායක වන්නා වූ ආකාරයකින් කිසියම් රක්ෂකයකු කටයුතු කරන්නේ නම් ඔවුන්ට විධාන නිකුත් කරන්නට පනතේ 57 වන වගන්තියෙන් මණ්ඩලයට බලය පැවරේ.

ඉහත සඳහන් කරුණුවලට අමතරව, රක්ෂණ සමාගම්වලට මින් පෙර නිකුත් කොට ඇති විධානයන්ට අනුව ඒවා කටයුතු කරන්නේ ද යන්න විමර්ශනය කිරීම මණ්ඩලය විසින් නිරන්තරයෙන් හා දැඩිව කරනු ලැබේ.

#### අවවාද කිරීම්

පනතේ 26 සහ 29 වන වගන්තිවලට අනුකූලව ක්‍රියා කරන්නට අසමත් වූ රක්ෂණ සමාගමකට මණ්ඩලය විසින් අවවාද ලිපියක් යවා ඇත.

තත් කාර්ය සඳහා සාදන ලද රීති මඟින් රක්ෂණ ව්‍යාපාරයේ එක් එක් පන්තියක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් මුදලක ණය ගෙවීමේ හැකියාවේ සීමාවක් සෑම රක්ෂණකරුවකු විසින්ම ඒ එක් එක් පන්තියක් සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලැබීම පනතේ 26 වන වගන්තියට අනුව අවශ්‍ය වේ.

පනතේ 29 වගන්තියට අනුව, මණ්ඩලයේ පූර්ව අනුමැතිය ඇතිව හැර, යම් රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂධූරය දරන යම් තැනැත්තෙකුට හෝ තැනැත්තා එවැනි යම් තනතුරක් දරන යම් සමාගමකට හෝ රක්ෂණකරු විසින් නිකුත් කරන ලද ජීවිත රක්ෂණ ඔප්පුවක් උකස් කිරීම මත වූ ණයක් නොවන යම් ණයක් ඒ රක්ෂණකරු විසින් ප්‍රදානය කරනු නොලැබිය යුතුය. ඒ ණය

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

ආපසු ගෙවීම සඳහා ප්‍රමාණවත් ඇපයක් දී ඇති බවට මණ්ඩලය සෑහීමකට පත් වන්නේ නම් පමණක් මණ්ඩලය විසින් ඉහත කී අනුමැතිය දෙනු ලැබිය යුතුය.

තවද, රක්ෂණ තැරැව්කාර සමාගමක් වශයෙන් මණ්ඩලය යටතේ ලියාපදිංචිය ලැබීමට පෙර එකී සමාගම සමඟ රක්ෂණ ව්‍යාපාර කටයුතුවල නිරතවීමෙන් පනතේ 34 වගන්තිය උල්ලංඝනය කළ රක්ෂණ සමාගම් 03 කට මණ්ඩලය විසින් අවවාද කිරීම් කරනු ලැබිණි.

පනතේ 34 වගන්තියට අනුව,

34. කිසිම රක්ෂණකරුවකු විසින්,

(අ) රක්ෂණයේ විෂය කාරණයෙහිලා රක්ෂණීය අයිතිවාසිකමක් ඇති යම් තැනැත්තකුගෙන්;

(ආ) ප්‍රතිරක්ෂණය සම්බන්ධයෙන් වෙනත් රක්ෂණකරුවකුගෙන්;

(ඇ) රක්ෂණ නියෝජිතයෙකුගෙන්; හෝ

(ඈ) මේ පනත යටතේ ලියාපදිංචිය කරන ලද රක්ෂණ තැරැව්කරුවකුගෙන්

හැර, රක්ෂණ කටයුතු කිසිවක් භාර ගනු නොලැබිය යුතුය.

## රක්ෂණ තැරැව්කාර සමාගම්

### අවවාද කිරීම්

පනතේ 86 වගන්තියට අනුකූලව ක්‍රියා කරන්නට අසමත් වූ රක්ෂණ තැරැව්කාර සමාගම් 02කට පනතේ 84 (1) (ඈ) වගන්තිය යටතේ මණ්ඩලය විසින් අවවාද ලිපි යවා ඇත.

පනතේ 86 (1) වගන්තිය සමඟ කියැවෙන, 2010 පෙබරවාරි 25 දිනැති අංක 1642/16 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 07 වන රීතියෙහි දක්වා ඇති වෙනත් කරුණු අතර දැක්වෙන්නේ සෑම රක්ෂණ තැරැව්කරුවකු විසින්ම තැරැව්කාර සමාගමේ ප්‍රධාන නිලධාරියා සහ සමාගම් අධ්‍යක්ෂවරයකු විසින් සහතික කරනු ලැබූ කාර්තුමය වාර්තාව එක් එක් කාර්තුව අවසානයේ සිට දින 45ක් ඇතුළත දී මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු බවය.

මණ්ඩලය යටතේ ලියාපදිංචිය ලබා ගැනීමට ප්‍රථමයෙන් රක්ෂණ තැරැව්කාර ගනුදෙනු කටයුතු සිදු කිරීම මගින් පනතේ 79 වගන්තියට පටහැනි වන ලෙස ක්‍රියා කිරීම සහ ලියාපදිංචිය ලබා ගන්නා අවස්ථාවේ දී මණ්ඩලය වෙත නොමඟ යවන සුළු හා වැරදි සහගත තොරතුරු ලබාදීම හේතුවෙන් රක්ෂණ තැරැව්කාර සමාගමක් වෙත පනතේ 84 (1) (ඈ) වගන්තිය යටතේ මණ්ඩලය විසින් ප්‍රථම සහ අවසාන අවවාදය ලබා දී ඇත.

පනතේ 79 වගන්තිය මගින්, කිසිම තැනැත්තකු ඒ තැනැත්තා මණ්ඩලය විසින් ප්‍රදානය කරන ලද තැරැව්කරුවකු වශයෙන් ලියාපදිංචි කිරීමේ සහතිකයක් දරන්නකු නම් හා මණ්ඩලය විසින් අනුමත කරන ලද රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමයක සාමාජිකයකු වන්නේ නම් මිස, රක්ෂණ තැරැව්කරුවකු වශයෙන් ක්‍රියාකිරීම හෝ එලෙස පෙනී සිටීම හෝ තහනම් කර ඇත.

තවද, පනතේ 86 (2) වගන්තිය උල්ලංඝනය කළ රක්ෂණ තැරැව්කාර සමාගම් 2 කට පනතේ 84 (1) (ඈ) වගන්තිය යටතේ මණ්ඩලය විසින් අවවාද ලිපි යවා ඇත.

පනතේ 86 (2) වගන්තිය ප්‍රකාරව, සෑම තැරැව්කරුවකු විසින්ම ගිණුම් කාලසීමාව ඉකුත්ව මාස හයක් ඇතුළත, ඒ ගිණුම් ශේෂ පත්‍රයකින් ද, ලාභාලාභ ගිණුමකින් ද, ගිණුම් පිළිබඳ සටහනකින් ද, සමන්විත සුදුසුකම් ලත් විගණකවරයකු විසින් සහතික කරන ලද විගණනය කරනු ලැබූ ගිණුම්, මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

පනතේ 89 වන වගන්තියට අනුකූලව ක්‍රියා කරන්නට අසමත් වූ තව එක් රක්ෂණ තැරැව්කාර සමාගමකට පනතේ 84 (1) (ඈ) වගන්තිය යටතේ මණ්ඩලය විසින් අවසාන අවවාද ලිපියක් නිකුත් කර ඇත.

රක්ෂණ සමාගම් වෙනුවෙන් රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් එකතු කරනු ලබන වාරික මුදල් එසේ එකතු කිරීමෙන් සති දෙකක් ඇතුළත දී අදාළ රක්ෂණ සමාගම වෙත ප්‍රේෂණය කරනු ලැබීමේ අවශ්‍යතාවය පනතේ 89 වන වගන්තියේ සඳහන් වෙනත් කරුණු අතර දක්වා ඇත.

පනතේ 84 (1) (ඈ) වගන්තිය අනුව යම්කිසි තැරැව්කාර සමාගමකට මණ්ඩලය විසින් යටත් පිරිසෙයින් වෙන් වෙන් අවස්ථා තුනක දී අවවාද කරනු ලැබ තිබේ නම් එම සමාගමේ ලියාපදිංචිය අත්හිටුවීම, අවලංගු කිරීම හෝ ලියාපදිංචිය අළුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා බලය මණ්ඩලය සතු වේ.

### විධාන

පනතේ 96 (අ) වගන්තිය ප්‍රකාරව රක්ෂණ තැරැව්කාර සමාගම් 07කට 'රක්ෂණ තැරැව්කරු' යන යෙදුම ඔවුන්ගේ සමාගම් නාමයේ කොටසක් ලෙස ඇතුළත් කළ යුතු බවට නිර්දේශ කරමින් මණ්ඩලය විසින් විධාන නිකුත් කරන ලදී. ඊට අනුකූලව කටයුතු කිරීම සඳහා එකී සමාගම් වෙත සාධාරණ කාල සීමාවක් ප්‍රදානය කර ඇත.

96 (අ) වගන්තිය මගින්, රක්ෂණ ඔප්පු දරන්නන්ගේ සහ අනාගත රක්ෂණ ඔප්පු දරන්නන්ගේ සම්බන්ධතාවය ආරක්ෂා කිරීමේ අරමුණින්, මණ්ඩලය විසින් රක්ෂණකරුවන්, තැරැව්කරුවන් සහ අලාභ ගැලපුම්කරුවන් වෙත විධාන නිකුත් කිරීමට මණ්ඩලය වෙත බලය ලබා දී ඇති අතර, එම විධානවලට අනුකූලවීම, අවස්ථානෝචිත පරිදි එවැනි සෑම රක්ෂණකරුවකු, තැරැව්කරුවකු සහ අලාභ ගැලපුම්කරුවකුගේම කාර්යය වේ.

## නියාමන/උපදේශනාත්මක ක්‍රියා මාර්ග

1. ජාත්‍යන්තර සාමුද්‍රික සංවිධානය විසින් හඳුනාගෙන නම් කරන ලද ඉහළ අවදානම් සහිත ප්‍රදේශවල යාත්‍රා කරන වෙළඳ නෞකා සඳහා අවදානම් අවම කර ගැනීමේ ක්‍රමෝපායයන් සපයන සමාගමක්, පැහැර ගැනීම හා කප්පම් සිද්ධීන් ආවරණය කෙරෙන රක්ෂණයක් විදේශ රක්ෂකයෙකුගෙන් ලබා ගන්නට මණ්ඩලයෙන් අවසර පැතුවේ එවැනි රක්ෂණාවරණයක් කිසිදු දේශීය රක්ෂණ සමාගමක් නොසපයන බැවි මණ්ඩලය දැනුවත් කරමිනි.

   අදාළ සමාගමෙන් සැපයෙන ක්‍රමෝපායයන් අතර අවදානම තක්සේරු කිරීම සහ අවිගත් ආරක්ෂක භටයන් වැනි අවදානම අවම කිරීමේ පුද්ගලයන් සැපයීම වේ.

   එම කරුණු ගැන සලකා බැලූ මණ්ඩලය පනතේ 101 (1) වගන්තියේ විධිවිධානයන්ට අනුව එම සමාගමට එවැනි ආවරණයක් අවුරුදු දෙකක කාලයක් සඳහා විදේශ රක්ෂකයෙකුගෙන් ලබා ගැනීමට අවසර දීමට තීරණය කළේය.

   ප්‍රතිරක්ෂණයේ දී හැර පනතේ 101 (1) වගන්තිය ප්‍රකාරව කිසිදු ශ්‍රී ලාංකිකයකුට, කෙලින්ම හෝ වක්‍රාකාරයෙන්, මණ්ඩලයේ පූර්ව ලිඛිත අවසරය ලබා ගැනීමෙන් තොරව, පනත යටතේ ලියාපදිංචි නොවූ රක්ෂණ සමාගමක් සමඟ රක්ෂණ ව්‍යාපාර කටයුතුවල යෙදිය නොහැක.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

විදේශ රක්ෂකයින් සමඟ රක්ෂණ ව්‍යාපාර කටයුතුවල යෙදීම සඳහා කෙරෙන ඉල්ලීමකට අනුමැතිය ලබාදීමේ දී මණ්ඩලය පනතේ 101 (2) වගන්තියට අනුව යමින් ජාතික අවශ්‍යතා හා රක්ෂණ කර්මාන්තය සම්බන්ධව රජයේ ප්‍රතිපත්ති සැලකිල්ලට ගනී.

2. පනතේ 57 (2) වගන්තිය ප්‍රකාරව මීට ඉහත දී නිකුත් කරන ලද විධානයක් අවලංගු කරමින් රක්ෂණ මණ්ඩලය විසින් එක්තරා රක්ෂණ සමාගමකට තම වාර්තා ඉදිරිපත් කිරීම මාසිකව නොව කාර්තු වශයෙන් ඉදිරිපත් කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

   මෙය සිදු කරන ලද්දේ අදාළ සමාගම සිය ණය ගෙවීමේ හැකියාවේ සීමා නිසි පරිදි සිය වාර්තා ඉදිරිපත් කළ කාලය තුළ දී පවත්වා ගත් බැවිනි.

   පනතේ 57 (2) වගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින් පනතේ 57 (1) වගන්තිය යටතේ නිකුත් කරන ලද විධානයක් වෙනස් කිරීමට හෝ අවලංගු කිරීමට බලය ඇති අතර යම් යෝජනාවක් ඉදිරිපත් වූ අවස්ථාවල දී එම වෙනස් කිරීම හෝ අවලංගු කිරීම මඟින් මණ්ඩලයට සුදුසු යැයි හැඟෙන කොන්දේසි පැනවිය හැකිය.

3. එක්තරා ගිණුම් සමාගමක් (ශ්‍රී ලංකා ශාඛාව) ඔවුන්ගේ ශ්‍රී ලංකාව තුළ සේවය සඳහා වෘත්තීය වන්දි රක්ෂණාවරණයක් (professional indemnity) විදේශ රක්ෂකයකුගෙන් 2012/2013 වසර සඳහා ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කළේය. මෙය එම ආයතනයේ මව් සමාගම විසින් ලෝකය පුරා පිහිටි එම ශාඛා ආයතන සියල්ල සඳහා සැලසුම් කොට තිබුණකි. නමුත්, අදාළ ඉල්ලීමට මණ්ඩලය අනුමැතිය ලබා නොදුන් අතර අදාළ සමාගම් ශාඛාවට එම වෘත්තිය වන්දි රක්ෂණාවරණය මණ්ඩලය සමඟ ලියාපදිංචි රක්ෂණ සමාගමකින් ලබා ගන්නා ලෙසට නියෝග කරන ලදී.

4. පනතේ සංශෝධන සමඟ අනුගතවීම සඳහා රක්ෂණ තැරැව්කරුවන්ගේ නැවත ලියාපදිංචිවීම සඳහා අයදුම්පත් මණ්ඩලය මඟින් සංශෝධනය කරන ලදී. අයදුම්පත සඳහා නැවත ලියාපදිංචිය ලබාදීමට පෙර එම අයදුම්පත සමාගම විසින් කැඳවාගත් විට දී අදාළ නැවත ලියාපදිංචි ගාස්තුවෙන් 50%ක් පමණක් ලබා දෙනු ලැබේ.

5. එක්තරා රක්ෂණ සමාගමක් විසින් මාලදිවයින් රුපියල් මිලියන 10ක් ආයෝජනය කරමින් මාලදිවයිනේ යෝජිත රක්ෂණ උප සමාගමක් ලියාපදිංචි කිරීමටත්, එකී රක්ෂණ සමාගමේ ශාඛා ආයතනය සතු වත්කම් හා වගකීම් මාලදිවයින් උප සමාගමට පැවරීමට විමසීමක් කරන ලදී. 2005 ඔක්තෝබර් 12 වන දින අංක 1414/19 දරන ගැසට් පත්‍රයේ පල කරන ලද රක්ෂණ මණ්ඩලයේ රෙගුලාසිවල 4 වන රෙගුලාසි සමඟ කියවිය යුතු පනතේ 25 වගන්තිය අනුව, මණ්ඩලය විසින් අදාළ ආයෝජනයට හා වත්කම්/වගකීම් පැවරීමට, එම සමාගම විසින් ලබාදුන් පොරොන්දුවලට යටත්ව, අනුමැතිය ලබා දෙන ලදී.

   පනතේ 25 (3) වගන්තියට අනුව, මණ්ඩලයෙන් ලබා ගන්නා ලද විශේෂිත අනුමැතියකින් හැර මිස, යම් රක්ෂණ සමාගමක් සතු සංචිතයක හෝ අරමුදලක වත්කම් සහ ඒ රක්ෂණකරුගේ වෙනත් සියළු වත්කම්, ශ්‍රී ලංකාවෙහිම තබා ගත යුතුය.

   2005 ඔක්තෝබර් 12 දින අංක 1414/19 දරන ගැසට් පත්‍රයේ පල කරන ලද රෙගුලාසිවල 4 වන රෙගුලාසිය මඟින් යම් රක්ෂණ සමාගමකට සිය වත්කම් ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වා ගැනීම සඳහා සීමා සහ ආයෝජන වර්ග මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කර ඇත.

6. 2011 අංක 03 දරන සංශෝධිත පනත මඟින් හඳුන්වා දෙන ලද නව විධිවිධාන ප්‍රකාර අධ්‍යක්ෂවරු පත් කිරීම සම්බන්ධයෙන් රක්ෂණ සමාගම්වලින් ඉල්ලුම්පත් ගණනාවක්ම මණ්ඩලය වෙත මෙම වර්ෂයේ දී යොමු කර ඇත.

7. එක්තරා රක්ෂණ තැරැව්කාර සමාගමක සේවකයෙක් ඔහු විසින් සියළු රක්ෂණ සමාගම් නියෝජනය කරන බවට ප්‍රකාශ කරමින් රථ වාහන රක්ෂණ සේවා තරඟකාරී මිලකට ලබා දෙන බවට තමාව හඳුන්වාදීම, ඉදිරියේ දී නැවැත්වීමට හා තම සේවකයාට අවවාද කිරීමට මණ්ඩලය විසින් උපදෙස් දෙන ලදී.

8. එක්තරා සමාගමක් මඟින් රක්ෂණ තැරැව්කාර සමාගමක් ලෙස ලියාපදිංචිවීම සඳහා ඉදිරිපත් වූ අයදුම්පත, නියමිත මූල්‍යමය තත්ත්වයන් ප්‍රකාශයට පත් කිරීමේ නොහැකියාවේ පදනම මත, මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

9. පසුගිය අවුරුදුවල මණ්ඩලය වෙත යොමු කරන ලද රක්ෂණ තැරැව්කාර සමාගමක් ලෙස ලියාපදිංචිවීම සඳහා අයදුම්පත් විශාල සංඛ්‍යාව කෙරෙහි අවධානය යොමු කරමින්, එම නව ලියාපදිංචි අයදුම්පත් භාර ගැනීම 2012 අප්‍රේල් 27 දින සිට බලාත්මක වන පරිදි නැවත දැනුම් දෙන තුරු තාවකාලිකව නවතා දැමීමට මණ්ඩලය තීරණය කරන ලදී. රක්ෂණ ක්ෂේත්‍රයේ පුද්ගලයන් සමඟ පවත්වන ලද උපදේශනාත්මක සාකච්ඡා මඟින් මෙම පියවර ගන්නා ලදී.

### නියාමන ප්‍රතිසංස්කරණ

#### පනතට කරන ලද සංශෝධන

පනතට කරන ලද සංශෝධන යෝජනා මණ්ඩලය මඟින් අනුමැතිය සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට යොමු කරන ලදී. එම යෝජනා මඟින් මණ්ඩලයේ නම 'රක්ෂණ නියාමන කොමිසම' ලෙස වෙනස් කිරීම සහ එක් රක්ෂණ නියෝජිතයකු හට එක් දිගුකාලීන රක්ෂකයකු හා එක් සාමාන්‍ය රක්ෂකයකු සමඟ කටයුතු කිරීමට අවසර ලබාදීම යන කාරණා කෙරෙහි අවධානය යොමු කරයි.

#### රීති සංශෝධනය

2002 සැප්තැම්බර් 24 දිනැති අංක 1255/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද ණය ගෙවීමේ හැකියාවේ සීමා (දිගුකාලීන රක්ෂණය) රීති සහ 2004 මැයි 17 දිනැති අංක 1341/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද ණය ගෙවීමේ හැකියාවේ සීමා (සාමාන්‍ය රක්ෂණ) රීති, මණ්ඩලය විසින් ප්‍රතිසංශෝධනයට ලක් කරන ලදී. වේගයෙන් වෙනස් වන්නා වූ ලෝකයේ රක්ෂණ කර්මාන්තයේ සහ වාණිජ කටයුතු ප්‍රවණතාවල වෙනස් වන්නා වූ අවශ්‍යතා සපුරාලීම පිණිස මණ්ඩලය විසින් ණය ගෙවීමේ හැකියාවේ සීමා රීති ප්‍රතිසංශෝධනයට ලක් කොට ඇත. 2011 අප්‍රේල් මස 01 දින සිට බලාත්මක වන පරිදි මෙම ප්‍රතිශෝධන 2011 මාර්තු 18 දිනැති අංක 1697/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලදී. මෙම ණය ගෙවීමේ හැකියාවේ සීමා රීති තවදුරටත් සංශෝධනය කර 2012 ජූලි 24 දිනැති අංක 1768/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලදී.

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ලියාපදිංචි ණය වර්ගීකරණ ආයතන හා අන්තර්ජාතිකව පිළිගත් ණය වර්ගීකරණ ආයතන මණ්ඩලයේ අනුමැතිය අනුව හඳුනා

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

ගැනීම උදෙසා මෙම සංශෝධන ගෙන එන ලදී. මෙය ණය ගෙවීමේ හැකියාවේ සීමාරීති යටතේ පෙරදී හඳුනාගත් ණය වර්ගීකරණ ආයතන සඳහා සිදු කරන ලද එක් කිරීමක් වේ.

එකී සංශෝධන මගින් ණය ගෙවීමේ හැකියාවේ සීමා නිර්ණය කිරීම සඳහා, කොටස් හුවමාරුවක ලයිස්තුගත කරන ලද සමාගමක් විසින් නිකුත් කරනු ලබන ආයෝජන වර්ගීකරණයක් සහිත වත්කම් මත පදනම් වූ සුරැකුම්පත් පිළිගත හැකි වත්කමක් ලෙස වැඩිදුරටත් හඳුනාගෙන ඇත.

තවද, ආයතනික නියෝජිතයන් හා අලාභ ගලපන්නන් නියාමනය සඳහා පනතේ VIII සහ VIII (අ) කොටස් යටතේ රීති කෙටුම්පත් කර ඇත.

### නිශ්චය සඳහා සංශෝධන සහ නව නිශ්චයන් හඳුන්වාදීම

දිගුකාලීන රක්ෂණ අරමුදල් හා තාක්ෂණික සංචිතයන් ගෙන් අපේක්ෂිත අවම ප්‍රමාණයක රජයේ සුරැකුම් හි ආයෝජනය කිරීමෙන් පසුව ශේෂ වන වත්කම් ආයෝජනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙළ අවධාරණය කොට දක්වනු ලබන අංක 01 දරන නිශ්චය, ණය ගෙවීමේ හැකියාවේ සීමා රීතිවලට කළ සංශෝධන බලාත්මක කිරීම පිණිස සංශෝධනය කරන ලදී.

රක්ෂණ සමාගම් විසින් මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන වාර්ෂික වාර්තා සම්බන්ධව පනතේ 47 (1) සහ 56 වගන්තින් යටතේ මණ්ඩලය විසින් 2012 මාර්තු 30 දිනැති අංක 14 දරන නිශ්චය පනවන ලදී. ඒ අනුව, සෑම රක්ෂණ සමාගමක්ම, 2011 ජනවාරි පළමු දිනයෙන් ආරම්භ වන සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම වූ සිය වාර්ෂික වාර්තාව ප්‍රතිශෝධිත ආකෘතිය (එනම්, ණය ගෙවීමේ හැකියාවේ සීමා රීතිවලට සිදු කළ සංශෝධන හා සමගාමී වනු පිණිස සංශෝධිත ආකෘතිය) යටතේ සකස් කොට මූල්‍ය වර්ෂය අවසානයේ සිට හය මසක් ඇතුළත දී ඔවුන්ගේ රාජ්‍ය සුරැකුම්පත් ආයෝජනයන් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවෙන් නිකුත් කරන තැන්පතු පිළිබඳ ප්‍රකාශය ද සමඟ මණ්ඩලය වෙත යොමු කිරීම අනිවාර්ය්‍යය වේ.

2011 දෙසැම්බර් 31 න් අවසාන වන මූල්‍ය වර්ෂය සඳහා වූ ප්‍රථම ඉදිරිපත් කිරීම 2012 ජුනි 30 හෝ ඊට ප්‍රථම සිදු කිරීම අවශ්‍ය විය.

2002 ඔක්තෝබර් 30 දිනැති අංක 6 දරන නිශ්චය අහෝසි කරන ලද අතර පනතේ 48 (1) වගන්තිය යටතේ 2012 මාර්තු 30 දිනැති අංක 15 දරන නිශ්චය රක්ෂණ සමාගම්වල ජීව ගණකවරයාගේ සාරාංශ වාර්තාව සම්බන්ධයෙන් මණ්ඩලය විසින් හඳුන්වා දී ඇත. එකී නිශ්චයට අනුව, 2011 ජනවාරි පළමු දිනයෙන් ආරම්භ වන සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ නිරත සියළු රක්ෂණ සමාගම් විසින් ප්‍රතිශෝධිත ආකෘතියට (ණය ගෙවීමේ හැකියාවේ සීමා රීතිවලට සිදු කළ සංශෝධන හා සමගාමී වනු පිණිස) අනුකූල වන සේ ජීව ගණකවරයකු ලවා සාරාංශ වාර්තාව සකස් කර මූල්‍ය වර්ෂය අවසානයේ සිට හය මසක් ඇතුළත දී මණ්ඩලය වෙත යොමු කිරීම අනිවාර්ය වේ. 2011 දෙසැම්බර් 31 න් අවසාන වන මූල්‍ය වර්ෂය සඳහා වූ ප්‍රථම ඉදිරිපත් කිරීම 2012 ජුනි 30 හෝ ඊට ප්‍රථම සිදු කිරීම අවශ්‍ය විය.

### රෙගුලාසි සඳහා සංශෝධන

රක්ෂකයින් විසින් ගෙවිය යුතු වාර්ෂික ගාස්තු හා ලියාපදිංචි ගාස්තු පිළිබඳ අංක 1414/19 දරණ සහ 2005 ඔක්තෝබර් 12 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලද රෙගුලාසි සංශෝධනය කරන ලදී. එක් රක්ෂණ ව්‍යාපාර පන්තියක් සඳහා ලියාපදිංචි ගාස්තුව රුපියල් 250,000.00 සිට රුපියල් 500,000.00 ට වැඩි කරන ලදී. එක් රක්ෂණ ව්‍යාපාර පන්තියක් සඳහා වාර්ෂික ගාස්තුව, ව්‍යාපාර කටයුතු ඇරඹූ ප්‍රථම ලිත් වර්ෂය සඳහා රුපියල් 100,000.00 දක්වා ද, දෙවන ලිත් වර්ෂය ඇරඹීමෙන් පසු එක් ව්‍යාපාර පන්තියකට රුපියල් 200,000.00 හෝ කලින් වර්ෂයේ එක් එක් ව්‍යාපාර පන්තියේ දළ ලිඛිත වාරිකයෙන් 0.075% හෝ යන දෙකින් වැඩි ප්‍රමාණය ලෙසට වාර්ෂික ගාස්තු සංශෝධනය කොට ඇත.

### ප්‍රතිරක්ෂක ගිවිසුම් සඳහා වන නියම හා කොන්දේසි සංශෝධනය

මණ්ඩලය විසින් නිකුත්කරන ලද ප්‍රතිරක්ෂණ ගිවිසුම් සඳහා වන නියම හා කොන්දේසි (සියලුම රක්ෂකයන් සඳහා 2003.03.31 සිට වලංගු වන) 2013 වසර සඳහා වලංගුවන පරිදි සංශෝධනය කරන ලද්දේ මෙරට රකෂණ සමාගම් වල ප්‍රතිරක්ෂණ ගිවිසුම් ශක්තිමත් කරන අරමුණ ඇතිවය.

ප්‍රතිරක්ෂණ ගිවිසුම් සඳහා වන යෝජිත නියම හා කොන්දේසි වල ප්‍රධාන ලක්ෂණ පහත පරිදි වේ.

1. පිළිගත් වර්ගීකරණ ආයතන මගින් වර්ගකරන ලද ආයතන පමණක් පිළිගැනීම;
2. ප්‍රතිරක්ෂකයාගේ වර්ගීකරණ කාණ්ඩය (ණය වර්ගීකරණය හෝ මූල්‍යමය ශක්තිය අනුව වර්ගීකරණය) පිළිබඳ වඩාත් පැහැදිලි බවක් ලබාදීම; සහ
3. ප්‍රතිරක්ෂකයාගේ වර්ගීකරණය පිළිගත හැකි කාලසීමාව (මාස 18ක්) මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කිරීම.

පනතේ 31 (1) වගන්තිය ප්‍රකාරව, පනවන ලද සංශෝධිත ප්‍රතිරක්ෂණ නියම හා කොන්දේසි මගින් රක්ෂකයන් හට වාර්ථා කිරීම සඳහා නව ආකෘති හඳුන්වා දෙන ලදී.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## විමර්ශනාත්මක සමාලෝචනය


රක්ෂණ සහතික දරන්නන්ගේ හා අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම මණ්ඩලයේ සමස්ථ අරමුණු වලින් එකක් වන අතර එය පනතේ 3 වගන්තියෙහි සඳහන් ව්‍යාවස්ථාපිත වගකීමකි.


ඒ අනුව රක්ෂණ ඔප්පුවක් යටතේ යම් රක්ෂිතයකුට තමන්ගේ හිමිකමක් ගෙවීම සම්බන්ධයෙන් රක්ෂණ සමාගම හා ගැටළුවක් පැන නැගුන විටදී එම රක්ෂිතගේ කැමැත්ත මත අදාල ආරවුල මණ්ඩලය වෙත යොමු කළ හැක. මේ සම්බන්ධයෙන් පනතේ 98 වන වගන්තියේ දක්වා ඇත.

සමාලෝචනයට පාත්‍රවන්නා වූ වර්ෂය තුළදී මණ්ඩලයට ලැබුණු මුළු පැමිණිලි 274 කින් පැමිණිලි 262 ක් විසඳා ඇත.

| සාමාන්‍ය | ගණන | ජීවිත | ගණන | රක්ෂණ නියෝජිත හා බැඳුනු | ගණන |
|---|---|---|---|---|---|
| මෝටර් රථ වාහන රක්ෂණය | 110 | රෝහල් ගතවීම් | 15 | සේවය හා සම්බන්ධ කරුණු | 07 |
| මුහුදු රක්ෂණය | 03 | මරණ ප්‍රතිලාභ | 15 | සුදුසුකම් | 07 |
| ගිනි රක්ෂණය | 05 | අබලතා | 03 | සාවද්‍ය මුදල් පරිහරණය | 17 |
| වර්ජන, කැරලි කෝලාහල හා සිවිල් ආරවුල්/ ත්‍රස්ත ක්‍රියා | 04 | ඔප්පු බලරහිත වීම | 06 | වෙනත් | 13 |
| සොරකම් රක්ෂණය | 15 | ආවරණ අහෝසි කළ/ ඔප්පු ප්‍රාණවත් නොකිරීම | 02 | | |
| අත්තිකාරම් ගෙවීම් හා කාර්යසාධන රක්ෂණය | 02 | පූර්ණත්ව ප්‍රතිලාභ/ පවාරන අගය | 18 | | |
| කම්කරු වන්දි | 01 | අනෙකුත් ණය | 01 | | |
| ගංවතුර | 02 | වාරික නැවත ගෙවීම | 09 | | |
| අග්‍රහාර/ ගුරු අභිමානී | 04 | ආයෝජන ඔප්පු | 04 | | |
| වෛද්‍ය/ සෞඛ්‍ය රක්ෂණය | 02 | අසාධ්‍ය රෝග | 02 | | |
| සංචරණ රක්ෂණය | 01 | | | | |
| සියළු අවදානම් වලට එරෙහිව කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ රක්ෂණය | 01 | | | | |
| මාර්ගස්ථ මුදල් පිළිබඳ රක්ෂණය | 01 | | | | |
| බැංකු හානිපූර්ණ | 03 | | | | |
| ණය ආරක්ෂණය | 01 | | | | |


### 2012 වසර තුළදී ලැබූ පැමිණිලි හා විමසීම් අවසන් කරන ලද පැමිණිලි



# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

***ඒ ඒ රක්ෂණ සමාගම් සිය වෙළඳපොල අනුපාතිකයට අනුව ලැබූ පැමිණිලි සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස***




### වෙනත් විමර්ශන

- සමාලෝචනයට පාත්‍රවන්නා වූ වර්ෂය තුලදී රක්ෂණ සමාගමක් සේවයේ යෙදවූ විමර්ශන නිලධාරියකුගේ ක්‍රියාකලාපය පිළිබඳව මණ්ඩලය විසින් විමර්ශනය කරන ලදී. එම විමර්ශනයේදී හෙලිදරව් වූයේ ඔහු රාජ්‍ය සේවකයකු වශයෙන් වංචනිකව පෙනී සිට රක්ෂණ ඔප්පු හිමියකු මුලාකොට ඇති බවයි. මෙය පොලිස්පතිතුමාගේ අවධානයට යොමු කර ඇත. තවද, මණ්ඩලය විසින් පොදුවේ විමර්ශන නිලධාරීන්ගේ ක්‍රියාකලාපය පිළිබඳව රක්ෂණ සමාගම්හි අවධානය යොමු කරන ලදී.
- රක්ෂණ සමාගමක කොටස් මිළදී ගැනීම සම්බන්ධයෙන් එහි සේවකයන්ගෙන් ලද පැමිණිලි විමසීම ආරම්භ කර ඇත. සෙසු නියාමන ආයතනයන්හි සහායද ඇතිව මෙම විමසීමේ කටයුතු සිදු කරගෙන යනු ලබයි.

### වෙනත්

- මණ්ඩලය සිය විමර්ශන කටයුතු වලදී, ලේඛන මත පදනම් වූ සාක්ෂි විශ්ලේෂනයන් සිදු කරනු ලැබේ. එමනිසා ඇතැම් ව්‍යවහාරික තොරතුරු පැහැදිලි කරගැනීම සඳහා රජයේ රස පරීක්ෂකතුමාගේ උපදෙස් ලබාගැනීම මණ්ඩලයට ඉතා වැදගත් වේ. එබැවින් රජයේ රස පරීක්ෂක සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව සමග අවබෝධතා ගිවිසුමකට එළඹීමට අවශ්‍ය පියවර දියත් කොට ඇත.
- බොහෝ සංසදයන්හිදී තෙවන පාර්ශවීය රක්ෂණය හා එහි විෂය පථය සාකච්ඡා කරනු ලැබ ඇත. එබැවින් දැනට පවත්නා තෙවන පාර්ශවීය රක්ෂණ ක්‍රමවේදය නැවත සලකා බැලීම සඳහා රක්ෂණ කර්මාන්තය හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමග දීර්ඝ කාලයක් කරුණු හුවමාරු කර ගන්නා ලදී. රක්ෂණ කර්මාන්තයෙන් ලැබූ නිරීක්ෂණ විචාරණය කිරීමෙන් පසුව මෝටර් රථ ආඥා පනතට අදාල විය යුතු සංශෝධනයන් ඇතුලත් නිර්දේශ මෝටර් රථ කොමසාරිස්තුමා වෙත ලබා දී ඇත. තුන්වන පාර්ශවීය මානසික හා දේපළ හානි මෙම සංශෝධනයට ඇතුලත් වූ වැදගත් අංග වේ.
- 2012 වර්ෂය තුලදී මණ්ඩලයට විවිධ පැමිණිලි රාශියක් ලැබුණි. ලැබුණු මහජන පැමිණිලි වර්ග හා මහජන අදහස් විශ්ලේෂනය කිරීමෙන් අනතුරුව පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි මහජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය මුද්‍රිත පත්‍රිකා මණ්ඩලය විසින් නිකුත් කරන ලදී:
  1. රක්ෂණ යෝජනා පත්‍රයක් සම්පූර්ණ කිරීමේදී මතක තබා ගත යුතු වැදගත් කරුණු
  2. අදාල කරුණු හෙලිදරව් කිරීමේ වැදගත්කම.
  3. රක්ෂණ ඔප්පුවක් මිලදී ගැනීමේදී දැනුවත් විය යුතු තොරතුරු.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## වෙළඳපොළ සංවර්ධන හා බාහිර සම්බන්ධතා ඒකකය

වෙළඳපොළ සංවර්ධන හා බාහිර සම්බන්ධතා ඒකකයේ මූලික අරමුණ වනුයේ රක්ෂණ ඔප්පු හිමියන් හා අනාගත රක්ෂණ ඔප්පු හිමියන් ආරක්ෂා කිරීම සඳහා රක්ෂණය හා සම්බන්ධ කටයුතු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමයි.

2012 වර්ෂය වෙනුවෙන් පහත දැක්වෙන ප්‍රකාශන මාධ්‍යයන් භාවිතා කරමින් අපගේ ඉලක්කගත කණ්ඩායම් වෙත ළඟාවීමට හැකිවිය:

1. ග්‍රාමීය ජනතාව සමග කිට්ටු සම්බන්ධතාවයක් ඇති කණ්ඩායම් - ග්‍රාම සේවා නිලධාරීන්, සමෘද්ධි නිලධාරීන් හා ක්ෂේත්‍ර නිලධාරීන්.
2. මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යය.
3. පාසැල් ළමුන් හා උපාධිධාරීන්.

“ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ කාර්යභාරය හා රක්ෂණය”, යන තේමාව මුල්කර ගනිමින් මෙම වසරේ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළහ. මෙම තේමාව තෝරා ගැනීමේදී පසුගිය වසරේ අප වෙත ලැබුණු මහජන විමසීම් වලින් ලද තොරතුරු ප්‍රයෝජනවත් විය.

### ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන්

මහජනතාව සමග සමීපව රාජකාරී කටයුතු කරන මහජන නිලධාරීන් දැනුවත් කිරීම අරමුණු කොටගෙන දිවයිනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සහයෝගය ඇතිව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

ආරම්භයක් ලෙස මධ්‍යම පළාතේ හා දකුණු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල තෝරාගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. උකුවෙල, හාරිස්පත්තුව, කොත්මලේ, තිස්සමහාරාමය, අම්බලන්ගොඩ හා කඹුරුපිටිය ද ඊට අමතරව අම්පාර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේද මෙලෙස දැනුවත් කිරීමේ වැඩසටහන් හතක් (7) පවත්වන ලදී. මේ සඳහා ග්‍රාම සේවා නිලධාරී වසම් 400 ක් පමණ ආවරණය විය.

### පාසල් ආශ්‍රයෙන් පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන්

පාසල් වලින් ලැබෙන ඇරයුම් මත අ.පො.ස. (උ.පෙළ) වාණිජ විෂය මාලාව හදාරන සිසුන් වෙනුවෙන් සම්මන්ත්‍රණ පවත්වනු ලබයි. ඒ අනුව 2012 වසරේ මැයි මස 28 වන දින කොළඹ රාජකීය විද්‍යාලයේ ගුරු මහත්ම මහත්මීන්ද ඇතුළුව සිසුන් 350 ක සහභාගිත්වයෙන් සම්මනත්‍රණයක් පවත්වන ලදී.

පයාගල, පොතුවිල නවෝද්‍යා විදුහලේ ඇරයුමක් මත එහි පැවති, "වාණිජ්‍යය දිනය" වෙනුවෙන් මණ්ඩලයෙන් සම්පත් දායකත්වයක් සපයන ලදී.

### ප්‍රදර්ශන සඳහා සහභාගීත්වය

2012 පෙබරවාරි මස 4 වන දින සිට 12 වන දින දක්වා අනුරාධපුර, ඔයාමඩුවේ පැවති, "දැයට කිරුළ" ජාතික ප්‍රදර්ශනය සඳහා 6 වන වරටත් මණ්ඩලය සහභාගී විය.

මෙම ප්‍රදර්ශනය වෙනුවෙන් මණ්ඩලය, විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාව හා එකතුව ස්ථිර ගොඩනැගිල්ලක් සාදා එය ප්‍රදර්ශනය අවසානයේදී ජාතික පශු සම්පත් හා සංවර්ධන මණ්ඩලයට භාර දෙන ලදී.

ප්‍රථම වරට ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ, ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ හා ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමයේ නියෝජිතයන් මෙම ප්‍රදර්ශනයට සහභාගී වෙමින් ප්‍රදර්ශනයට පැමිණි මහජනතාවගෙන් ලැබුණු විමසීම් වලට පිළිතුරු දීමට මණ්ඩලය හා එක්විය.



### මාධ්‍ය සාකච්ඡා

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා ස්වාධීන රූපවාහිනී සේවය විසින්, “ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය හා එහි කාර්යය භාරය", පිළිබඳව මණ්ඩලය විසින් නිෂ්පාදනය කරන ලද වාර්තාමය කෙටි චිත්‍රපටිය ආශ්‍රයෙන් ප්‍රවෘත්ති වැඩසටහන් ප්‍රචාරය කරන ලදී. මෙයට මණ්ඩලයේ සභාපතිනියගේ මාධ්‍ය සාකච්ඡාවක්ද ඇතුලත් විය. තවද, ස්වාධීන රූපවාහිනී සේවයේ "Rupees and Sense" වැඩසටහන මගින් මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාකච්ඡාවක් ප්‍රචාරය විය.





# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

### ප්‍රකාශන

මහජනයාගේ දැනගැනීම සඳහා ද රක්ෂණ ඔප්පු මිලදී ගැනීමේදී හා තෝරා ගැනීමේදී ද පහසුවක් වනු පිණිස රක්ෂණ සංකල්ප හා රක්ෂණයට අදාල අනිකුත් වැදගත් කරුණු පිළිබඳව ප්‍රකාශන/ අත් පත්‍රිකා කීපයක් අදාළ කාලය තුළ ප්‍රකාශයට පත් කරන ලදී.

තවද, මණ්ඩලය විසින් මහජනයාගේ ප්‍රයෝජනය සඳහා පුවත්පත් වෙළඳ දැන්වීම්, පුවත්පත් නිවේදන හා නිල නිවේදන ප්‍රකාශයට පත් කර ඇත.

**අ) වෙළඳ දැන්වීම්/ පුවත්පත් අතිරේකයන්**

- 2012 පෙබරවාරි 4 වන දින, "නිදහස් දිනය/ දැයට කිරුළ", වෙනුවෙන් ඩේලි නිවුස් පුවත්පතේ පළ කරන ලද වෙළඳ දැන්වීම් අතිරේකය.
- 2012 ජූලි මස දිනමිණ පුවත් පතේ අතිරේකයක් වූ, "කොළොම්පුරේ ශ්‍රියා", හි පළ කරන ලද "රක්ෂණ ඔප්පුවක් මිලදී ගැනීමේදී රක්ෂණ මණ්ඩලයෙන් පණිවිඩයක්", යන පුවත් ලිපිය.

**ආ) පුවත්පත් නිල නිවේදන**


- 2012 ජූනි මස පළ කරන ලද, "2011 වර්ෂයේ රක්ෂණ කර්මාන්තයේ ප්‍රගතිය".
- 2012 ඔක්තෝබර් මස භාෂා තුනෙන්ම පළ කරන ලද, "2012 වර්ෂයේ ප්‍රථම භාගය තුළ රක්ෂණ කර්මාන්තයේ ප්‍රගතිය".

**ඇ) පුවත්පත් දැන්වීම්**

- 2012 ජූනි මස භාෂා තුනෙන්ම පළ කරන ලද, "ලියාපදිංචි රක්ෂණ සමාගම් වල ලැයිස්තුව".

**ඈ) පුවත්පත් ලිපි**

- 2012 මාර්තු මස සන්ඩේ ටයිම්ස් පුවත්පතේ අතිරේකයක පළ කරන ලද "රක්ෂණ කර්මාන්තයේ නියාමන ආයතනය ලෙස ,මහජනයා වෙත රක්ෂණ මණ්ඩලය ගැන කෙරෙන හැඳින්වීමක්".







**ඉ) අත්පත්‍රිකා (සිංහල හා දෙමළ භාෂා වලින්)**

- ඔබ දැනුවත්ව සිටින්නේද? - ජීවිත රක්ෂණය
- ඔබ දැනුවත්ව සිටින්නේද? - සාමාන්‍ය රක්ෂණය
- රක්ෂණ යෝජනා පත්‍රය
- ලියාපදිංචි රක්ෂණ සමාගම් වල ලැයිස්තුව
- රක්ෂණ ආවරණයක් ලබාගැනීමේදී මෙන්න ඔබට පණිවිඩයක්




### අනෙකුත් ක්‍රියාකාරකම්

**1. රක්ෂණ මණ්ඩලය පිළිබඳව කෙටි වාර්තාමය චිත්‍රපටිය**

මණ්ඩලයේ ක්‍රියාකාරකම් පිළිබඳව ඉංග්‍රීසි භාෂාවෙන් උපසිරැසි සහිත සිංහලෙන් කරන ලද වාර්තාමය චිත්‍රපටියක් නිෂ්පාදනය කිරීම. මෙය මණ්ඩලය විසින් කරන දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ප්‍රයෝජනවත් විය.

**2. රක්ෂණ නිපැයුම් විශ්ලේෂණය කිරීම**

රක්ෂණ සමාගම් විසින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ යහපත සඳහා මණ්ඩලය වෙත ගොනු කර ඇති රක්ෂණ ඔප්පු සම්බන්ධයෙන් ඒවා වැඩිදියුණු කිරීමේ අදහසින් එම රක්ෂණ ඔප්පු සමාලෝචනයට ලක් කිරීමට මණ්ඩලය කටයුතු ආරම්භ කරන ලදී. එහි ප්‍රථම පියවර ලෙස 2012 වර්ෂය තුළ මෝටර් රථ වාහන රක්ෂණ ඔප්පු කීපයක් විශ්ලේෂණයට ලක් කරන ලදී.

**3. මහජන විමසීම**

මෙම වර්ෂය තුළ රක්ෂණ කර්මාන්තයට හා රක්ෂණයට අදාල තොරතුරු පිළිබඳව සාමාන්‍ය ජනතාවගෙන්, රක්ෂණ ඔප්පු හිමියන්ගෙන් මෙන්ම කර්මාන්තයට සම්බන්ධ අනෙකුත් පාර්ශවයන් විසින් විමසීම් කරන ලද අතර ඒවාට මණ්ඩලය විසින් අවධානය යොමු කරන ලදී.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

## පරිපාලනමය සමාලෝචනය

### මානව සම්පත්

ඕනෑම සංවිධානයක සාර්ථකත්වය විශාල වශයෙන්ම රැඳී තිබෙන්නේ එහි ක්‍රියාකාරීත්වයට හවුල් වන්නා වූ පුද්ගලයින්ගේ විශේෂඥ ඥානය මතය. මණ්ඩලයේ සාර්ථක උපක්‍රමවල කශේරුව (කොඳුනාරටිය) වන්නේ අපගේ මානව සම්පත් බැව් අප විශ්වාස කරන්නේ එබැවිනි.

ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය සියළුම රක්ෂණ සහතික දරන්නන්ගේ සහ අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණින් ක්‍රියාත්මක විය යුතුය යන අභිප්‍රාය සාක්ෂාත් කර ගැනීම උදෙසා අවශ්‍ය යුතුකම් සහ කාර්යභාරය හඳුනා ගැනීම තුළින් මණ්ඩලය සිය සංවිධාන ව්‍යුහය ස්ථාපනය කර ඇත.

අපේක්ෂිත වෘත්තිකයින් නිසි කලට බඳවා ගැනීම තුලින් මානව සම්පත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර මේ වසර තුළදී මණ්ඩලය විසින් ගන්නා ලදී. මෙම පියවර සාක්ෂාත් කර ගැනීම උදෙසා සමාලෝචිත වසර තුළ දී විධායක නිලධාරීන් හත් දෙනෙකු සහ රියදුරන් දෙදෙනෙකු ස්ථිර කාර්ය මණ්ඩලයට බඳවා ගන්නා ලදී. 2012 දෙසැම්බර් 31 වන දිනට කාර්ය මණ්ඩලය 39 දෙනෙකුගෙන් සමන්විත විය.

2012 දෙසැම්බර් 31 වන දිනට කාර්ය මණ්ඩලයේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පහත වගුවෙන් දැක්වේ.

| මුළු සේවක සංඛ්‍යාව | අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම් | | | | |
|---|---|---|---|---|---|
| | පශ්චාත් උපාධිය ප්‍රථම උපාධිය හා වෘත්තීය සුදුසුකම් | පශ්චාත් උපාධිය හා වෘත්තීය සුදුසුකම් | ප්‍රථම උපාධිය හා වෘත්තීය සුදුසුකම් | ප්‍රථම උපාධිය | වෘත්තීය සුදුසුකම් |
| 39 | 02 | 04 | 07 | 10 | 05 |

### පුහුණු කිරීම්

ආයතනික අරමුණු සහ කාර්යසාධනය වර්ධනය කර ගැනීම උදෙසා දැනුම සහ වෘත්තීයමය නිපුණතාවන් ලබා ගැනීමට සේවක මණ්ඩලයට සහායවීමේ අරමුණින් පුහුණු සහ සංවර්ධන ප්‍රතිපත්තීන් වෙත අවධානය යොමු කරන ලදී. සේවක මණ්ඩලයේ හැකියාවන් ශක්තිමත් කිරීම උදෙසා දේශීය මෙන්ම විදේශීය පුහුණු අවස්ථාවන් ඔවුන් වෙත ලබා දෙන ලදී.

| වර්ගය | 2011 (රුපියල්) | 2012 (රුපියල්) |
|---|---|---|
| දේශීය පුහුණු | 1,606,760 | 811,321 |
| විදේශීය පුහුණු | 2,514,520 | 6,290,479 |

### කාර්යය මණ්ඩල සුභසාධනය

කාර්ය මණ්ඩලයේ අභිප්‍රේරණය සහ ධෛර්යය වර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ සුභසාධනය වැදගත් සාධකයකි. එබැවින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නේවාසික සහ බාහිර වෛද්‍ය පහසුකම්, හදිසි අනතුරු රක්ෂණාවරණ, වාහන ණය, ආපදා ණය හා උත්සව අත්තිකාරම් වැනි සිත්ගන්නා සුළු සුභසාධනයන් ලබා දෙන ලදී. තව ද, කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල අයගේ සබැඳියාවන් වර්ධනය කිරීම උදෙසා නේවාසික පුහුණු වැඩසහනක් සහ වාර්ෂික සුහද හමුව පවත්වන ලදී.

### තොරතුරු තාක්ෂණය

විද්‍යුත් තැපෑල සඳහා ආයතනික විසඳුම් ලබාදීම සඳහා සමාලෝචිත වසර තුළ ''සිම්බ්‍රා කොලැබරේෂන් සූට්'' වෙත යොමු වීම සඳහා මුල පුරන ලදී. පරිඝනක ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කිරීම සඳහා සහ වර්තමාන තොරතුරු තාක්ෂණ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ''ස(ර්)වර්' පරිඝනක දෘඩාංග තත්ත්වය ඉහළ නංවන ලදී.

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය


## මූල්‍ය සමාලෝචනය

### රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල

රක්ෂණ පනතේ නියමයන්ට අනුව ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල වෙනුවෙන් එකතුවන මුදලින් (සෙස්) නියම කොට ඇති කටයුතු සඳහා ක්ෂණිකව යොදවන්නට අවශ්‍ය නොවන මුදල් විචක්ෂණ ලෙස උපරිම ප්‍රතිලාභ ලැබෙන අන්දමින් මෙම වර්ෂය තුළදී ද රක්ෂණ මණ්ඩලය විසින් ආයෝජනය කරන ලද අතර පහත දැක්වෙන ප්‍රස්ථාරය එම සෙස් ආදායමත් ආයෝජන ආදායමත් විදහා දක්වයි.

**සටහන 1**

***2008 - 2012 කාලය තුළ සෙස් ආදායම සහ ආයෝජන ආදායම (රුපියල් මිලියන)***




| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| සෙස් ආදායම | 133 | 139 | 145 | 217 | 237 |
| ආයෝජන ආදායම | 70 | 91 | 76 | 80 | 136 |

සෙස් ආදායම (රුපියල් මිලියන)

ආයෝජන ආදායම (රුපියල් මිලියන)


ඉහත ප්‍රස්ථාරය මගින් වසර 2008 සිට 2012 දක්වා පස් අවුරුදු කාලය තුළ සෙස් බදු ආදායමෙහි වූ වර්ධනය පෙන්නුම් කෙරේ.

2011, 2012 වර්ෂයන් තුළ ආයෝජන ආදායමේ කැපී පෙනෙන වර්ධනයක් පොලී අනුපාතිකයේ හා සෙස් ආදායමේ වැඩි වීම හේතු කොට ගෙන පෙන්නුම් කෙරේ.

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වටිනාකම ගතවූ පස් වසර තුල වැඩි වී ඇති අන්දම පහත ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කරයි.

**සටහන 2**

***2008 - 2012 කාලය තුළ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ අගය (රුපියල් මිලියන)***




| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| අරමුදලේ අගය | 545 | 755 | 1,012 | 1,276 | 1,622 |


අරමුදලේ අගය (රුපියල් මිලියන)

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය

2012 දෙසැම්බර් 31 වන දිනට ඔපුජ් හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වත්කම් සංයුතිය පහත ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කරයි.

**සටහන 3**

***2012 දෙසැම්බර් 31 දිනට ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වත්කම් සංයුතිය***




**මණ්ඩලයේ ආදායම**


මණ්ඩලයේ සමස්ථ ආදායම ජනනය වන්නේ පහත දැක්වෙන ප්‍රභවයන් වලිනි.

- රක්ෂකයින් හා රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචිය සඳහා අය කරන ලියාපදිංචි කිරීමේ ගාස්තු
- රක්ෂණ සමාගම්වලින් අය කෙරෙන වාර්ෂික ගාස්තු
- වාර්ෂිකව ලියාපදිංචිය අළුත්කිරීම සඳහා රක්ෂණ තැරැව්කාර සමාගම්වලින් අය කරන ගාස්තු
- අතිරික්ත අරමුදල් ආයෝජනයෙන් ලැබෙන පොලී ආදායම

පහත දැක්වෙන ප්‍රස්ථාරය 2008 - 2012 දක්වා කාල පරිච්ඡේදය තුළ මණ්ඩලයේ සමස්ථ ආදායම බෙදී ඇති ආකාරය දක්වයි.

**සටහන 4**

***කාලය තුල මණ්ඩලයේ ආදායම (රුපියල් මිලියන)***




| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| වාර්ෂික ගාස්තු (රුපියල් මිලියන) | 26 | 29 | 29 | 35 | 61 |
| ලියාපදිංචි හා ලියාපදිංචිය අළුත් කිරීමේ ගාස්තු (රුපියල් මිලියන) | 2 | 2 | 2 | 3 | 5 |
| වෙනත් ආදායම් (රුපියල් මිලියන) | 15 | 9 | 3 | 1 | 2 |
| ප්‍රදාන හඳුනාගැනීම් (රුපියල් මිලියන) | 6 | 9 | 8 | 6 | 7 |
| මුළු ආදායම (රුපියල් මිලියන) | 49 | 49 | 42 | 44 | 75 |

# මෙහෙයුම් කටයුතු සමාලෝචනය


### මණ්ඩලයේ වියදම්

2008 සිට 2012 වන විට මණ්ඩලයේ වියදම් ක්‍රමිකව ඉහළ ගොස් ඇත. ආදායම් හා වියදම් අතර හිඟය පනතේ විධිවිධානයන්ට අනුකූලව ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් පියවාගෙන ඇත.

පහත ප්‍රස්ථාරය 2008 - 2012 කාල පරිච්ඡේදය තුල මණ්ඩලයේ සමස්ථ වියදම පෙන්වයි.

**සටහන 5**

***2008 - 2012 කාල පරිච්ඡේදය තුළ මණ්ඩලයේ සමස්ථ වියදම (රුපියල් මිලියන)***




| | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| මුළු වියදම (රුපියල් මිලියන) | 58 | 66 | 71 | 74 | 94 |

# මූල්‍ය තොරතුරු


- මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය 70
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 71
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 72
- රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 73
- ගිණුම්කරණ ප්‍රතිපත්ති 74
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 76




# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2012 රුපියල් | 2011 සංශෝධිත රුපියල් |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත සහ උපකරණ | 1 | **13,165,749** | 12,368,886 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - කුළී සහ විද්‍යුත් තැන්පතු | 2 | **11,088,660** | 8,728,590 |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොග | 3 | **391,138** | 183,131 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - ආයෝජන හා වෙනත් | 2 සහ 17 | **1,610,930,804** | 1,267,656,277 |
| අනෙකුත් ජංගම වත්කම් | 4 සහ 17 | **13,513,443** | 10,898,124 |
| මුදල් හා මුදල් හා සමාන දෑ | 5 | **1,530,608** | 185,159 |
| **මුළු වත්කම්** | | **1,650,620,402** | 1,300,020,167 |
| **සංචිත හා වගකීම්** | | | |
| **සංචිත** | | | |
| සමුච්චිත අරමුදල | | **-** | - |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල | 6 | **1,622,019,464** | 1,276,384,867 |
| **වගකීම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ප්‍රදාන | 7 | **13,165,749** | 12,368,887 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 8 | **1,889,445** | 1,833,909 |
| | | **15,055,194** | 14,202,796 |
| **ජංගම වගකීම්** | | | |
| ලද අත්තිකාරම් | 17 | **4,727,599** | 4,270,018 |
| අනෙකුත් ජංගම වගකීම් | 9 | **8,818,145** | 5,162,486 |
| | | **13,545,744** | 9,432,504 |
| **මුළු සංචිත හා වගකීම්** | | **1,650,620,402** | 1,300,020,167 |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම රක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් වෙත පැවරේ.

ඉහත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය පිටු අංක 74 සිට 81 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් සමඟ සංයෝජිතව කියවිය යුතු වේ.

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය සහ ඒ වෙනුවෙන්,

**ඉන්ද්‍රාණි සුගතදාස**
*සභාපතිනිය*

**එස්. ආර්. ආටිගල**
*සාමාජික*

කොළඹ. ශ්‍රී ලංකාව
2013 පෙබරවාරි 27.

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2012 රුපියල් | 2011 සංශෝධිත රුපියල් |
|---|---|---|---|
| **ආදායම** | | | |
| අයභාරය | 10 සහ 17 | **65,774,167** | 37,628,544 |
| ප්‍රදාන හඳුනා ගැනීම් | 7 | **6,662,626** | 6,040,348 |
| පොලී ආදායම | | **1,932,676** | 144,873 |
| වෙනත් ආදායම් | 11 | **172,686** | 415,246 |
| **මුළු ආදායම** | | **74,542,155** | 44,229,011 |
| අඩුකලා | | | |
| **වියදම්** | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | | **48,661,790** | 36,063,408 |
| වෘත්තීය ගාස්තු | | **994,405** | 1,619,785 |
| මෙහෙයුම් වියදම් | | **43,817,296** | 36,567,718 |
| මූල්‍ය සහ අනෙකුත් | | **125,629** | 99,514 |
| **මුළු වියදම්** | | **93,599,120** | 74,350,425 |
| බදුවලට පෙර ශුද්ධ ඌණතාවය | 12 සහ 17 | **(19,056,965)** | (30,121,414) |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මාරු කිරීම් | 6 | **19,295,177** | 30,132,344 |
| බදු | | **(238,212)** | (10,930) |
| බදුවලට පසු ශුද්ධ ඌණතාවය | | **-** | - |
| **වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය** | | **-** | - |

පිටු අංක 74 සිට 81 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2012<br>රුපියල් | 2011<br>සංශෝධිත<br>රුපියල් |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ලැබූ මුදල් ප්‍රවාහ** | | | |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්) | | **-** | - |
| ක්ෂය සඳහා ගැලපීම් | | **6,582,865** | 6,237,563 |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන | | **55,536** | 703,074 |
| දේපල, පිරියත හා උපකරණ විකුණුම් අලාභය | | **79,761** | (172,023) |
| ප්‍රදාන හඳුනා ගැනීම | | **(6,662,626)** | (6,040,348) |
| ආදායම් බදු | | **238,212** | 10,930 |
| පොලී ආදායම | | **(1,932,676)** | (144,873) |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්වලට පෙර ශුද්ධ වැඩිවීම | | **(1,638,928)** | 594,323 |
| | | | |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම | | | |
| තොගවල (වැඩිවීම) / අඩුවීම | | **(208,007)** | 129,000 |
| ලැබිය යුතු දෑවල (වැඩිවීම) / අඩුවීම | 17 | **(2,656,106)** | (3,694,969) |
| අත්තිකාරම් ලැබීම්වල වැඩිවීම / (අඩුවීම) | 17 | **457,580** | 1,920,000 |
| ණය හිමියන් සහ උපචිතයන්හි වැඩිවීම / (අඩුවීම) | | **3,655,659** | (5,284,774) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිත කරන ලද මුදල් ප්‍රවාහය | | **1,249,126** | (6,930,743) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය | | **(389,802)** | (6,336,420) |
| | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබූ/(ක්‍රියාකාරකම් සඳහා යෙදූ) මුදල් ප්‍රවාහය** | | | |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජනය | | **-** | 5,000,000 |
| පොලී ආදායම | | **1,735,251** | 152,910 |
| දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල් | | **-** | 886,826 |
| දේපල, පිරියත සහ උපකරණ මිලට ගැනීම | | **(7,459,488)** | (2,502,591) |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | **(5,724,237)** | 3,537,145 |
| | | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලැබූ මුදල් ප්‍රවාහය** | | | |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් ප්‍රාග්ධන මාරු කිරීම් | | **7,459,488** | 2,502,591 |
| මූල්‍ය කල්බදුවල වැඩිවීම | | **-** | (1,124,441) |
| | | | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | **7,459,488** | 1,378,150 |
| මුදල් සහ මුදල් හා සමාන දෑවල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **1,345,449** | (1,421,125) |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | **185,159** | 1,606,284 |
| වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | **1,530,608** | 185,159 |
| අතැති සහ බැංකුවේ ඇති මුදල් | 5 | **1,530,608** | 185,159 |

පිටු අංක 74 සිට 81 දක්වා ඉදිරිපත්කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2012<br>රුපියල් | 2011<br>සංශෝධිත<br>රුපියල් |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ශුද්ධ වර්ධනය | | **345,634,597** | 264,574,757 |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම | 17 | **345,634,597** | 264,574,757 |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම | | | |
| රජයේ සුරැකුම්පත්වලින් ලද පොලියෙහි (වැඩිවීම)/අඩුවීම | | **(12,560,479)** | (8,377,361) |
| ලැබිය යුතු සෙස් බදුවල (වැඩිවීම) / අඩුවීම | | **(10,000,000)** | (13,985,183) |
| කුළී තැන්පතුවල (වැඩිවීම) / අඩුවීම | | **(2,360,070)** | - |
| සෙස් අරමුදලින් මාරු කළ යුතු අරමුදල්හි වැඩිවීම / (අඩුවීම) | 17 | **702,733** | 8,328,870 |
| | | **(24,217,816)** | (14,033,674) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | **321,416,781** | 250,541,083 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජනය | | **212,926,661** | (250,939,905) |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය | | **(534,000,000)** | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද / (යෙදවූ) ශුද්ධ මුදල් ප්‍රවාහය | | **(321,073,339)** | (250,939,905) |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම (අඩුවීම) | | **343,442** | (398,823) |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | **28,457** | 427,280 |
| වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | **371,899** | 28,457 |
| බැංකුවේ ඇති මුදල් | 2 | **371,899** | 28,457 |

පිටු අංක 74 සිට 81 දක්වා ඉදිරිපත්කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකූලිත කොටසකි.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.1 සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පදනම මත සකස් කර ඇති අතර ඒවා ඉදිරිපත් කිරීමේ දී අගයන් ආසන්නම ශ්‍රී ලංකා රුපියලට දක්වා ඇත.

යථායෝග්‍ය පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරියේ දැක්වෙන සටහන් මඟින් අනාවරණය කර ඇත.

### 1.2 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරනු ලැබ ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කර ඇති අතර, එම මූල්‍ය ප්‍රකාශන එම ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලතාවය දක්වනු ලැබේ.

### 1.3 වාර්තා කරන ශේෂ පත්‍ර දිනයෙන් පසු හටගන්නා සිදුවීම්

වාර්තා කරන දිනයෙන් පසු හටගන්නා සියළුම ප්‍රමාණාත්මක සිද්ධීන් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ කාර්යයේ දී සැලකිල්ලට ගෙන අවශ්‍ය ගැලපීම් හෝ අනාවරණයන් කර ඇත.

### 1.4 සංසන්දනාත්මක සංඛ්‍යාවන්

ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරීම හා අනකූල විය යුතු ආකාරයට පෙර වර්ෂවල සංසන්දනාත්මක සංඛ්‍යා ගැලපීම් කර ඇත.

### 1.5 බදුකරණය

ආදායම් බදු සඳහා ප්‍රතිපාදන 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතෙහි ප්‍රතිපාදනයන් හා අනුකූලව ගණනය කර ඇත.

පොලී හා ලාභාංශ ආදායම හැර මණ්ඩලයේ අනෙකුත් ආදායම් මේ වන විට ආදායම් බදුවලින් නිදහස් කර ඇත.

### 1.6 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය

සියළුම විදේශීය මුදලින් සිදු වූ ගනුදෙනු ඒවා සිදු වූ අවස්ථාවේ දී පැවැති විනිමය අනුපාතිකයන් පාදකව, වාර්තා කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කර ඇත.

## 2. වත්කම් සහ අගය කිරීමේ පදනම

### 2.1 දේපල, පිරියත හා උපකරණ දේපල

**ස්වසන්තක අයිතිය සහිත දේපල, පිරියත හා උපකරණ**

දේපල, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කළ අගයට නිරූපණය කර ඇත. දේපල, පිරියත හා උපකරණවල පිරිවැයට ඇතුළත් වන්නේ, අත්පත් කර ගැනීමේ පිරිවැය සමඟ එම වත්කම් අපේක්ෂිත භාවිත ත්තත්වයට ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් වියදම්වල එකතුවයි.

**ක්ෂය**

වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය පුරා පහත අනුපාත පාදකව සරල මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කරනු ලැබේ.

| | වාර්ෂික (%) |
|---|---|
| මෝටර් වාහන | 25 |
| ලී බඩු, වෑද්දුම් සහ සවි කිරීම් | 12.5 |
| කාර්යාල හා විද්‍යුත් දත්ත සැලසුම් උපකරණ | 25 |
| පුහුණු උපකරණ | 25 |

ක්ෂය ප්‍රතිපාදන එම වත්කම් මිල දී ගත් දින සිට කරනු ලැබේ. ක්ෂය ප්‍රතිපාදනය වත්කම භාවිතයෙන් ඉවත් කරන තෙක් කරනු ලැබේ.

### 2.2 ආයෝජන

රජයේ සුරැකුම්පත් හි සහ ස්ථාවර තැන්පත්වල කර ඇති ආයෝජන අගය කර ඇත්තේ ඒවායේ පිරිවැයට වන අතර ඒවා සඳහා වර්ෂය අවසානය තෙක් පොලී උපචිත පදනම මත ගිණුම්ගත කර ඇත.

### 2.3 තොග

තොග ඒවායේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයවලින් අඩු අගයට දක්වා ඇත. තොගවල පිරිවැය නිශ්චය කිරීමේ දී ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමය (ප්‍ර.ලැ.ප්‍ර.නි) ඒ සඳහා පාදක කරගෙන ඇත.

### 2.4 ලැබිය යුතු දෑ

ලැබිය යුතු දෑ නිරූපණය කර ඇත්තේ, ඇස්තමේන්තුගත උපලබ්ධි අගයටයි.

### 2.5 මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේ පරමාර්ථය සඳහා මුදල් හා මුදල් හා සමාන දෑවලින් නියෝජනය වන්නේ බැංකුවේ මුදල් සහ අතැති මුදල්ය.

## 3. බැරකම් සහ ප්‍රතිපාදනය

### 3.1 විශ්‍රාම ප්‍රතිලාභ

#### 3.1.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 - 'සේවක ප්‍රතිලාභ හා අනුකූලව' යෝජිත ඒකක බැර ක්‍රමය පදනම් කරගෙන සේවක පාරිතෝෂිකය ප්‍රථම සේවා වර්ෂයේ සිට සම්පූර්ණ ප්‍රතිපාදනය කෙරෙන ආකාරයට ගිණුම් ගත කර ඇත.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

කෙසේ වෙතත් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත හා අනුකූලව ගෙවීම් පිළිබඳව වගකීම ඇති වන්නේ වර්ෂ 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන ලද්දේ නම් පමණි.

### 3.1.2 නිශ්චිත සහභාග සැලසුම් - සේ.අ.අ. සහ සේ.භා.අ.

නිශ්චිත ව්‍යවස්ථාවන් සහ නියාමන හා අනුකූලව මණ්ඩලයේ සියළුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලට දායකවීමට සහ සේවක භාරකාර අරමුදලට දායකවීමට සුදුසුකම් ලබති. මණ්ඩලය සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකය මත පිළිවෙළින් 12% ක සහ 3% ක මුදලක් දායක කරයි.

### 3.2 බැරකම්

බැරකම් අතරින් වාර්තා කරන දිනයෙන් පසු වර්ෂයක් තුළ දී හෝ ඉල්ලුම් කළ විටක දී ගෙවිය යුතු වන දෑ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම බැරකම් සේ වර්ගීකරණය කර ඇත. වාර්තා කරන දිනයෙන් පසු වර්ෂයකින් ඔබ්බට ගෙවිය යුතු සියළුම ගෙවීම් ජංගම නොවන බැරකම් ගණයට ඇතුළත් කර ඇත.

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී සියළුම දන්නා බැරකම් ඒවායේ පිරිවැයට ඇතුළත් කර ඇත.

### 3.3 ප්‍රදාන

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මාරු කරනු ලබන ප්‍රාග්ධන වියදම් සහ ක්ෂුද්‍ර රක්ෂණ ව්‍යාපෘතියෙහි ලැබෙන සියළුම වත්කම් ප්‍රදාන සේ හඳුනා ගන්නා අතර එම වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය තුළ දී ඒවා හඳුනා ගනු ලැබේ.

## 4. ආදායම් සහ වියදම්

### 4.1 ආදායම් හඳුනා ගැනීම

ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

### 4.2 රාජ්‍ය ප්‍රදාන

සමාලෝචිත වර්ෂය තුළ දී කිසිදු රාජ්‍ය ප්‍රදානයන් ලැබී නැත.

### 4.3 වියදම් හඳුනා ගැනීම

මණ්ඩලය පවත්වාගෙන යෑමේ දී දරනු ලබන සියළුම වියදම් වියදමට වැඩි ආදායම ගණනය කිරීමේ කාර්යය සඳහා ආදායමට එරෙහිව ලියාහරිනු ලැබේ.

### 4.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඇත්තේ වක්‍ර ක්‍රමය මතයි.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1. දේපළ පිරියත හා උපකරණ

| | මෝටර් වාහන | ලී බඩු, කාර්යාල උපකරණ | | පුහුණු උපකරණ | එකතුව |
|---|---|---|---|---|---|
| | | වැද්දුම් හා සවිකිරීම් | විද්‍යුත් දත්ත සැකසුම් සහ වෙනත් | | |
| | රුපියල් | රුපියල් | රුපියල් | රුපියල් | රුපියල් |
| **පිරිවැය** | | | | | |
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 9,473,243 | 14,283,009 | 20,484,183 | 141,450 | 44,381,885 |
| එකතු කිරීම් | 6,844,078 | 352,257 | 263,153 | - | 7,459,488 |
| බැහැර කිරීම් | - | (2,030,551) | (87,000) | - | (2,117,551) |
| 2012 දෙසැම්බර් 31 දින ශේෂය | **16,317,321** | **12,604,715** | **20,660,336** | **141,450** | **49,723,822** |
| **සමුච්චිත ක්ෂය** | | | | | |
| 2012 ජනවාරි මස 01 දිනට ශේෂය | 8,722,606 | 7,609,835 | 15,539,107 | 141,450 | 32,012,998 |
| වර්ෂය සඳහා අය කිරීම් | 2,163,738 | 1,755,611 | 2,663,517 | - | 6,582,866 |
| බැහැර කිරීම් | - | (1,950,791) | (87,000) | - | (2,037,791) |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | **10,886,344** | **7,414,655** | **18,115,624** | **141,450** | **36,558,073** |
| **ලියා අඩු කළ අගය 2012 දෙසැම්බර් 31 දිනට** | **5,430,977** | **5,190,060** | **2,544,712** | **-** | **13,165,749** |
| ලියා අඩු කළ අගය 2011 දෙසැම්බර් 31 දිනට | 750,636 | 6,673,174 | 4,945,076 | - | 12,368,886 |

| දෙසැම්බර් 31 දිනට | 2012 රුපියල් | 2011 සංශෝධිත රුපියල් |
|---|---|---|
| **2. රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල ආයෝජනය සහ අනෙකුත්** | | |
| **ජංගම නොවන වත්කම්** | | |
| කුළී සහ විද්‍යුත් තැන්පතු | **11,088,660** | 8,728,590 |
| **ජංගම වත්කම්** | | |
| රජයේ සුරැකුම්හි ආයෝජන | **976,651,187** | 1,189,577,848 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | **534,000,000** | - |
| රජයේ සුරැකුම්පත්වලින් සහ ස්ථාවර තැන්පතු මගින් ලද පොලිය | **44,445,385** | 31,884,906 |
| ලැබිය යුතු සෙස් බදු | **60,000,000** | 50,000,000 |
| බැංකුවේ ඇති ශේෂය | **371,899** | 28,457 |
| අඩු කළා | | |
| සෙස් අරමුදලින් මාරු කළ යුතු අගය | **4,537,667** | 3,834,935 |
| | **1,610,930,804** | 1,267,656,277 |
| **මුළු වත්කම්** | **1,622,019,464** | 1,276,384,867 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| දෙසැම්බර් 31 දිනට | 2012<br>රුපියල් | 2011<br>සංශෝධිත<br>රුපියල් |
|---|---|---|
| **3. භාණ්ඩ තොග** | | |
| මුද්‍රණ, ලිපිද්‍රව්‍ය හා පරිගණක උපාංග | **303,083** | 175,871 |
| මුද්දර | **88,055** | 7,260 |
| | **391,138** | 183,131 |
| **4. අනෙකුත් ජංගම වත්කම්** | | |
| තැන්පතු | **172,122** | 187,870 |
| වෙනත් ලැබිය යුතු දෑ | **114,597** | 146,911 |
| ලැබිය යුතු රඳවා ගැනීමේ බදු | **1,049,296** | 1,055,865 |
| එකතු කළ අගය මත බදු පාලන ගිනුම | **502,748** | 1,182,959 |
| සේවක ණය * | **3,923,116** | 3,668,481 |
| අත්තිකාම් සහ පෙර ගෙවීම් | **3,038,082** | 821,104 |
| ආර්ථික සේවා ගාස්තු | **90,815** | - |
| ස්ථාවර වත්කම් මිලට ගැනීම සඳහා අත්තිකාරම් | **85,000** | - |
| සෙස් බදු අරමුදලෙන් මාරු කළ යුතු අගය | **4,537,667** | 3,834,935 |
| | **13,513,443** | 10,898,124 |
| ***කාර්යය මණ්ඩලය සඳහා ප්‍රදානය කළ ණය** | | |
| ජනවාරි 1 දිනට ශේෂය | **3,668,481** | 4,025,086 |
| වර්ෂය තුළ දී ප්‍රදානය කළ ණය | **2,942,391** | 2,305,239 |
| | **6,610,872** | 6,330,325 |
| වර්ෂය තුළ දී ණය ආපසු ගෙවීම් | **(2,687,756)** | (2,661,844) |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | **3,923,116** | 3,668,481 |
| **5. මුදල් සහ මුදල් හා සමාන දෑ** | | |
| **බැංකුවල ඇති මුදල්** | | |
| ලංකා බැංකුව | **1,530,608** | 185,159 |
| ඇතැති මුදල් | **-** | - |
| | **1,530,608** | 185,159 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| දෙසැම්බර් 31 දිනට | 2012<br>රුපියල් | 2011<br>සංශෝධිත<br>රුපියල් |
|---|---|---|
| **6. රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල්** | | |
| ආරම්භක ශේෂය | **1,276,384,867** | 1,011,810,110 |
| වර්ෂය තුළදී ලද සෙස් බදු | **236,534,917** | 216,837,328 |
| භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය මත පොලී | **47,865,987** | 44,927,884 |
| ප්‍රති මිල දී ගැනීම් සහ ඉල්ලුම් ගිණුම් මත පොලී | **87,316,447** | 35,463,880 |
| ස්ථාවර තැන්පතු මත පොලී | **696,541** | - |
| | **1,648,798,759** | 1,309,039,202 |
| අඩු කළා | | |
| මෙහෙයුම් වියදම් සඳහා මාරු කිරීම් | **19,295,177** | 30,132,344 |
| ප්‍රාග්ධන වියදම් සඳහා මාරු කිරීම් | **7,459,488** | 2,502,591 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මුළු මාරු කිරීම් | **26,754,665** | 32,634,935 |
| බැංකු ගාස්තු | **24,630** | 19,400 |
| | **26,779,295** | 32,654,335 |
| අවසාන ශේෂය | **1,622,019,464** | 1,276,384,867 |
| **7. ප්‍රදාන** | | |
| වසර ආරම්භයේ දී ශේෂය | **12,368,887** | 15,906,644 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් ප්‍රාග්ධන වියදම | **7,459,488** | 2,502,591 |
| අඩු කළා වර්ෂය තුළ දී ක්‍රමක්ෂය කිරීම් | **(6,662,626)** | (6,040,348) |
| වසර අවසානයේ දී ශේෂය | **13,165,749** | 12,368,887 |

**සටහන - ප්‍රදාන හඳුනා ගැනීම**

ශ්‍රී.ල.ගි.ප්‍ර. 20 හා අනුකූලව ප්‍රදානයන් ගිණුම් ගත කර ඇති අතර ආදායම් ප්‍රකාශයේ පහත අනුපාත යටතේ හඳුනාගෙන ඇත.

| | | |
|---|---|---|
| මෝටර් රථ වාහන | **25%** | |
| කාර්යාල උපකරණ - වෙනත් සහ වි.ද.සැ. | **25%** | |
| ලී බඩු වැද්දුම් සහ සවි කිරීම් | **12.5%** | |

| | | |
|---|---|---|
| **8. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්** | | |
| වසර ආරම්භයේ දී ශේෂය | **1,833,909** | 1,444,533 |
| වසර තුළ ප්‍රතිපාදන | **55,536** | 703,074 |
| වසර තුළ සිදු කරන ලද ගෙවීම් | **-** | (313,698) |
| වසර අවසානයේ ශේෂය | **1,889,445** | 1,833,909 |
| **9. අනෙකුත් ජංගම වගකීම්** | | |
| උපචිත වියදම් | **8,077,508** | 4,623,888 |
| සේවක අර්ථසාධක අරමුදල් සඳහා කළ යුතු ගෙවීම් | **489,052** | 346,249 |
| සේවක භාරකාර අරමුදල් සඳහා කළ යුතු ගෙවීම් | **73,359** | 51,938 |
| උපයන විට හා රඳවා ගැනීමේ බදු ගෙවීම් | **84,130** | 52,191 |
| වෙනත් | **94,096** | 88,220 |
| | **8,818,145** | 5,162,486 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 2012<br>රුපියල් | 2011<br>සංශෝධිත<br>රුපියල් |
|---|---|---|
| **10. අය භාරය** | | |
| රක්ෂණ සමාගම්වලින් වාර්ෂික ගාස්තු | **61,044,774** | 34,578,544 |
| ලියාපදිංචි කිරීමේ සහ අළුත් කිරීමේ ගාස්තු | **4,729,393** | 3,050,000 |
| | **65,774,167** | 37,628,544 |
| **11. වෙනත් ආදායම්** | | |
| මෝටර් වාහන ණය මත පොලී | **31,086** | 48,055 |
| ආපදා ණය මත පොලී | **94,812** | 102,196 |
| ප්‍රකාශ අලවියෙන් ලැබීම් | **-** | 49,875 |
| ස්ථාවර වත්කම් විකුණුම් ආදායම් | **-** | 172,023 |
| වෙනත් ආදායම් | **46,788** | 43,097 |
| | **172,686** | 415,246 |
| **12. වියදමට වඩා වැඩි ආදායම් අතිරික්තය / (ඌණතාව)** | | |
| **වර්ෂය සඳහා ඌණතාව නිශ්චය කිරීමේ දී පහත දෑ සහිතව සියලුම වියදම් අඩු කර ඇත.** | | |
| කාර්ය මණ්ඩල වැටුප් | **24,881,974** | 18,504,115 |
| සේ.අ.අ. සහ සේ.භා.අ. | **3,869,453** | 2,806,072 |
| විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදන | **55,536** | 703,074 |
| කාර්යය මණ්ඩල පුහුණුව - විදේශීය | **6,290,475** | 3,087,200 |
| දේශීය උපදේශකයන් | **100,000** | 614,167 |
| විදේශීය උපදේශකයන් | **666,444** | 719,121 |
| විගණන පාරිශ්‍රමික | **375,000** | 585,252 |
| ක්ෂය | **6,582,865** | 6,237,563 |
| සභාපතිනියගේ වියදම් - දීමනා | **900,000** | 457,500 |
| සභාපතිනියගේ වියදම් - ඉන්ධන | **317,520** | 268,920 |
| අධ්‍යක්ෂවරුන්ගේ වාහන දීමනා | **3,850,000** | 1,767,419 |
| මණ්ඩල සාමාජික පැමිණීමේ දීමනා | **494,547** | 500,797 |
| මහජනයා දැනුවත් කිරීමේ වියදම් | **4,281,143** | 3,318,217 |
| බැංකු ගාස්තු | **125,629** | 73,534 |
| හර බදු | **-** | 25,816 |
| **13. කාර්ය මණ්ඩල පිරිවැය** | | |
| නීති | **10,028,637** | 7,593,164 |
| අධීක්ෂණය | **12,100,916** | 11,563,369 |
| විමර්ශනය | **6,612,549** | 5,746,372 |
| වෙළඳපොළ සංවර්ධනය සහ මහජන සම්බන්ධතා | **3,330,622** | 1,646,540 |
| මූල්‍ය සහ පරිපාලනය | **16,589,066** | 9,513,963 |
| | **48,661,790** | 36,063,408 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 2012 රුපියල් | 2011 සංශෝධිත රුපියල් |
|---|---|---|
| **14. වෘත්තීය ගාස්තු** | | |
| දේශීය උපදේශකයන් | **100,000** | 867,167 |
| විදේශීය උපදේශකයන් | **666,444** | 466,121 |
| වෙනත් | **227,961** | 286,496 |
| | **994,405** | 1,619,784 |
| **15. මෙහෙයුම් වියදම්** | | |
| නීති | **11,579,640** | 9,493,344 |
| අධීක්ෂණය | **10,917,675** | 9,246,637 |
| විමර්ශනය | **8,444,642** | 6,848,294 |
| වෙළඳපොළ සංවර්ධනය සහ මහජන සම්බන්ධතා | **3,861,266** | 3,384,915 |
| මූල්‍ය සහ පරිපාලනය | **9,139,702** | 7,594,529 |
| | **43,942,925** | 36,567,719 |

**16. බදුකරණය**

2012 දෙසැම්බර් 31 දිනට බදුකරණය සඳහා ප්‍රතිපාදන ගණනය කර ඇත්තේ 2006 අංක 10 දරණ ආදායම් පනතේ විධිවිධාන වලට අනුකූලවයි.

**16.1 රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳ පල ගනුදෙනු වෙනුවෙන් රඳවාගත් බදු සඳහා ලැබෙන නාමික බැර**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ අංක 137 වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලය රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපොළ ගනුදෙනු මත උපන පොලී ආදායම අදාළ තක්සේරු වර්ෂය සඳහා වන ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් සේ සලකන අතර එම පොලිය වෙනුවෙන් නාමික බදු බැර සඳහා හිමිකාරත්වය ලැබේ.

ඒ අනුව රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපොළ ගනුදෙනුවලින් මණ්ඩලය විසින් උපයන ලද ශුද්ධ ආදායම දළ ආදායම බවට පරිවර්තනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් නාමික බදු බැර වටිනාකම රුපියල්192,805/55 ක් 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය ප්‍රකාශනවල වෙනමම හඳුනාගෙන ඇත.

සෙස් අරමුදල විසින් රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපොළ ගනුදෙනු මත කරනු ලැබූ ආයෝජනයන්ගෙන් උපයන ලද පොලී ආදායම ගිණුම්ගත කර හඳුනාගෙන ඇත්තේ ශුද්ධ අගයටය.

**17.** ප්‍රවර්ථන වර්ෂයේ ආදායමක් ලෙස හඳුනා ගත යුතු රුපියල් 2,870,000ක ලියාපදිංචිය අළුත් කිරීමේ ගාස්තු පසුගිය වසරේ ආදායමක් ලෙස හඳුනාගෙන තිබීමේ ගිණුම් කරන වැරැද්ද නිවැරදි කිරීම සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08, ගිණුම්කරණ ප්‍රතිපත්ති, ඇස්තමේන්තු වෙනස්වීම් හා වැරදි හි දක්වා ඇති පරිදි පසුගිය වසරේ අදාළ සංඛ්‍යා වෙනස් කර ඇත. ඒ අනුව, මණ්ඩලයේ ආදායම රුපියල් 2,870,000න් අඩුවී ඇති අතර රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මාරු කළ යුතු අගය වැඩි වී ඇත. ලද අත්තිකාරම් ද එම ප්‍රමාණයෙන්ම වැඩි වී ඇත.

**18. ප්‍රාග්ධන බැඳියාව**

21012 දෙසැම්බර් 31 දිනට කිසිදු ප්‍රාග්ධන බැඳියාවකට එළැඹ නොමැත.

**19. අසම්භාව්‍ය බැරකම්**

2012 දෙසැම්බර් 31 දිනට කිසිදු අසම්භාව්‍ය බැරකමක් නොමැත.

**20. වාර්තා කරන දිනෙන් පසු හටගත් සිදුවීම්**

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතු හෝ අනාවරණය කිරීම අවශ්‍ය වන කිසිදු සිද්ධියක් වාර්තා කරන දිනට පසු සිදු වී නොමැත.

**21. සම්බන්ධිත පාර්ශව අනාවරණ**

ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය (සභාපතිනිය), බී.ඩී. ඩබ්.ඒ. සිල්වා මහතා, ඩී.කේ. හෙට්ටිආරච්චි මහතා (නිල බලයෙන් පත් වූ සාමාජිකයන්) ජී. ගුණවර්ධන මහතා, නවාස් රාජබ්ඩීන් මහතා සහ ගාමිණී කොහොන මහතා 2012 වර්ෂය මුළුල්ලේම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජි සාමාජිකාවන් ලෙස ක්‍රියා කළහ.

ඩී. විදානගමච්චි මහතාගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වය 2012 මාර්තු 23 අවසන් වූ අතර එස්.ආර්. ආටිගල මහතා නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් වශයෙන් වැඩ භාර ගන්නා ලදී.

සමාලෝචිත වර්ෂය තුළ දී මණ්ඩලයේ සාමාජික සාමාජිකාවන්ගේ සංස්ථාපිත සම්බන්ධතාවය පහත වගුවෙන් නිරූපනය කෙරේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| සාමාජිකයාගේ නම | සම්බන්ධිත ආයතනයේ නම | සම්බන්ධතාව |
|---|---|---|
| ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය | කළුබොවිටියාන තේ කම්හල් සමාගම | අධ්‍යක්ෂිකා |
| ඩී.ඩී. ඩබ්.ඩී. සිල්වා මහතා | ලංකා බැංකුකරුවන්ගේ ආයතනය<br>ලංකා ණය තොරතුරු කාර්යාංශය<br>අපි වෙනුවෙන් අපි කළමණාකරණ මණ්ඩලය<br>ශ්‍රී ලංකා සුරැකුම්කුපත් හා විනිමය කොමිසම් සභාව | සභාපති<br>සභාපති<br>සාමාජික<br>කොමිෂන් සාමාජික |
| ඩී. විදානගමච්චි මහතා | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ඛනිජ තෙල් සංස්ථාව<br>ප්‍රාදේශීය සංවර්ධන බැංකුව<br>ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | අධ්‍යක්ෂක (30/05/2012 තෙක්)<br>සභාපති (28/01/2012–10/08/2012)<br>අධ්‍යක්ෂක (30/05/2012 තෙක්)<br>කොමිෂන් සාමාජික (30/05/2012 තෙක්) |
| එස්.ආර්. ආටිගල මහතා | ශ්‍රී ලංකා වරාය අධිකාරිය<br>ලංකා බැංකුව<br>උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණය<br>පශ්චාත් උපාධි ආයතනය පේරාදෙණිය, විශ්වවිද්‍යාලය | අධ්‍යක්ෂ<br>අධ්‍යක්ෂ<br>සාමාජික<br>සාමාජික |
| ඩී.කේ. හෙට්ටිආරච්චි මහතා | ශ්‍රී ලංකා පුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව<br>ශ්‍රී ලංකා ගණකාධිකරණ හා විගණන ප්‍රමිත මණ්ඩලය | සාමාජික<br>සාමාජික |
| ජී. ගුණවර්ධන මහතා | හැන්ඩ්ස් ඉන්ටනැෂනල් (පුද්) සමාගම<br>හැන්ඩ්ස් ඩිපින් (පුද්) සමාගම<br>ග්ලෝබල් ඉන්ටිමේට්ස් (පුද්) සමාගම<br>පොලි ග්ලවුස් ලංකා (පුද්) සමාගම<br>ඩකීස් බෑග්ස් නිෂ්පාදන (පුද්) සමාගම<br>ට්‍රොපිකල් ෆිශ් ලංකා (පුද්) සමාගම<br>ටුවෙන්ටි ෆස්ට් සෙන්චරි හෝම්ස් (පුද්) සමාගම<br>ලංකා ලෙෂර් රිසොට්ස් හෝල්ඩින්ස් (පුද්) සමාගම<br>කිඩ් කෙයාර් හෝම් ඇනඩ් රෙසිඩන්ට් ස්කූල් ට්‍රස්ට්<br>එජ් ලෙෂර් හෝල්ඩින්ස් (පුද්) සමාගම<br>හැන්ඩ්ස් ඔන් ඇඩ්වර්ටයිසින් පුද්ගලික සමාගම<br>නැචුරල් ප්‍රඩක්ට් රිසෝට් පුද්ගලික සමාගම<br>හැන්ඩ්ස් ප්‍රයිම් ඇන්ඩ් බෙවරේජ් පුද්ගලික සමාගම<br>මැනාර් රිෆයිනරීස් (පුද්) සමාගම<br>ශ්‍රී ලංකා අපනයන කරුවන්ගේ සංගමය<br>සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | සභාපති<br>සභාපති<br>සභාපති<br>සභාපති<br>සභාපති<br>සභාපති<br>සභාපති<br>සභාපති<br>සභාපති<br>සභාපති<br>සභාපති<br>සභාපති<br>සභාපති<br>සභාපති<br>සභාපති<br>කොමිෂන් සාමාජික |
| නවාස් රාජබ්ඩීන් මහතා | රාජබ්ඩීන් ඇන්ඩ් සන්ස් සමාගම<br>අපනයන සංවර්ධන මණ්ඩලය | කළමණාකාර අධ්‍යක්ෂ<br>මණ්ඩල සාමාජික |
| ගාමිණී කොහොන මහත | පුලතිසි ආනයන (පුද්) සමාගම | කළමණාකාර අධ්‍යක්ෂ |

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුළ සිදු කරන ලද වෙළඳපොළ අනුපාතිකයන් පැන වූ ගනුදෙනු හැර උක්ත ආයතන සමඟ සමාලෝචිත වර්ෂය තුළ දී වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු කර නොමැත.

# විගණකාධිපති වාර්තාව

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | FB/I/IBSL/2/2012 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2013 අගෝස්තු 06 දින. |

සභාපති,
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

**ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය දැක්වෙන ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2000 අංක 43 දරන ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනතේ 8 (3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2013 ජූනි 05 වන දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිත අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

# විගණකාධිපති වාර්තාව

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

#### 2.2.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2003 නොවැම්බර් 12 දිනැති අංක 19 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය පරිදි අලාභ ලබන ආයතන ප්‍රසාද දීමනා ලෙස ගෙවිය යුත්තේ එක් අයෙකුට රු. 1,000 ක් වුවද, මණ්ඩලය විසින් 2010, 2011 සහ 2012 වර්ෂ සඳහා ප්‍රසාද දීමනා ලෙස රු. 94,000 ක් ගෙවීම වෙනුවට එකතුව රු. 3,717,751 ක් ගෙවා තිබුණි.

#### 2.2.2 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2011 මැයි 01 දින සිට වාහන ණය ලබාදීමේදී අයකළ යුතු පොලිය සියයට 4.2 ක දක්වා අඩුකර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවලින් වූ බදුවලට පෙර මූල්‍ය ප්‍රතිඵලය රු. 19,056,965 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 27,251,414 ක් වුයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 8,194,449 ක් හෙවත් සියයට 30 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

ඉකුත් වර්ෂයට සාපේක්ෂව මණ්ඩලයේ හඳුනා ගත් ප්‍රදාන සියයට 76 කින්ද පොලී ආදායම සියයට 1,234 කින්ද වැඩිවී තිබීම හා වාර්ෂික ගාස්තු සියයට 39 කින් අඩුවීම මෙම මූල්‍ය ප්‍රතිඵල වර්ධනයට බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

2012 වර්ෂයට අදාල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පරිදි සමාලෝචිත වර්ෂයේදී ඉටු කල යුතුව තිබුණු කාර්යයන් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පැමිණිලි විමර්ශනය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කර නොතිබුණි.
(ආ) රක්ෂණ පාලක විසින් 1987 දී නිකුත් කරන ලද රෙගුලාසි සංශෝධනය කර නොතිබුණි.
(ඇ) අලාභ ගලපන්නන් සහ රක්ෂණ නියෝජිතයින් ලියාපදිංචිය සඳහා නියාමන ආකෘතියක් සකස් කර නොතිබුණි.
(ඈ) වර්ෂය තුළ දේශීය පුහුණු කටයුතු සඳහා රු. 811,321 ක වියදමක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණත්, එයින් රු. 756,321 ක් එනම් සියයට 93 ක් සුභසාධක කටයුතු සඳහා වැය කර තිබුණි. ඒ අනුව රක්ෂණ ක්ෂේත්‍රයේ පුහුණු කටයුතු සඳහා මණ්ඩලයේ අවධානය යොමු කර නොතිබුණි.
(ඉ) අධීක්ෂණ අංශය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතිය වෙනුවෙන් රු. මිලියන 2.5 ක ප්‍රතිපාදන සඳහා තිබුණත් අදාල කාර්යය ඉටුකර නොතිබුණි.

### 4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

2012 දෙසැම්බර් 31 දින වන විට මණ්ඩලයේ විධායක තනතුරු 05 ක් පුරප්පාඩුව පැවතිණි. ඉන් විධායක තනතුරු 02 ක් වර්ෂය ආරම්භයේ සිට පුරප්පාඩුව තිබුණි.

# විගණකාධිපති වාර්තාව

### 4.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) වැටුප් සංශෝධනය කිරීමට නියමිත ක්‍රමවේදය අනුගමනය නොකර මණ්ඩලය වැටුප් වැඩි කිරීම සිදුකර ඇත. මණ්ඩලයේ වැටුප් සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය මත මුලික වැටුපෙන් සියයට 25 උපරිමයට යටත්ව සංශෝධනය කිරීමට විරුද්ධත්වයක් නොමැති බව දන්වා එවා ඇති 2012 ජුලි 18 දිනැති පීඊඩී 360/12/2 (ii) දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය පදනම් කරගෙන වැටුප් වැඩි කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන මාස 06 සඳහා මණ්ඩලය විසින් රු. 1,564,338 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ආ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2009 දෙසැම්බර් 27 දිනැති අංක එම්/එෆ්/2/4/අයිබීඑස්එල්/ජීඊඑන් දරණ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය අනුව කාර්ය සාධනය පදනම් කරගෙන දිරි දීමනා ක්‍රමයක් සකස් කර ඉදිරිපත් කරන ලෙස දක්වා තිබුණත් 2013 ජුනි 30 දින වන විටත් දිරිදීමනා ක්‍රමයක් සකස් කර අනුමැතිය සඳහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) මණ්ඩලය විසින් 2011 වර්ෂයේ ප්‍රසාද දීමනා හා ලබා නොගත් නිවාඩු දින දීමනා වෙනුවෙන් නිලධාරින් 25 දෙනෙකුට එකතුව රු. 2,280,660 ක් ගෙවා තිබුණත්, ඒ සඳහා අදාල උපයන විට ගෙවීම් බදු අයකර දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. එසේම, පසුගිය වර්ෂවලදී ද ප්‍රසාද දීමනාව හා නිවාඩු දින දීමනා ගෙවීමේදී උපයන විට ගෙවීම් බදු අඩුකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඈ) 2011 වර්ෂයේ ඉතිරි කර ගත් අසනීප නිවාඩු සඳහා ගෙවීම් කිරීමේදී මණ්ඩලය සකස් කළ පරිපාලන අත්පොතෙහි සඳහන් නියමයන්ට අනුව කටයුතු නොකිරීම නිසා එකතුව රු. 259,556 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ඉ) 2009 සහ 2010 වර්ෂවල නිවාඩු දින ගෙවීම් කිරීමේදී මුලික වැටුප වෙනුවට දළ වැටුප පදනම් කරගෙන ගෙවීම් කිරීම හේතුවෙන් මණ්ඩලය ගෙවා තිබුණු එකතුව රු. 580,841 ක් අදාල නිලධාරින්ගෙන් අයකර ගැනීමට 2013 ජුනි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඊ) 2010 දෙසැම්බර් 09 වන දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් දෙන ලද නියෝග අංක 11 අනුව තුන්වන පාර්ශව වන්දි ගෙවීම සඳහා මෝටර් රථ කොමසාරිස්වරයා සමග සාකච්ඡා කර විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර එවීමට කටයුතු කරන ලෙස නියෝග කර තිබුණත් මේ පිළිබඳ සමාලෝචිත වර්ෂයේ දී ප්‍රමාණවත් කාර්ය භාරයක් ඉටුකර නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ගත වියදම් සහ සත්‍ය වියදම් අතර සියයට 55 සිට සියයට 234 දක්වා විචලනයන් නිරීක්ෂණය වුයෙන් ආයතනය සකස් කළ අයවැය ලේඛනය ඵලදායී මුල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(i) ගෙවීම්
(ii) පුහුණු වැඩසටහන්

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| 2.2.1 | **නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම** | |
| | 2003 නොවැම්බර් 12 දිනැති අංක 19 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය පරිදි අලාභ ලබන ආයතන ප්‍රසාද දීමනා ලෙස ගෙවිය යුත්තේ එක් අයෙකුට රු. 1,000 ක් වුවද, මණ්ඩලය විසින් 2010, 2011 සහ 2012 වර්ෂ සඳහා ප්‍රසාද දීමනා ලෙස රු. 94,000 ක් ගෙවීම වෙනුවට එකතුව රු. 3,717,751 ක් ගෙවා තිබුණි. | රක්ෂණ මණ්ඩලය ලාභ හෝ අලාභ ලබන ආයතනයක් නොවන අතර නියාමන කර්තව්‍යයක් සඳහා විශේෂිත බලතල සහිතව පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත කරනු ලැබූවකි.<br><br>එහෙයින් කළමනාකරණ චක්‍රලේඛ අනුව අලාභ ලබන ආයතනයන් ගනයට ගෙන සංසන්දනය කිරීම උචිත නොවේ.<br><br>අනිකුත් නියාමන ආයතන හා සමානව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අප විසින් නිලධාරීන්ට ප්‍රසාද දීමනා ගෙවා ඇත්තේ 2009.12.27 දිනැති ලිපියෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ එකඟතාවයද ලබාගෙන බව කාරුණිකව දන්වමි. |
| 2.2.2 | **ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවු ගනුදෙනු** | |
| | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2011 මැයි 01 දින සිට වාහන ණය ලබාදීමේදී අයකළ යුතු පොලිය සියයට 4.2 ක දක්වා අඩුකර තිබුණි. | පැවති වෙළඳපොල පොලී අනුපාතිකය පහත වැටීම පදනම් කරගෙන රක්ෂණ මණ්ඩලයේ සේවක වාහන ණය පොලී අනුපාතිකය 7.2% සිට 4.2% දක්වා අඩු කිරීම සඳහා 2011 මැයි 02 දින පැවති 103 වෙනි අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමැතිය ලබාගෙන ඇත.<br><br>මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කල නව පරිපාලන අත්පොතෙහි සඳහන් වන්නේද මෙම 4.2% ක පොලී අනුපාතිකය වන අතර මෙම අඩුකළ පොලී අනුපාතිකය මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා දැනටමත් ඉදිරිපත් කර ඇති අතර එම කරුණ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ විරුද්ධත්වයක් හෝ වෙනස් කළයුතු බවක් සඳහන් කර නොමැත. තවද, අනිකුත් නියාමන ආයතන විසින්ද අනුගමනය කරනු ලබන්නේ මෙකී ණය පොලී අනුපාතිකය බව දන්වනු කැමැත්තෙමි. |
| 3. | **මූල්‍ය සමාලෝචනය** | |
| 3.1 | **මූල්‍ය ප්‍රතිඵලය** | |
| | සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවලින් වූ බදුවලට පෙර මූල්‍ය ප්‍රතිඵලය රු. 19,056,965 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 27,251,414 ක් වුයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 8,194,449 ක් හෙවත් සියයට 30 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.<br><br>ඉකුත් වර්ෂයට සාපේක්ෂව මණ්ඩලයේ හදුනා ගත් ප්‍රදාන සියයට 76 කින්ද පොලි ආදායම සියයට 1,234 කින්ද වැඩිවී තිබීම හා වාර්ෂික ගාස්තු සියයට 39 කින් අඩුවීම මෙම මූල්‍ය ප්‍රතිඵල වර්ධනයට බලපා තිබුණි. | 2011 වසර සඳහා සංශෝධිත සංඛ්‍යාවන් යොදාගැනීම අවශ්‍ය වේ. ඔබ මෙහි දක්වා ඇති ගණනයන් අනුව මුළු ආදායමට අදාළ රු. 2,870,000/- ක මුදල 2011 හා 2012 යන වර්ෂ දෙකෙහිම ආදායමක් ලෙස සලකා ඇති බව පෙනී යන අතර එමගින් මෙම මුදල ද්විත්ව ගණනයක් බව දන්වනු කැමැත්තෙමි.<br><br>ඒ අනුව පෙර වසර හා සාපේක්ෂව වාර්ෂික ගාස්තු සියයට 75 කින්ද පොලි ආදායම සියයට 1,234 කින්ද හඳුනාගත් ප්‍රදාන සියයට 10 කින්ද, වැඩිවී ඇති අතර අනෙකුත් ආදායම් සියයට 58 කින් අඩුවී ඇත. |

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| **4.** | **මෙහෙයුම් සමාලෝචනය** | |
| **4.1** | **කාර්ය සාධනය** | |
| | 2012 වර්ෂයට අදාල වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම පරිදි සමාලෝචිත වර්ෂයේදී ඉටු කල යුතුව තිබුණු කාර්යයන් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| | (අ) පැමිණිලි විමර්ශනය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කර නොතිබුණි. | පැමිණිලි විමර්ශනය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශක සංග්‍රහයක්, දැනටමත් විමර්ශන අංශය විසින් කෙටුම්පත් කර ඇති අතර එය තව දුරටත් පරීක්ෂා කරමින් පවතී. මෙම කෙටුම්පත් මාර්ගෝපදේශ සංග්‍රහය, 2013 දෙවන කාර්තුව තුළ අවසන් කිරීමට බලාපොරොත්තු වේ. |
| | (ආ) රක්ෂණ පාලක විසින් 1987 දී නිකුත් කරන ලද රෙගුලාසි සංශෝධනය කර නොතිබුණි. | එකී රෙගුලාසි කෙසේ සංශෝධනය විය යුතුදැයි පරීක්ෂා කිරීම 2012 වර්ෂයේදී ආරම්භ කළද, අංශයේ නීති නිලධාරීන් සේවයෙන් ඉවත්වී යෑමත් සමග නීති අංශය නව නීති නිලධාරීන්ගෙන් සමන්විත වීම හේතුකොටගෙන 2012 වර්ෂයේ අවසන් කළ නොහැකි වූ හෙයින් එකී කර්තව්‍ය 2013 ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගතයට ඇතුලත් කර ඇත. අංශය විසින් 2013 වර්ෂයේදී එකී කාර්යය අවසන් කිරීමට බලාපොරොත්තු වේ. |
| | (ඇ) අලාභ ගලපන්නන් සහ රක්ෂණ නියෝජිතයින් ලියාපදිංචිය සඳහා නියාමන ආකෘතියක් සකස් කර නොතිබුණි. | ඉහත කී හේතුව නිසාම එකී කර්තව්‍ය 2012 වර්ෂයේ නිම කළ නොහැකි විය. ඒ අනුව 2013 ක්‍රියාකාරී සැලැස්ම අනුව 2013 වර්ෂයේදී එකී කාර්යය අවසන් කිරීමට බලාපොරොත්තු වේ. |
| | (ඈ) වර්ෂය තුළ දේශිය පුහුණු කටයුතු සඳහා රු. 811,321 ක වියදමක් මුලූ ප්‍රකාශනවල දක්වා තිබුණත්, එයින් රු. 756,321 ක් එනම් සියයට 93 ක් සුභසාධක කටයුතු සඳහා වැය කර තිබුණි. ඒ අනුව රක්ෂණ ක්ෂේත්‍රයේ පුහුණු කටයුතු සඳහා මණ්ඩලයේ අවධානය යොමු කර නොතිබුණි. | වර්ෂය තුල නේවාසික හා අනිකුත් දේශීය පුහුණු පාඨමාලා සඳහා රු. 811,321/- ක වියදමක් දරා ඇත. රක්ෂණ නියාමන කටයුතු වලට අදාල දේශීය පුහුණු පාඨමාලා අඩු බැවින් අදාල ක්ෂේත්‍රයේ විදේශීය පුහුණු පාඨමාලා සඳහා නිලධාරීන් යොමු කිරීමට දැඩි අවධානයක් යොමුකර ඇත. අදාළ වර්ෂය තුළදී රක්ෂණ ක්ෂේත්‍රයේ පුහුණුවීම් කටයුතු සඳහා රු. 4,042,870/- ක් වියදම් කර ඇති බව අවධානයට යොමු කරනු කැමැත්තෙමි. තවද දේශීය පුහුණු කටයුතු රක්ෂණ ක්ෂේත්‍රයේ පුහුණුවීම් සඳහා පමණක් සීමා කිරීම උචිත නොවේ. එක් එක් නිලධාරීන්ගේ විෂය පථයට අදාල රාජකාරී කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීමට අවශ්‍ය සම්පිණ්ඩනාත්මක පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමට මණ්ඩලය විසින් අවශ්‍ය පියවර ගෙන ඇත. |
| | (ඉ) අධීක්ෂණ අංශය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතිය වෙනුවෙන් රුපියල් මිලියන 2.5 ක ප්‍රතිපාදන සලකා තිබුණත් අදාල කාර්යය ඉටුකර නොතිබුණි. | කළමනාකරණ පද්ධතියක් සකස් කිරීම නිසි අධ්‍යයනයක් සිදුකොට කළයුතු බැවින් ඒ සඳහා අදාල මූලික අධ්‍යයන කටයුතු 2012 වර්ෂය තුල සිදුකරන ලද අතර 2013 වර්ෂයේ අවශ්‍ය ඉදිරි කටයුතු කරගෙන යමින් පවතී. තවද, මණ්ඩලයේ ප්‍රධාන අංශයන්හී ඇතිවූ නව ප්‍රවණතා හා වෙනස්කම් සැලකිල්ලට ගනිමින් මෙකී කළමනාකරණ පද්ධතිය සැකසීමේ කටයුතු අවශ්‍ය පරිදි වෙනස්කරමින්ද අවශ්‍ය වෘත්තීමය නිපුණතාවය ලබා ගනිමින්ද ඉටු කිරීමට බලාපොරොත්තු වේ. |
| **4.2** | **කාර්ය මණ්ඩල පරිපාලනය** | |
| | 2012 දෙසැම්බර් 31 දින වන විට මණ්ඩලයේ විධායක තනතුරු 05 ක් පුරප්පාඩුව පැවතිණි. ඉන් විධායක තනතුරු 02 ක් වර්ෂය ආරම්භයේ සිට පුරප්පාඩුව පැවතුනි. | වර්ෂය ආරම්භයේ සිට පුරප්පාඩුව පැවති සහකාර අධ්‍යක්ෂක තනතුරු 2 පිරවීමේ අවශ්‍යතාවයක් ප්‍රවර්තන වර්ෂය තුල ඇති නොවූ බැවින් මෙකී බඳවා ගැනීම් සිදුකර නොමැත. ඉතිරි විධායක තනතුරු 3 සඳහා නිලධාරීන් තෝරාගෙන ඇති අතර ඉදිරි මාසය තුළදී අදාල බඳවා ගැනීම් කටයුතු සම්පූර්ණ කරනු ඇත. |

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| 4.3 | කළමනාකරණ අකාර්යක්ෂමතා | |
| (අ) | වැටුප් සංශෝධනය කිරීමට නියමිත ක්‍රමවේදය අනුගමනය නොකර මණ්ඩලය වැටුප් වැඩි කිරීම සිදුකර ඇත. මණ්ඩලයේ වැටුප් සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය මත මූලික වැටුපෙන් සියයට 25 උපරිමයට යටත්ව සංශෝධනය කිරීමට විරුද්ධත්වයක් නොමැති බව දන්වා එවා ඇති 2012 ජුලි 18 දිනැති පීඊඩී 360/12/2 (ii) දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය පදනම් කරගෙන වැටුප් වැඩි කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන මාස 06 සඳහා මණ්ඩලය විසින් රු. 1,564,338 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | ඉහත අවස්ථා කීපයකදී විගණනයට පෙන්වා දී ඇති පරිදි ආයතනයේ සේවක පාර්ශ්‍රමික හා දීමනා තීරණය කිරීමේ බලය අදාළ පනත මගින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා දී ඇති බව දන්වනු කැමැත්තෙමි.<br><br>රක්ෂණ මණ්ඩලය විසින් 2012.07.01 දින සිට කාර්ය මණ්ඩල වැටුප් 25% කින් වැඩිකර ඇත්තේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ, ලේකම්තුමාගේ විධිමත් අනුමැතිය පරිදි වේ. භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වරයෙක්ද නිල බලයෙන් අප අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වය දරන බවද කාරුණිකව සඳහන් කරමි.<br><br>එම අනුමැතියට අනුකූලව වැඩිකරන ලද සේවක වැටුප් ගෙවන ලද බැවින් ඔබගේ විමසුමෙහි සඳහන් පරිදි වැඩිපුර මුදලක් ගෙවා නොමැති බව කාරුණිකව දන්වමි.<br><br>2005 වසරේදී ආයතනය ආරම්භ කරනු ලැබීමෙන් වසර 7කට පසුව සිදුකරනු ලැබූ ප්‍රථම වැටුප් සංශෝධනය මෙය වන අතර මෙය අනුමැතියකින් පසුව නිසියාකාරව සිදුකරනු ලැබූ ගෙවීමක් බවද සඳහන් කරමි. |
| (ආ) | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2009 දෙසැම්බර් 27 දිනැති අංක MF2/4/IBSL/GEN දරණ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය අනුව කාර්ය සාධනය පදනම් කරගෙන දිරි දීමනා ක්‍රමයක් සකස් කර ඉදිරිපත් කරන ලෙස දක්වා තිබුණත් 2013 ජුනි 30 දින වන විටත් දිරිදීමනා ක්‍රමයක් සකස් කර අනුමැතිය සඳහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලිපියෙහි සඳහන් පරිදි කාර්ය සාධනය (Performance Appraisal) පදනම් කරගත් ප්‍රසාද දීමනා ක්‍රමයක් 2009 වසරේ සිට ක්‍රියාත්මක කරනු ලැබේ.<br><br>කාර්ය සාධන ඇගැයීම් ආකෘති පත්‍රයේ පිටපතක් 2010.11.25 දින භාණ්ඩාගාරය වෙත යවා ඇත. |
| (ඇ) | මණ්ඩලය විසින් 2011 වර්ෂයේ ප්‍රසාද දීමනා හා ලබා නොගත් නිවාඩු දින දීමනා වෙනුවෙන් නිලධාරීන් 25 දෙනෙකුට එකතුව රු. 2,280,660 ක් ගෙවා තිබුණත්, ඒ සඳහා අදාල උපයන විට ගෙවීම් බදු අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. එසේම, පසුගිය වර්ෂවලදී ද ප්‍රසාද දීමනාව හා නිවාඩු දින දීමනා ගෙවීමේදී උපයන විට ගෙවීම් බදු අඩුකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | 2012 වර්ෂය සඳහා නිසි පරිදි බදු ගෙවා ඇති බව දන්වනු කැමැත්තෙමි. |

# විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

| | විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම |
|---|---|---|
| (ඈ) | 2011 වර්ෂයේ ඉතිරි කර ගත් අසනීප නිවාඩු සඳහා ගෙවීම් කිරීමේදී මණ්ඩලය සකස් කළ පරිපාලන අත්පොතෙහි සඳහන් නියමයන්ට අනුව කටයුතු නොකිරීම නිසා එකතුව රු. 259,556 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | විගණන වර්ෂය වන 2012 වර්ෂයේ අසනීප නිවාඩු සඳහා ගෙවීම් ගණනය කරනු ලැබුවේ පරිපාලන අත්පොතේ නියමයන්ට අනුකූලවය. එම නිසා 2012 වර්ෂයේ නිසි පරිදි ගෙවීම් සිදුකර ඇත. |
| (ඉ) | 2009 සහ 2010 වර්ෂවල නිවාඩු දින දීමනා ගෙවීම් කිරීමේදී මූලික වැටුප වෙනුවට දළ වැටුප පදනම් කරගෙන ගෙවීම් කිරීම හේතුවෙන් මණ්ඩලය ගෙවා තිබුණු එකතුව රු. 580,841 ක් අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට 2013 ජුනි 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | 2012 වර්ෂයේ ඉතිරිකරගත් නිවාඩු සඳහා රක්ෂණ මණ්ඩලයේ ගෙවීම් කර ඇත්තේ පරිපාලන අත්පොතෙහි සඳහන් පරිදි මූලික වැටුප පදනම් කරගෙන වේ. |
| (ඊ) | 2010 දෙසැම්බර් 09 වන දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් දෙන ලද නියෝග අංක 11 අනුව තුන්වන පාර්ශව වන්දි ගෙවීම සඳහා මෝටර් රථ කොමසාරිස්වරයා සමඟ සාකච්ඡා කර විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර එවීමට කටයුතු කරන ලෙස නියෝග කර තිබුණත් මේ පිළිබඳ සමාලෝචිත වර්ෂයේ දී ප්‍රමාණවත් කාර්ය භාරයක් ඉටුකර නොතිබුණි. | 2012 නොවැම්බර් 12 වන දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී (COPE) ඉහත කරුණ සම්බන්ධයෙන් සවිස්තරාත්මක විස්තර කිරීමක් සිදු කරන ලදී. එදින එම කාරක සභාවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ පිටපතක් විගණනයට සපයා ඇත. තුන්වන පාර්ශව මෝටර් රථ හිමිකම් ගෙවීම සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග එකී වාර්තාවේ දක්වා ඇත.<br><br>2012 වර්ෂයේ පැවැත්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ පසු විපරමක් ලෙස එහි සභාපතිතුමා විසින් නම් කරන ලද නියෝජිතයින් තිදෙනෙකු සමඟ 2013 වර්ෂයේ සාකච්ඡා වට කිහිපයක්ම පැවැත්වූ බවද සඳහන් කරනු කැමැත්තෙමි. මෙහි ප්‍රගතිය පිළිබඳව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා වරින්වර දැනුවත් කර ඇත. |
| **5.** | **ගිණුම්කටයුතුභාවය සහ යහ පාලනය** | |
| | **අයවැය පාලනය** | |
| | සමාලෝචිත වර්ෂයේ අයවැය ගත වියදම් සහ සත්‍ය වියදම් අතර සියයට 55 සිට සියයට 234 දක්වා විචලනයන් නිරීක්ෂණය වුයෙන් ආයතනය සකස් කළ අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | ආයතනයේ පාලනයෙන් පරිබාහිරව සිදුවූ වෙනස්වීම් හේතුකොටගෙන සමහර වියදම්වල විචල්‍යතා පෙන්නුම් කෙරිණි. එනමුදු අදාළ විචලනයන් සැලකිල්ලට ගනිමින් 2013 අයවැය ලේඛණය සකස් කරන ලදී |
| **6.** | **පද්ධති හා පාලනයන්** | |
| | විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය<br>(i) ගෙවීම්<br>(ii) පුහුණු වැඩසටහන් | මෙම පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. |

# පරිශිෂ්ඨය I

2012 දෙසැම්බර් 31 දිනට 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම්

| අංකය | රක්ෂණ සමාගම | ව්‍යාපාර කටයුතු වර්ගය |
|---|---|---|
| 1 | ඒඅයිඒ ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |
| 2 | ඒඅයිජී ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |
| 3 | ඇලියොන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 4 | ඇලියොන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 5 | අමානා තකාෆුල් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |
| 6 | ආර්පිකෝ ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 7 | ඒෂියන් එලායන්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |
| 8 | සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |
| 9 | *සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 10 | කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 11 | කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |
| 12 | එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |
| 13 | ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |
| 14 | ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 15 | එල්ඕඑල්සී ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |
| 16 | එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |
| 17 | ජාතික රක්ෂණ භාර අරමුදල | සාමාන්‍ය රක්ෂණය |
| 18 | ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 19 | පීපල්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 20 | සීමාසහිත සණස රක්ෂණ සමාගම | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |
| 21 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |
| 22 | යූනියන් ඇෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| | | සාමාන්‍ය රක්ෂණය |

* 2009 අගෝස්තු 5 වැනි දා සිට සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් රක්ෂණ ව්‍යාපාරයෙහි යෙදීම තහනම් කර ඇත.

# පරිශිෂ්ඨය II

2012 දෙසැම්බර් 31 දිනට 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ තැරැව්කාර සමාගම්

| අංකය | රක්ෂණ තැරැව්කරු | ව්‍යාපාර කටයුතු වර්ගය |
|---|---|---|
| 1 | ඒඑම්ඩබ්ලිව් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 2 | ඒඩීඉසෙඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 3 | එයිට්කන් ස්පෙන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 4 | ඇල්ෆින්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 5 | ඇලියෝන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 6 | ඇක්විලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 7 | ඇසට්ලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | සාමාන්‍ය |
| 8 | බ්‍රිලියන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 9 | සියෙක්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | සාමාන්‍ය |
| 10 | සීලොන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 11 | සිනර්ජි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 12 | සීඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 13 | කලම්බුරේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 14 | කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 15 | දයාසරණ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 16 | ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 17 | ඉක්විටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 18 | එසාජි කර්මිජි ඇන්ඩ් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 19 | ෆින්ලේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 20 | ෆෝසයිට් ඉන්ෂුවරන්ස් ඇන්ඩ් රීඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 21 | ග්ලෝබල් ඉන්ෂුවරන්ස් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 22 | ග්‍රෑන්ඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 23 | ගාඩියන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 24 | ඉන්ඩස්ට්‍රියල් ඇන්ඩ් කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 25 | ජේ ඉන්ෂුවරන්ස් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 26 | ජේඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 27 | කැලණි යුනි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 28 | එල්එම් ඇන්ඩ් ඩී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 29 | ලක් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 30 | ලයිෆ් ඇන්ඩ් ජෙනරල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 31 | මැක්වුඩ්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 32 | මැක්ස්වෙල් එන්ටප්‍රයිසස් ප්‍රයිවට් ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 33 | මර්කන්ටයිල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 34 | නේෂන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 35 | පයනියර් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 36 | ප්ලැසිඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 37 | ප්‍රෝකෙයා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |

# පරිශිෂ්ඨය II

| | | |
|---|---|---|
| 38 | ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් ඇෂුවරන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 39 | ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් අට්මෝස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 40 | රියලයන්ස් ඉන්ෂුවරන්ස් ඒවීජී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 41 | රියලයන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 42 | රින්කූන් ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 43 | රෝපා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 44 | සැම්සන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 45 | සේනාරත්න ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 46 | සෙංකඩගල ඉන්ෂුවරන්ස් බ්‍රෝකින් සරවිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 47 | සදර්න් මර්චන්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 48 | ස්ටැටර්ජික් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 49 | ට්‍රස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 50 | යූඑන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 51 | යුනයිටඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය |
| 52 | වෙරාසිටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 53 | වික්ටර් එමානුවෙල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |
| 54 | සෙනිත් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන හා සාමාන්‍ය |

# පාරිභාෂික ශබ්ද මාලාව

**සමුච්චිත වීම**
එක් සමාගමක් සමඟ පවතින සැලකිය යුතු රක්ෂිත හෝ ප්‍රාරක්ෂිත අවදානම් සංඛ්‍යාවක් පාඩු ලබන සිදුවීමක් නිසා එක්වර පීඩාකාරී බවට පත්වන තත්ත්වයකි.

**අත්කර ගැනීමේ වියදම්**
අබිනව රක්ෂණ ගිවිසුම් අත්කර ගැනීම සහ දැනටමත් පවත්නා රක්ෂණ ගිවිසුම් අළුත්කිරීම (උදා :- කොමිස් මුදල්) යන අවස්ථාවලදී වෙනස්වීම්වලට ලක්වන සහ එයට මූලික වශයෙන් සම්බන්ධතාවක් දක්වන සියළු වියදම්.

**ජීවගණකඥ**
රක්ෂණය, ආයෝජනය මූල්‍ය කළමනාකරණය සහ ප්‍රජා විද්‍යාව ආශ්‍රිත ගැටළුවලට සම්භාවිතා සහ සංඛ්‍යානමය සිද්ධාන්ත යොදා ගන්නා විශේෂඥයෙකි.

**පරිපාලන වියදම්**
දේපල, පිරියත හා උපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදන සහ සේවක පිරිවැය සහිතව වාරික එකතු කිරීමේ දී ආයෝජන කළඹ පරිපාලනයේ දී ජනනය වන පරිපාලන ස්වභාවයේ වියදම්.

**ආවේශ්‍යතා දැක්විය හැකි වත්කම්**
රක්ෂකයාගේ ව්‍යවස්ථාපිත නුබුන්වත්භාවය නිශ්චය කිරීමේ දී ඇතුළත් කරනු ලබන වත්කම්, මෙවැනි වත්කම් 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනතෙහි නිශ්චිතව දක්වා තිබේ.

**වාර්ෂිකය**
යම් කිසි නිශ්චිත කාලසීමාවක් සඳහා වාර්ෂිකලාභියාගේ ආයු කාලය මුළුල්ලේ හෝ වාරමය වශයෙන් ආදායම් ප්‍රතිලාභ ගෙවන ජීවිත රක්ෂණයකි. විලම්භිත හා ක්ෂණිකව ක්‍රියාත්මක වන යනුවෙන් වන මූලික වශයෙන් වර්ග දෙකකට අයත් වාර්ෂික පවතියි. ගෙවීම් සිදුකිරීම යම්කිසි අනාගත කාලයකදී ආරම්භ වන්නේනම් එය විලම්භිත වාර්ෂිකය නම්වේ. ගිවිසුම ආරම්භ වන අවස්ථාවේදීම අදාල ගෙවීම් සිදුකිරීම අරඹන්නේනම් එය ක්ෂණික වාරිකය නම්වේ.

**ප්‍රතිලාභිය**
ඔප්පු හිමියාගේ මරණයක දී රක්ෂිත මුදල් සහ අනෙකුත් ප්‍රතිලාභ ලැබිය යුතු ආදායකයා ලෙස ඔප්පු හිමියා විසින් නම් කරනු ලබන පුද්ගලයා.

**ප්‍රතිරක්ෂිතයා**
ප්‍රතිරක්ෂණ සමාගමක සේවාදායකයෙක්. (ප්‍රාථමික රක්ෂණ සමාගම)

**හිමිකම් පෑම**
දේපල විනාශ වීම හෝ හානි වීම සහ ඒ ආශ්‍රිත මරණය හෝ තුවාල සිදුවීම, ආරෝග්‍යශාලා හෝ වෛද්‍ය බිල්පත් දැරීම. රක්ෂිතයාගේ මරණය හෝ ආබාධිතවීම, උපපාදන ඔප්පුවක් කල් පිරීම, විශ්‍රාමික වයසට පත්වීම යනා දී ආකාරවලට රක්ෂණයට බඳුන් වූ කාරණය සිදුවීම හේතු කරගෙන හෝ ඔප්පුවක් පවාරණය කිරීමේ දී රක්ෂණ ගිවිසුම පරිදි ගෙවිය යුතු මුදල.

**දරන ලද හිමිකම් පෑම**
වර්ෂය ආරම්භයේ දි සහ වර්ෂය අවසානයේ දී හිඟ තබා ඇති හිමිකම්පෑම් සඳහා වූ ප්‍රතිපාදන වෙනුවෙන් අවශ්‍ය අවස්ථාවල දී ගැලපීම් කළ පසු ගිණුම් වර්ෂයක් තුළ හිමිකම් පෑම සඳහා අවශය කටයුතු කිරීමට දරන වියදම සහිතව ගෙවන ලද මුළු හිමිකම් පෑම් වටිනාකම.

**දරන ලද නමුත් වාර්තා නොකරන ලද හිමිකම් පෑම්**
දේපල, වගකීම් සහ මූල්‍ය යන රක්ෂණ පිළිබඳව සිදුවී ඇති නමුත් රක්ෂකයා වෙත තවමත් වාර්තා කරනු ලැබ නැති අලාභ ආවරණය කිරීම සඳහා දැරීමට සිදුවනු ඇතැයි අපේක්ෂිත පිරිවැය නිරූපණය කරමින් වර්ෂය අවසානයේ දී ඇති කරනු ලබන සංචිතයකි.

**හිඟ සිටි හිමිකම් පෑම් සංචිතය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු**
සිදු වූ නමුත් වාර්තා කරනු ලැබ නොතිබූ හිමිකම් සහ ඒවා පිළිබඳව කටයුතු කිරීමේ දී දරන්නට සිදුවන පිරිවැය සහිතව ශේෂ පත්‍ර දිනය වන විට වී ඇති සිද්ධි වෙනුවෙන් ඒවා ආවරණය කිරීම සඳහා දැරීමට සිදුවනු ඇතැයි අපේක්ෂිත පිරිවැය නිරූපණය කරමින් වර්ෂය අවසානයේ දී ඇති කරනු ලබන සංචිතයකි.

**හිඟ සිටි හිමිකම් පෑම් සංචිතය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු**
සිදු වූ නමුත් වාර්තා කරනු ලැබ නොතිබූ හිමිකම් සහ ඒවා පිළිබඳව කටයුතු කිරීමේ දී දරන්නට සිදුවන පිරිවැය සහිතව ශේෂ පත්‍ර දිනය වන විට වී ඇති සිද්ධි වෙනුවෙන් ඒවා ආවරණය කිරීමට දැරිය යුතු ඇස්තමේන්තුගත පිරිවැයෙන් එවැනි හිමිකම් පෑම් සඳහා මේ වන විටත් ගෙවා ඇති මුදල අඩු කළ පසු ලැබෙන අගය.

**සහභාග රක්ෂණය**
නිශ්චිත වාර මුදල් එකඟ වුණු අනුපාතයක් මත ගෙවීමේ පදනම මත අවදානම් ආවරණය සඳහා රක්ෂකයන් දෙදෙනකු හෝ කිහිප දෙනෙකු රක්ෂිතයා සමඟ ඇති කර ගන්නා තනි ගිවිසුමක්.

**කොමිස්**
රක්ෂකයාගේ නිෂ්පාදනයක් විකිණීම හෝ සේවාකරණය වෙනුවෙන් තැරැව්කරුවකුට හෝ රක්ෂණ නියෝජිතයකුට කරන ගෙවීමක්.

**විලම්භිත අත්කර ගැනීමේ පිරිවැය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු**
වාර්ෂික පදනමට ගිණුම්කරණයේ දී එක් ගිණුම් වර්ෂයක සිට ඊළඟ ගිණුම් වර්ෂයට ගෙන යා යුතු, අවදානම හා සම්බන්ධ ගිවිසුම්වල කල් ඉකුත් නොවූ කාලය සඳහා අදාළ වන අත්පත් කර ගැනීමේ පිරිවැය.

**ඉපැයූ වාරික**
ගිණුම් කාල පරිච්ඡේදයක ආරම්භයේ දී සහ අවසානයේ දී නොඉපැයූ වාරික ප්‍රතිපාදන වෙනුවෙන් සැලසුම් කළ ලිඛිත වාරික මුදල්.

**සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු**
ගිනි, මුහුදු, උවදුරු, මෝටර් වාහන හෝ මිශ්‍ර රක්ෂණ ව්‍යාපාර කටයුතු එකක් හෝ කිහිපයක් තනිව හෝ බද්ධව පවත්වාගෙන යාම, ගිණුම් කාල පරිච්ඡේදයක් තුළ දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු සම්බන්ධව ලද මුළු වාරික හෝ ලැබිය යුතු මුළු වාරික ප්‍රතිරක්ෂණ කටයුතු සඳහා ලැබිය යුතු වාරික ද සහිත අගය

**දළ වාරිකය**
වට්ටම්, ආපසු ගෙවීම් හා ප්‍රතිදාන අඩුකිරීමෙන් පසුව එහෙත් ඉඩ දෙන ලද ප්‍රතිරක්ෂණ සඳහා රක්ෂණකරුවකු විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතු වාරික කිසිවක් අඩුකිරීමට පෙර වූ වාරිකය.

**රක්ෂණ අවදානම**
රක්ෂණයට බඳුන් වූ සිද්ධිය වීම, හිමිකම් පෑම්වල වටිනාකම හෝ හිමිකම් ගෙවීම් සිදුවන කාලය පිළිබඳව පවතින අවිනිශ්චිතතා.

**රක්ෂකයා**
2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පොදු සමාගමක් ලෙස සංස්ථාපිත කර ඇති සහ 2000 අංක 143 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති සමාගමකි.

**දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර කටයුතු**
මරණයක හෝ මනුෂ්‍ය ජීවිතයට බලපාන යම් අවිනිශ්චිත සිද්ධියක් වූ විට මුදල් ගෙවීම සඳහා සහතික කැරෙන ගිවිසුම ද ඇතුළුව මනුෂ්‍ය ජීවිතය පිළිබඳ රක්ෂණ ගිවිසුම්වලට සහ මනුෂ්‍ය ජීවිතය මත රඳා සිටිමින් යම් කාල පරිච්ඡේදයක් සඳහා වාරික ගෙවීමට යටත් ගිවිසුම්වලට එළැඹීමේ හෝ එවැනි ගිවිසුම් පවත්වාගෙන යාමේ ව්‍යාපාරයකි.

# පාරිභාෂික ශබ්ද මාලාව

**කල්පිරීම**

දීර්ඝකාලීන රක්ෂණ ඔප්පුවක් යටතේ එහි වගන්ති ප්‍රකාරව කාලය අවසන් වීමෙන් රක්ෂිත මුදල් ගෙවිය යුතු අවස්ථාව

**ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය හෝ ශුද්ධ අලාභ අනුපාතය**

රක්ෂකයන් විසින් ශුද්ධ ආදායම් (අදාළ ප්‍රතිරක්ෂණයෙන් අඩු කළ පසු) සම්බන්ධ ශුද්ධ අලාභ වියදම් නිරූපණය කිරීමට උපයෝගී කර ගනු ලබන සූත්‍රයකි.

$$\frac{\text{දරන ලද ශුද්ධ හිමිකම් පෑම්}}{\text{ඉපැයූ ශුද්ධ වාරික ආදායම}} \times 100$$

**ශුද්ධ ඒකාබද්ධ අනුපාතය - ජීවිත නොවන**

ශුද්ධ අලාභ අනුපාතය සමඟ ශුද්ධ වියදම් අනුපාතය සම්බන්ධ කර රක්ෂකයාගේ මෙහෙයුම්වල ලාභදායීත්වය මෙයින් නිරූපණය වෙයි. මෙම ඒකාබද්ධ අනුපාතය ගණනය කිරීමේ දී ආයෝජන අදායම් සැලකිල්ලට නොගැනෙයි.

$$\frac{\text{දරන ලද ශුද්ධ හිමිකම් පෑම්} \times 100}{\text{ඉපැයූ ශුද්ධ වාරික ආදායම}} + \frac{\text{වියදම්} \times 100}{\text{ඉපැයූ ශුද්ධ වාරික ආදායම}}$$

**ශුද්ධ ඉපැයූ වාරික - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු**

ප්‍රතිරක්ෂණ වාරික සහ නොඉපැයූ වාරිකවල වැඩිවීම සහ අඩුවීම සඳහා ගළපන ලද දළ ලිඛිත වාරික ආදායම

**ශුද්ධ වියදම් අනුපාතය - ජීවිත නොවන**

ආදායම් අත්පත් කර ගැනීමේ සහ පරිපාලන වියදම් (උදා :- කොමිස්, බදු, සේවක පඩිවැය, අලෙවිකරණ සහ මෙහෙයුම් වියදම්) අදාළ කර ගැනීම සඳහා රක්ෂණ සමාගම් විසින් යොදා ගනු ලබන සූත්‍රයකි.

**ශුද්ධ අලාභ අනුපාතය - ජීවිත නොවන**

ශුද්ධ ඉපැයූ වාරිකවලට (අදාළ ප්‍රතිරක්ෂණ අඩු කළ පසු) දරන ලද ශුද්ධ හිමිකම් පෑම් අදාළ කර ගැනීම සඳහා රක්ෂණ සමාගම් විසින් යොදා ගනු ලබන සූත්‍රයකි.

**සහභාගීත්වය රහිතව ඔප්පුව - ජීවිත රක්ෂණ ව්‍යාපාර කටයුතු**

ජීවිත රක්ෂණ ව්‍යාපාරය කටයුතුවල දී ඔප්පු හිමියාට අදාළ ජීවිත රක්ෂණ අරමුදලේ අතිරික්තයට හිමිකම ලැබීමට ගිවිසුම්මය අයිතියක් නොමැති රක්ෂණ ඔප්පු.

**ඔප්පුව**

රක්ෂණ ගිවිසුමක නියම හා කොන්දේසි ඇතුළත් කර ඇති ලියැවිල්ලකි.

**ඔප්පු හිමියා**

රක්ෂණකරු සමඟ අදාළ ගිවිසුමට පැමිණ අදාළ රක්ෂණ ඔප්පුවේ තත්කාලීන නෛතික හිමිකරුවන තැනැත්තා.

**ඔප්පු ණය**

ජීවිත රක්ෂණ ඔප්පුවක පවාරන අගය ඇපයට තබමින් ඔප්පු හිමියකු විසින් රක්ෂකයාගෙන් ගනු ලබන ණය මුදලකි. මෙම ණය මුදල සාමාන්‍යයෙන් ඔප්පුවේ වර්තමාන පවාරන වටිනාකමේ ප්‍රතිශතයක් සඳහා සීමාවන අතර එවැනි ණය මුදල් සඳහා පොලී අය කරනු ලැබේ.

**ප්‍රාථමික රක්ෂකයා**

රක්ෂණ වාරිකයක් වෙනුවෙන් අවදානම් බාර ගනු ලබන්නා වූ ද රක්ෂණ ඔප්පු හිමියා සමඟ සෘජු ගිවිසුම්ගත සම්බන්ධතාවක් පවත්වාගනු ලබන්නා වූ ද රක්ෂණ සමාගම් (තනි පුද්ගලයන්, ආයතන හෝ සංවිධාන)

**මෙහෙයුම් ලාභය**

ආයෝජන ආදායම, ශුද්ධ ප්‍රාග්ධන ලාභ සහ වෙනත් ආදායම් සැලකිල්ලට ගත් පසු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවලින් උපයා ගන්නා ලද ලාභය

**ප්‍රතිරක්ෂණය**

එක් පාර්ශ්වයක් (ප්‍රතිරක්ෂකයා) විසින් කිසියම් ප්‍රතිෂ්ඨාවක් සමඟ අනෙකුත් පාර්ශ්වයක් (ප්‍රතිරක්ෂිතයා - ප්‍රාථමික රක්ෂණකරු එළැඹුණු රක්ෂණ ඔප්පුවක හෝ ඔප්පුවල වගකීම්වලින් කොටසක් හෝ මුළුමනින්ම හානිපූරණය කිරීමට ඇති කර ගනු ලබන එකඟතාවකි.

**ප්‍රතිරක්ෂණ කොමිස්**

ප්‍රතිරක්ෂකයාට ගෙවූ හෝ ගෙවිය යුතු වාරිකවලට අදාළව ලැබුණු හෝ ලැබිය යුතු කොමිස් මුදල්

**භාරගනු ලබන ප්‍රතිරක්ෂණ**

ප්‍රතිරක්ෂණ ගිවිසුමක් යටතේ අවදානම් භාර ගැනීම

**භාර දෙනු ලබන ප්‍රතිරක්ෂණ**

ප්‍රතිරක්ෂණ ගිවිසුමක් යටතේ අවදානම් ස්ථානගත කිරීම

**ප්‍රතිරක්ෂණ ලාභ කොමිස්**

ප්‍රතිරක්ෂිත ගිවිසුමක් යටතේ ප්‍රතිරක්ෂිතයා විසින් උපයන ලද ලාභය (ප්‍රතිරක්ෂණ ගිවිසුමෙහි නිර්වචනය කරනු ලැබ ඇති පරිදි) පාදක කරගෙන ප්‍රතිරක්ෂකයකුගෙන් ප්‍රාථමික රක්ෂිතයා ලද හෝ ලැබිය යුතු කොමිස් මුදල්.

**රඳවා ගැනීම**

භාරගනු ලැබ අවදානමින් රක්ෂණකරු / ප්‍රතිරක්ෂණකරු විසින් ප්‍රතිරක්ෂණය කරනු නොලබන / පවරනු නොලබන කොටස හෙවත් ස්වකීය ගිණුම වෙනුවෙන් රඳවාගත් ආදායම.

**නුබුන්වත් ආන්තිකය - ජීවිත**

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත පනතෙහි වගන්ති අංක 26 ප්‍රකාරව පනවා ඇති 2002 නුබුන්වත් ආන්තිකය (දිගුකාලීන රක්ෂණය) පිළිබඳ රීතියෙන් නිර්වචනය කරනු ලැබ ඇති පරිදි දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර කටයුතුවල යෙදෙන රක්ෂකයකු විසින් පවත්වාගෙන යනු ලැබීමට අවශ්‍ය වත්කම්වල අගය සහ බැරකම්වල අගය යන සංඛ්‍යා දෙකෙහි වෙනස.

**නුබුන්වත් ආන්තිකය - ජීවිත නොවන (සාමාන්‍ය රක්ෂණය)**

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත පනතෙහි වගන්ති අංක 26 ප්‍රකාරව පනවා ඇති 2004 නුබුන්වත් ආන්තිකය (සාමාන්‍ය රක්ෂණය) පිළිබඳව රීතියෙන් නිර්වචනය කර ඇති පරිදි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල යෙදෙන රක්ෂකයකු විසින් පවත්වාගෙන යාමට අවශ්‍ය කෙරෙන වත්කම්වල අගය සහ බැරකම්වල අගය සහ සංඛ්‍යාවන් දෙකෙහි වෙනස.

**පවාරණ අගය**

ජීවිත රක්ෂණයක් සම්බන්ධව එම රක්ෂණ ඔප්පුව කල්පිරීමට පෙර ඔප්පු හිමියකු ජීවිත රක්ෂණය අත්හිටුවීමේ දී රක්ෂකයා විසින් ඔප්පු හිමියාට ගෙවනු ලැබිය යුතු මුදල පවාරණ අගයක් ඇතිවීම සඳහා අවම වශයෙන් වසර 3ක් වත් අඛණ්ඩව එම ජීවිත රක්ෂණ ඔප්පුව ක්‍රියාත්මක පැවසිය යුතුය.

**ප්‍රාරක්ෂණ ලාභය**

ආයෝජන ආදායම සහ අනෙකුත් ආදායම් සැලකිල්ලට නොගෙන සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ගනුදෙනු මඟින් උත්පාදනය කර ගනු ලබන තාක්ෂණික ලාභය.

**නොඉපැයූ වාරිකය**

ගෙවීමට නියමිත ඇතැයි ගිණුම්වලට මේ වන විටත් ඇතුළත් කරනු ලැබ ඇති නමුත් ශේෂ පත්‍රයේ දිනයෙන් අනතුරුව එළැඹෙන යම් අවදානම් කාල සීමාවකට අදාළ වාරික මුදල්වල කොටසක් මෙයින් නියෝජනය වෙයි.

**නොඉපැයූ වාරික සංචිතය**

දැනටමත් ක්‍රියාත්මකව පවතින රක්ෂණ ඔප්පු යටතේ අනාගතයේ දී උද්ගත විය හැකි හිමිකම් පෑම් සඳහා ප්‍රතිපාදනය කිරීම අරභයා සාමාන්‍ය රක්ෂණකරු විසින් පවත්වාගෙන යනු ලබන අරමුදලකි.

**කල් ඉකුත් නොවූ ආදායම් සංචිතය**

ශේෂ පත්‍ර දිනට පෙර ගිවිසුම් හමාර කළ නමුත් ශේෂ පත්‍ර දිනයෙන් පසුව ඇති විය හැකි හිමිකම් පෑම්, වන්දි සහ වියදම් සඳහා ඇස්තමේන්තු කළ අගයෙන් මේ දක්වා නොඉපැයූ වාරික වශයෙන් (කිසියම් විලම්භිත අත්පත් කර ගැනීමේ පිරිවැයක් ඇත්නම් එය අඩු කළ පසු) ප්‍රතිපාදනය කරන ලද අගය ඉක්මන ප්‍රමාණය

# සටහන්

# පොදු තොරතුරු

## කාර්යාල ලිපිනය

11 වන මහළ, නැගෙනහිර කුළුණ
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
කොළඹ 01
ශ්‍රී ලංකාව
දුරකථන : +94 11 2396184-9
ෆැක්ස් : +94 11 2396190
විද්‍යුත් ලිපිනය : info@ibsl.gov.lk
වෙබ් අඩවිය : www.ibsl.gov.lk

## නෛතික ස්වභාවය

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කරනු ලැබ ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය 2001 පෙබරවාරි 23 දින රජයේ ගැසට් නිවේදන අංක 1172/27 මගින් බලය දී ඇති පරිදි 2001 මාර්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙහෙයුම් කටයුතු අරඹන ලදී.

## අධ්‍යක්ෂක මණ්ඩලයේ අරමුණ සහ වගකීම්

ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර පවත්වාගෙන යාම අවංකව, වෘත්තීයමය වශයෙන් හා විචක්ෂණශීලීභාවයෙන් ඒවා පවත්වාගෙන යාම තුළින් ඔප්පු හිමියන්ගේ සහ අනාගත ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තහවුරු කිරීම.

## ගිණුම් වර්ෂය

ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා

## විගණකවරු

විගණකාධිපති

## බැංකුකරුවන්

ලංකා බැංකුව

## විගණන කමිටුව

එස්. ආර්. ආටිගල මහතා - සභාපති
ගාමිණී කොහාන මහතා
මොහොමඩ් නවාස් රාජාබ්දීන් මහතා



# විශිෂ්ඨත්වයේ

## මාවත ඔස්සේ

INSURANCE BOARD OF SRI LANKA

වාර්ෂික වාර්තාව 2012


**කාර්යාල ලිපිනය**
11 වන මහළ, නැගෙනහිර කුළුණ
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
කොළඹ 01
ශ්‍රී ලංකාව

දුරකථන : +94 11 2396184-9
ෆැක්ස් : +94 11 2396190
විද්‍යුත් ලිපිනය : info@ibsl.gov.lk
වෙබ් අඩවිය : www.ibsl.gov.lk



Designed & Printed by Ceylon Printers PLC